# සටහන

2024 අප්‍රේල් - ජූනි 43 වෙළුම 4 - 6 කලාපය




2 ඊජිප්තුවේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලබා ගැනීමේදී මුහුණ දෙන ගැටලු අවම කර ගනිමු

11 රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනයේදී ප්‍රාථමික අලෙවිකරණ ආයතන වල භූමිකාව


22 ශ්‍රී ලාංකේය වෙළෙඳ වාණිජ ඉතිහාසය අධ්‍යයනයෙහිලා පවතින පුරාවිද්‍යා මූලාශ්‍ර හා ඒවායෙන් හෙළි වන විශේෂ කරුණු පිළිබඳ මූලික හැඳින්වීමක්.

35 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත ට අනුව මහ බැංකුවේ නූතන අරමුණු හා කාර්යභාරය


රු. 80/-

1 391358 904065

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව




# ඊජිප්තුවේ

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



ඊජිප්තුව යනු අප්‍රිකාවේ සහ ආසියාවේ පිහිටි මහාද්වීපික රටකි. එය උතුරින් මධ්‍යධරණී මුහුද, නැගෙනහිරින් රතු මුහුද, දකුණින් සුඩානය, සහ බටහිරින් ලිබියාව මායිම් වේ. කයිරෝ අගනුවර සහ විශාලතම නගරය වන අතර, ඇලෙක්සැන්ඩ්‍රියාව දෙවන විශාලතම නගරයයි. ඊජිප්තුවේ ජනගහනය මිලියන 100ක් පමණ වන අතර, ලෝකයේ 14 වැනි වැඩිම ජනගහන රටයි.

ඊජිප්තුවට දිගු ඉතිහාසයක් ඇති අතර, පුරාණ නයිල් ඩෙල්ටාව ක්‍රි.පූ. ශිෂ්ටාචාරයේ තොටිල්ලක් ලෙස සැලකෙන අතර ලේඛන, කෘෂිකර්මාන්තය, නාගරීකරණය, ආගම සහ මධ්‍යම ආන්ඩුව වර්ධනය වී ඇත. නූතන ඊජිප්තුව 1922 දක්වා දිව යයි, එය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලබා ගත්තේය. 1952 විප්ලවයෙන් පසු ජනරජයක් ලෙස ප්‍රකාශයට පත් කර, 1958 දී සිරියාව සමඟ එක්සත් අරාබි ජනරජය පිහිටුවා 1961 දී විසුරුවා හරින ලදී.

ඊශ්‍රායලය සමඟ සන්නද්ධ ගැටුම් කිහිපයකට සහ 2011 අරාබි වසන්තය සමඟ දේශපාලන නොසන්සුන්තාවයට මුහුණ දුන්නා. 2014 සිට අබ්දෙල් ෆාටා එල්-සිසිගේ නායකත්වයෙන් ආණ්ඩු කරන අතර, මෙම ආන්ඩුව සෝදිසියෙන් සිටින්නන් විසින් ඒකාධිපති යන තැනට විස්තර කර ඇත. ඉස්ලාමය නිල ආගම සහ අරාබි නිල භාෂාව වේ.

නයිල් ගං ඉවුර ආසන්නයේ ජනගහනය බොහෝ දෙනා ජීවත් වන අතර, සහරා කාන්තාරයේ ජනාවාස විරලයි. ජනගහනයේ 43% ක් නාගරික ප්‍රදේශවල ජීවත් වේ. ඊජිප්තුව උතුරු අප්‍රිකාව, මැදපෙරදිග සහ මුස්ලිම් ලෝකයේ කලාපීය බලවතෙකි. එහි ආර්ථිකය විවිධාංගීකරණය වූ, අප්‍රිකාවේ තුන්වන විශාලතම ආර්ථිකය සහ ලෝකයේ 20 වන විශාලතම ආර්ථිකය වේ.

මූලාශ්‍ර -
World Factbook, Encyclopedia Brittanica

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය වර්ග කි.මී.<br>ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී.<br>අභ්‍යන්තර ජලාශ වර්ග කි.මී. | <br>1,001,450<br>995,450<br>6,000 |
| ජනගහනය (2023 ඇස්තමේන්තු) | 111,247,248 |
| ජනගහන වර්ධන වේගය (2023 ඇස්තමේන්තු) | 1.49.% |
| උපත් අනුපාතය (2023 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 19.5 |
| මරණ අනුපාතය (2023 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 4.3 |
| ළදරු මරණ අනුපාතය (2023 ඇස්තමේන්තු)<br>(සජීවී උපත් දහසකට) | 16.8 |
| උපතේ දී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2023 ඇස්තමේන්තු) | 75 |
| දළ දේශීය නිෂ්පාදිතය (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 476.7 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය<br>(2021 ඇස්තමේන්තු) | 6.59% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 4,295.41 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු)<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>11.7%<br>34.3%<br>54% |
| ශ්‍රම බලකාය (2021 ඇස්තමේන්තු) | මිලියන 32.614 |
| සේවා වියුක්තිය (2021 ඇස්තමේන්තු) | 6.4% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2019 ඇස්තමේන්තු) | 31.9 |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) (2017 ඇස්තමේන්තු)<br>දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | -8.6% |
| උද්ධමන අනුපාතය (2021 ඇස්තමේන්තු) | 13.9% |
| ආනයන (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන<br>97.144 |
| ආනයන භාණ්ඩ | ධාන්‍ය, ස්වභාවික වායු, බොරතෙල්, ප්ලාස්ටික්, පිරිපහදු කළ ඛනිජ තෙල් |
| අපනයන (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන<br>76.295 |
| අපනයන භාණ්ඩ | ස්වාභාවික වායු, පොහොර, ඇඟලුම්, පිරිපහදු කළ ඛනිජ තෙල්, බොරතෙල් |
| මුදල් ඒකකය | ඊජිප්තු පවුම් |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.



# සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලබා ගැනීමේදී මුහුණ දෙන ගැටලු අවම කර ගනිමු


**කේ. එම්. ගෙතුලානි බණ්ඩාර රාජනායක**
**ජ්‍යේෂ්ඨ සහකාර අධිකාරී / සේ.අ.අ.**

**කේ. ජී. ඉරේෂා මධුශානි ජයවර්ධන**
**ජ්‍යේෂ්ඨ කළමණාකරන සහකාර / සේ.අ.අ.**


## හැඳින්වීම

සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුම් පවත්වාගෙන යාම පිළිබඳව අරමුදලෙහි සාමාජිකයන් අතර ප්‍රමාණවත් දැනුවත් බවක් නොමැති බව පෙනී යන කරුණක් වේ. රැකියාවක නිරතවන / නිරත වීමට අපේක්ෂාවෙන් පසුවන ඔබ හෝ ඔබගේ නෑදෑ හිත මිතුරන් සේවක අර්ථ සාධක අරමුදල් ගිණුමට දායකත්වයන් ලබා දීමේදී, එම අරමුදලින් ප්‍රතිලාභ ලබා ගැනීමට යාමේදී මුහුණ දෙන ගැටලු අවම කර ගැනීම සඳහා සේවක අර්ථ සාධක අරමුදල් සාමාජික ගිණුම් පිළිබඳව නිවැරදි අවබෝධයකින් සිටීම අත්‍යාවශ්‍ය වේ. එනම්, ආයතන විසින් සේවක අර්ථසාධක අරමුදල වෙත දායක මුදල් යොමු කිරීමේදී ආයතන සහ සාමාජිකයන් අතින් සිදු විය හැකි දෝෂ අවම වන ලෙස ආරම්භයේදීම නිවැරදිව තොරතුරු සේ.අ.අ වෙත යොමු කිරීමටත් සහ පසුව යම් අවස්ථාවකදී කිසියම් දෝෂයක් හඳුනා ගනු ලැබුවහොත් එය එම අවස්ථාවේදීම නිවැරදි කර ගැනීමට අවශ්‍ය දැනුම ලබා දීමත් යන අරමුණු පෙරදැරිව ගොනු කරන ලද මෙම ලිපිය මඟින් ඔබගේ සේ.අ.අ. සාමාජික ප්‍රතිලාභ ගැටලුවකින් තොරව ලබා ගැනීමට ඔබට මග කියනු ඇත.

## සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.), එහි ඉතිහාසය හා වර්තමානයෙන් බිඳක්

- විශ්‍රාම වැටුප් හිමිකම් නොලබන පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතුවූවන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීමේ අරමුණින් සේව්‍ය සේවක යන දෙපාර්ශවයේම අනිවාර්‍ය දායකත්වයෙන් 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් පිහිටුවන ලද සේ.අ.අ. ශ්‍රී ලංකාවේ ඇති විශාලතම සමාජ ආරක්ෂණ ක්‍රමය වේ.

- ආරම්භයේදී සේව්‍යායතන 54ක් මූලික කරගනිමින් සේව්‍ය සේවක දෙපාර්ශවය විසින් පිළිවෙලින් 6% සහ 4% ලෙස මාසික සේවක ආදායමෙන් දායක මුදල් ගෙවීම සිදු කර ඇති අතර වර්තමානය වන විට එයසේව්‍ය සේවක දෙපාර්ශවයේ දායකත්වය පිළිවෙලින් 12% හා 8% ක් ලෙස වර්ධනය වී තිබේ. මේ හා සමගාමීව අරමුදලෙහි වත්කම් 2023.12.31 දින වන විට රුපියල් බිලියන 3,857.4ක් බවට පත් වී තිබේ.

- ඒ අනුව, සේ.අ.අ. විසින් එහි අරමුදල් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගර බැඳුම්කර, කොටස් සුරකුම්පත් හා ආයතනික ණය සුරකුම්පත් සහ මුදල් වෙළඳපළ උපකරණවල ආයෝජනය කිරීම සිදු කරනු ලබන අතර ඉන් ලැබෙන ප්‍රතිලාභ මත පදනම්ව සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයන් සඳහා වාර්ෂික පොළී අනුපාතයක් ප්‍රකාශයට පත් කර සේවකයින්ගේ ගිණුම් වලට අදාළ පොළී මුදල් බැර කිරීම සිදු කරනු ලබයි.

## අරමුදලෙහි පරිපාලනය

- දැනට ශ්‍රී ලංකාවේ විශාලතම හා පුළුල් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය වන මෙම සේවක

අර්ථසාධක අරමුදලෙහි පරිපාලනය ආයතන දෙකක් විසින් සිදු කරනු ලබයි. එනම්, සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි සඳහන් පරිදි පනත ක්‍රියාත්මක කරන ආයතනය ලෙස කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියා කරන අතර අරමුදලෙහි භාරකරු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාකරයි.

- ඒ අනුව, සේවායෝජකයන් ලියාපදිංචිය, පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදු වන්නේදැයි විමර්ශනය කිරීම, දායක මුදල් ගෙවීම් පැහැර හැරීම් සම්බන්ධව නීතිමය පියවර ගැනීම, ප්‍රමාද ගෙවීම් මත සේවායෝජකයන්ගෙන් අධිභාර අයකිරීම, ප්‍රතිලාභ සහ පූර්ව ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳ තීරණ ගැනීම (සාමාජික ශේෂයෙන් 30% ක් නිදහස් කිරීම, නිවාස ණය සඳහා වන ණය අයදුම්පත් අනුමත කිරීම ආදී) යනාදී කාර්‍යයන් රැසක් කම්කරු දෙපාර්තමේතුව විසින් සිදු කරනු ලබයි.

- ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සිදු කරනු ලබන නියෝජිත කාර්‍යයන් අතරින් එක් කාර්‍යයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි මූල්‍ය භාරකරු වශයෙන් කටයුතු කරනු ලබයි. සේ.අ.අ. දෙපාර්තමේන්තුව මෙම කාර්‍යය ඉටු කිරීම වෙනුවෙන්ම පිහිටුවන ලද අතර සාමාජිකයන්ගේ හා සේව්‍යයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, දායක මුදල් හා දඩමුදල් රැස් කිරීම, අරමුදලෙහි වත්කම් සුරක්ෂිත කිරීම හා ඒවා වඩාත් ඵලදායී අංශවල ආයෝජනය කිරීම, ආයෝජනයෙන් ලැබෙන ආදායම අරමුදලට බැර කිරීම, කම්කරු කොමසාරිස්වරයා විසින් සහතික කරනු ලබන සාමාජිකයන්ට ප්‍රතිලාභ හා පූර්ව ප්‍රතිලාභ ගෙවීම, වාර්ෂිකව ගිණුම් පිළියෙල කිරීම, ගිණුම් වර්ෂය අවසාන වී මාස තුනක් ඉක්මයාමට ප්‍රථම එම වාර්තා විෂයභාර අමාත්‍යවරයා වෙත භාර දීම, අරමුදලේ ගිණුම් විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සහ සාමාජිකයන් වෙත අර්ධ වාර්ෂිකව ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම සහ අරමුදලෙහි සේවා සඳහා ඉදිරිපත්වන සියළු සාමාජික, ආයතනික ඉල්ලීම් සඳහා සේවා සැපයීම යනාදී කාර්‍යයන් සේ.අ.අ. දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබයි.

## සේ.අ.අ. හි ලියාපදිංචි වීම

- සේ.අ.අ. හි සාමාජිකත්වය ලැබීමට සුදුස්සන්
  - සේ.අ.අ. හි සාමාජිකයෙකු වීමට රැකියාවේ ස්වභාවය අදාළ නොවේ. සියලුම සේවකයින් ස්ථිර, තාවකාලික, ආධුනික, අනියම් හෝ වැඩ මුර සේවකයින්
  - කාල ඒකක කොටස් ගාස්තු, කොන්ත්‍රාත්, කොමිස්, ඉටු කරන ලද පදනම මත හෝ වෙනත් ආකාරයකින් සේවය කරන සේවකයින්
  - රාජ්‍ය අංශයේ සහ තාවකාලික පදනමින් පළාත් පාලන ආයතනවල සේවය කරන සේවකයින්
  - පවුලේසාමාජිකයන් විසින් නඩත්තු කරනු ලබන ආයතන සඳහා දායක මුදල් ගෙවීම අවශ්‍ය නොවුවද, එම ව්‍යාපාරයටම බඳවා ගන්නා බාහිර සේවකයින්
  - අධ්‍යක්ෂවරුන් සහ හවුල්කරුවන්ට ඔවුන්ගේ සේවාවන් සඳහා වැටුපක් / දීමනාවක් ලැබෙන්නේ නම්, ඔවුන්
  - යම් ආයතනයක සේවය කරන විශ්‍රාමික අයවලුන්
  - පාසල් වේලාවෙන් පසු සේවයේ යොදවා ඇති, වයස අවුරුදු 14 ට වැඩි පාසල් ළමුන්
  - දැනටමත් එක් ආයතනයක සේවයේ යෙදී සිටියදී වෙනත් ආයතනයක සේවය කරන සේවකයින්
  - සීමිත කෙටි කාලයක් රැකියාවෙහි නියුතු සේවකයින්
  - ප්‍රතිලාභ ලබා ගැනීමෙන් පසු නැවත එම හෝ වෙනත් ආයතනයක සේවයේ යෙදී සිටින සේවකයින්
  - විදේශයන්හි සිට, දේශීය වශයෙන් රැකියාවල නියුතු සේවකයින්
- සේ.අ.අ. හි ලියාපදිංචි වීම

  ආයතනයක් පිහිටුවා දායක මුදල් ගෙවීමට ප්‍රථම එම ආයතනය කම්කරු කාර්යාලයෙහි ලියාපදිංචි කර ලියාපදිංචි අංකයක් ලබා ගැනීමට කටයුතු කළ

යුතු අතර සේවක අර්ථ සාධක අරමුදල් සම්බන්ධ සියලුම කටයුතු වලදී එම ලියාපදිංචි අංකය භාවිතා කිරීමට ආයතනය විසින් කටයුතු කළ යුතු වේ.

එමෙන්ම,ආයතනයක් විසින් සේවකයන් බඳවා ගැනීමෙන් පසු දින 14 ක් ඇතුළත එම පුද්ගලයන් සේ.අ.අ. සාමාජිකයෙකු ලෙස ලියාපදිංචිය සිදු කළ යුතු අතර ඒ සඳහා 'A', 'B' සහ 'H' පෝරම පුරවා කම්කරු කාර්යාලය වෙත ලබා දීම සිදු කළ යුතුවේ.

### සේවක අර්ථසාධක අරමුදල් සාමාජික තොරතුරු පවත්වාගෙන යාම

සේ.අ.අ. වෙත ආයතන මගින් මාසිකව ලැබෙන දායක මුදල් ගිණුම් ගත කිරීම හා ඊට අදාළව වාර්ෂික පොළී මුදල් සාමාජික ගිණුම් වෙත බැර කර අර්ධ වාර්ෂිකව සාමාජිකයා වෙත ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. මෙහිදී ආයතන විසින් කිසියම් සාමාජික අංකයක් යටතේ ප්‍රථමයෙන්ම අර්ථසාධක අරමුදල් දායක මුදල් ගෙවා සේ.අ.අ. වෙත ඉදිරිපත් කරනු ලබන 'සී. වාර්තාවට අනුව සාමාජික නම් හා හැඳුනුම්පත් අංක ඇතුලත් කිරීම සිදු කරනු ලබයි.

### සේ.අ.අ. මගින් ඔබට ලැබෙන ප්‍රතිලාභ

සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි සාමාජිකයකු වීම මගින් ඔබට පහත සඳහන් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

- විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ (30%)
- සේ.අ.අ ඇපයට තබා නිවාස ණය ලබා ගැනීම
- වීසා සඳහා ශේෂ සහතික ලබා ගැනීම
- විශ්‍රාම ලැබීමෙන් පසු හෝ අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සපුරා ගැනීමෙන් පසුව සම්පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම

ඉහත සඳහන් ප්‍රතිලාභ ලබා ගැනීමට යාමේදී සාමාජික අංක යටතේ නම්/හැඳුනුම්පත් අංක / දායක මුදල් බැර වීම් හි කිසියම් දෝෂයක් / විෂමතාවයක් පවතී නම් ඔබට අදාළ ප්‍රතිලාභයන් සේවක අර්ථසාධක අරමුදල විතින් අදාළ අවස්ථාවේදීම ලබා ගැනීමට නොහැකි වන අතර ඒ සඳහා අමතර කාලයක් / ශ්‍රමයක් වැය කිරීමට සිදු වේ. නමුත් පෙර දැනුවත් භාවය තුලින් ඔබට මෙම ගැටලු වලින් තොරව කඩිනම් සේවාවක් සේ.අ.අ. වෙතින් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල් සාමාජික තොරතුරු දෝෂ සහගත / විෂමතා සහිත බවට හඳුනා ගැනීම

පහත සඳහන් ලේඛන පරීක්ෂාව මගින් සේවායතන / සාමාජිකයා වෙත සාමාජික ගිණුම්හි නම්, ජාතික හැඳුනුම්පත් අංක, දායක මුදල් ගෙවීම්හි පවතින විෂමතාවයන් හඳුනා ගැනීමට හැකියාව ලැබේ.

- සේ.අ.අ. විසින් මුද්‍රණය කර සාමාජිකයා වෙත නිකුත් කරනු ලබන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශනයන්හි සඳහන් සාමාජික නම, ජාතික හැඳුනුම්පත් අංක හා දායක මුදල් වටිනාකම් පරීක්ෂාව මගින්,
- සේවායතන විසින් මාසික දායක මුදල් ගෙවීම සිදු කළ පසු දායක මුදල් ගෙවීමට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතන වෙත නිකුත් කරනු ලබන ලදු පතෙහි සඳහන් විස්තර පරීක්ෂාව මගින්,
- 'සී' වාර්තා මගින් දායක මුදල් ගෙවීම සිදු කිරීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සේවායතන වෙත නිකුත් කරනු ලබන මාසික 'සී' වාර්තාවන්හි සඳහන් සාමාජික අංක, සාමාජික නම් හා ජාතික හැඳුනුම්පත් අංක පරීක්ෂාව මගින්,
- විද්‍යුත් මාධ්‍යයෙන් දායක මුදල් යොමු කිරීමේදී, එහි සාමාජික විස්තර විෂමතාවයක් හේතුවෙන් අදාළ දායක මුදල් ගිණුම්ගත නොවී පවතීනම් ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතන වෙත යොමු කරනු ලබන විද්‍යුත් තැපැල් පණිවිඩ පරීක්ෂාව මගින්,

### සාමාජික නමෙහි/ ජාතික හැඳුනුම්පත් අංකයෙහි / දායක මුදල්හි දෝෂ සහිත බව ඔබට බලපාන්නේ කෙසේද?

සාමාජික අංක යටතේ පවතින දෝෂ හඳුනාගෙන එම දෝෂ නිවැරදි කර ගැනීමට කටයුතු නොකිරීම තුලින් සේ.අ.අ. මගින් ලබා දෙනු ලබන පෙර සඳහන් කරන ලද සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නම හා ජාතික හැඳුනුම්පත් අංකය කම්කරු දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය සහ මහ බැංකු දත්ත පද්ධතියෙහි සඳහන් තොරතුරු සමග සංසන්දනයේදී

සාමාජික නමෙහි / ජාතික හැඳුනුම්පත් අංකයෙහි සහ සාමාජික ගිණුමෙහි දායක මුදල් බැර වීම්හි යම් විෂමතාවයක් හඳුනා ගතහොත් එම විෂමතාවය නිවැරදි කර ගන්නා තෙක් ඉහත සේවාවන් ලබා ගැනීමට ඔබට නොහැකි වනු ඇත.

## සාමාජික නමෙහි/ ජාතික හැඳුනුම්පත් අංකයෙහි / දායක මුදල්හි දෝෂ / විෂමතා නිවැරදි කිරීම

සේවක අර්ථසාධක අරමුදල් සාමාජික අංක යටතේ පවතින දෝෂ නිවැරදි කිරීමේ අරමුණින් සේ..අ.අ දෙපාර්තමේන්තුවෙහි වාර්තා සංශෝධන අංශයක් පිහිටුවා ඇත. ඒ අනුව, එම අංශය විසින් ආයතන මඟින් සිදු කරනු ලබන ඉල්ලීම් මත පදනම්ව සාමාජික අංකය යටතේ වන නම්, ජාතික හැඳුනුම්පත් අංක, මුදල් නිවැරදි කිරීම් සිදු කිරීමත්, සී වාර්තාවන්හි සාමාජික නම/ජාතික හැඳුනුම්පත් අංකය සටහන් වී ඇති නමුත් එම විස්තර පරිගණක ගත වී නොමැති අවස්ථාවන්හිදී එම විස්තර පරිගණක ගත කිරීමත් සිදු කරනු ලබයි.ඒ අනුව,මෙම දෝෂ නිවැරදි කිරීම් ප්‍රධාන වශයෙන් කාණ්ඩ 03 ක් යටතේ හඳුනා ගත හැක.

- සේ.අ.අරමුදලේ සාමාජික අංක යටතේ සඳහන් සාමාජික නම් නිවැරදි කිරීම.
- සේ.අ.අරමුදලේ සාමාජික අංක යටතේ සඳහන් ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි කිරීම.
- සාමාජික ගිණුම්හි දායක මුදල් නිවැරදි කිරීම.

## දෝෂ / විෂමතා නිවැරදි කර ගන්නා ආකාරය

සාමාජිකයාට අයත් ජාතික හැඳුනුම්පතෙහි විස්තර අනුව සාමාජිකයාගෙ 'බී' පත්‍රයෙහි/ කම්කරු කාර්යාල දත්ත පද්ධතියෙහි සඳහන් නමෙහි / ජාතික හැඳුනුම්පත් අංකයෙහි යම් විෂමතාවයක් පවතී නම්, ප්‍රථමයෙන් 'බී' පත්‍රයෙහි/ කම්කරු කාර්යාල දත්ත පද්ධතියෙහි පවතින විෂමතා කම්කරු කාර්යාලය මඟින්ද, දෙවනුව මහ බැංකු දත්ත පද්ධතියෙහි පවතින විෂමතා මහ බැංකුව මඟින්ද නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වේ.

ඒ අනුව, පහත සඳහන් ලිපි ලේඛන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන කාර්යාලය හෝ නුවරඑළිය, මාතර, මාතලේ, අනුරධපුරය, ත්‍රීකුණාමලය සහ කිළිනොච්චියෙහි පිහිටා ඇති ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රාදේශීය කාර්යාල වෙත පැමිණ හෝ තැපැල් මඟින් යොමු කිරීම මඟින් ශ්‍රී ලංකා මහ බැංකු දත්ත පද්ධතියෙහි සාමාජික නම / ජාතික හැඳුනුම්පත් අංකය / ගිණුම්හි පවතින දෝෂ / විෂමතා නිවැරදි කර ගැනීම සිදු කර ගත හැකි වේ.

**දෝෂ / විෂමතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය වන ලිපිලේඛන**

* සාමාජිකයා සේවය කළ ආයතනය මේ වනවිටත් ක්‍රියාත්මකව පවතීනම්,

- සාමාජික අංක යටතේ නම් / ජාතික හැඳුනුම්පත් අංක විෂමතා නිවැරදි කිරීම සඳහා පහතින් සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.
  - සාමාජික අංකය අයත් සේවායතනයෙන් ලබා ගත් ආයතන ලිපියක් (මෙම ලිපියෙහි සාමාජික අංකය නිවැරදිව සඳහන් කර වැරදි හා නිවැරදි නම, ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර එම නම,ජාතික හැඳුනුම්පත් අංකය මඟින් හැඳින්වෙන්නේ එකම සාමාජිකයකු බවටත්, සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පත අනුව අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන ලෙසටත් වන ඉල්ලීම සඳහන් විය යුතු වේ.)
  - ආයතන ඉල්ලීම් ලිපියෙහි සඳහන් සාමාජික අංකයට අයත් 'බී' පත්‍රයෙහි සහ සාමාජිකයාට අයත් ජාතික හැඳුනුම්පතෙහි පැහැදිලි සහතික කරන ලද ඡායා පිටපත්
- සාමාජික අංක යටතේ දායක මුදල් නිවැරදි කිරීමක් පවතීනම් ඉහත සඳහන් ලිපිලේඛනයන්ට අමතරව, දායක මුදල් නිවැරදි කිරීමකළ යුතු සාමාජික අංකයන් සඳහා එම සාමාජික අංක යටතේ සාමාජිකයාගේ සේවය ආරම්භයේ සිට අවසානය දක්වා බැර කරන ලද සම්පූර්ණ දායක මුදල් විස්තරයද ඉදිරිපත් කළ යුතු වේ.
- අතිරේක ලිපිලේඛන

  ඉහත ලිපි ලේඛනයන්ට අමතරව සංශෝධනයේ ස්වභාවය අනුව වෙනත් ලිපි ලේඛනද ඉදිරිපත් කිරීමට සිදු විය හැක.

උදාහරණ ලෙස ;

  - විවාහය හේතුවෙන් නම වෙනස් වූයේනම් විවාහ සහතිකයෙහි සහතික කරන ලද ඡායා

පිටපත

- නව ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීම හේතුවෙන් හැඳුනුම්පත් අංකය වෙනස් වූයේනම් එම වෙනස තහවුරු කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය

- උප්පැන්න සහතිකයෙහි නම වෙනස් කර ගැනීම හේතුවෙන් සාමාජික නම වෙනස් වූයේනම් හෝ එම සහතිකය ඉදිරිපත් කිරීම මඟින් නමේ වෙනස තහවුරු කළ හැකි නම් උප්පැන්න සහතිකයෙහි සහතික කරන ලද ඡායා පිටපත

* ඔබ සේවය කළ ආයතනය මේ වනවිටත් වසා ඇත්නම්/ අක්‍රිය තත්වයේ පවතීනම් සාමාජික නම්, ජාතික හැඳුනුම්පත් අංකය, දායක මුදල් සංශෝධනය සිදු නොකරනු ලබන අතර ඒ සඳහා කම්කරු දෙපාර්තමේන්තුව මගින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

## දෝෂ / විෂමතා නිවැරදි කිරීම හා ඒ පිළිබඳව සාමාජිකයා / සේවායතනවෙත දැනුම් දීම

ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන පරීක්ෂාවෙන් අනතුරුව සාමාජික විස්තර යාවත්කාලීන කරන අතර ඒ බව ඔබ විසින් ලබා දෙන ලද ජංගම දුරකථන අංකය වෙත කෙටි පණිවිඩයක් මඟින් හෝ ලබා දෙන ලද ලිපිනයට තැපැල් මඟින් දැනුම් දීම සිදු කරනු ලැබේ.

(දෛනිකව සංශෝධන කටයුතු සිදු කර ගැනිම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැමිණෙන සාමාජිකයන් සංශෝධන කටයුතු සිදු කරන තෙක් එම ස්ථානයේම රැඳී සිටීම අවම කරමින් ඔවුන් වෙත වඩාත් කාර්‍යක්ෂම සේවයක් ලබා දීම සඳහාත් පැමිණෙන සාමාජිකයන්ගේ වටිනා කාලය වෙනත් ඵලදායී කාර්‍යයක යෙදීමට අවස්ථාව ලබා දීම උදෙසාත් ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා සංශෝධන අංශය මඟින් 'ඒ' මඟින් සංශෝධන පිළිබඳව දැනුම් දීමේ ක්‍රමය හඳුන්වාදී ඇත. සංශෝධනය සඳහා බාරදුන් ලිපි ලේඛනයන්හි සඳහන් නම් හා ජාතික හැඳුනුම්පත් අංක සංශෝධන පිළිබඳව වැඩකරන දින තුනක් ඇතුලත සාමාජිකයා විසින් ලබා දුන් ජංගම දුරකථන අංකය වෙත 'ඒ' මඟින් දැනුම් දීම සිදු කරනු ලැබේ.)

## සාමාජික අංක යටතේ දෝෂ / විෂමතා ඇති වීම වළක්වාගැනීම

සාමාජික අංක යටතේ වැරදි සිදු විය හැකි අවස්ථා මග හරවා ගැනීමට කටයුතු කිරීම මෙන්ම වරදක් සිදු වී ඇති බවට හඳුනාගත් මුල් අවස්ථාවේදීම එය නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම මගින් සාමාජිකයාටත්, ආයතනයටත් අනාගතයේදී මුහුණ දීමට සිදු වන අපහසුතා මග හරවා ගැනීමට හැකියාව ලැබේ. මේ සඳහා ආයතනයත් සාමාජිකයාත් වඩාත් වගකීම් සහගතව කටයුතු කළ යුතු අතර, සාමාජික අංක යටතේ විෂමතා අවම කර ගැනීම සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවයටම පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ හැක.

## සේවකයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

- සේව්‍යායතනය වෙත පුද්ගලික තොරතුරු ලබා දීමේදී තමන්ට අයත් ජාතික හැඳුනුම්පත අනුව නම හා හැඳුනුම්පත් අංකය ලබා දීමට කටයුතු කිරීම.ඉන් පරිබාහිරව නමක කොටසක්, නිවසේදී භාවිතා කරන නම හෝ වෙනත් නම් ආයතනය වෙත ලබා දීමෙන් වැළකීම.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්ධ වාර්ෂිකව ඔබ වෙත නිකුත් කරනු ලබන ගිණුම් ප්‍රකාශනයන්හි සඳහන් නම / ජාතික හැඳුනුම්පත් අංකය ඔබට අයත් ජාතික හැඳුනුම්පත අනුව නිවැරදිද යන්න හා බැර වී ඇති දායක මුදල් නිවැරදිද යන්න පරීක්ෂා කර බලා කිසියම් විෂමතාවයක් පවතීනම් ආයතනය මාර්ගයෙන් එම විෂමතා කඩිනමින් නිවැරදි කරවා ගැනීමට කටයුතු කිරීම හා එකී වාර්ෂික වාර්තා ආරක්ෂාකාරී ලෙස තමා සන්තකයේ තබා ගැනීමට කටයුතු කිරීම.

## සේව්‍යායතනය විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

- සේවකයකු සේවයට බඳවා ගෙන දින 14ක් ඉක්ම යාමට මත්තෙන් එම සේවකයා සඳහා 'A','B' සහ 'H' පත්‍ර පුරවා සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි කිරීමට වග බලා ගැනීම, 'බී' පත්‍රය ලැබීමෙන් පසු එය පරීක්ෂා කර බලා නිවැරදි කිරීමක් තිබේ නම් හැකි ඉක්මනින් එය සංශෝධන කර ගැනීමට කටයුතු කිරීම, ලබා දෙන 'බී' පත්‍රය සුරැකිව තබා ගැනීම හා සේවයෙන් ඉවත්ව යන අවස්ථාවේදී එය අදාල සාමාජිකයා වෙත ලබා දීම.

- සේවකයා සේවයට බැඳුනු පළමු මාසයේ සිට දායක මුදල් ගෙවීම සිදු කළ යුතු අතර ආයතන විසින් මාසික 'සී' වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීමේදී / විද්‍යුත් මාධ්‍යයෙන් දායක මුදල් යොමු කිරීමේදී 'බී' පත්‍රය අනුව සාමාජික අංකය සඳහන් කර එවීමට කටයුතු කිරීම.

- සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධ සියලුම කටයුතු වලදී (මූලිකවම 'සී' වාර්තා පිරවීම / විද්‍යුත් මාධ්‍යයෙන් ගෙවීම් කිරීමට දත්ත ඇතුලත් කිරීමේදී (Text File) / 'A','B' සහ 'H' පත්‍ර ලියාපදිංචිය) සේවා දායකයාගේ නම,ජාතික හැඳුනුම්පත් අංකය ඔහුට/ඇයට අයත් ජාතික හැඳුනුම්පත අනුව සඳහන් කිරීමට කටයුතු කිරීම.

- නව සේවකයකු බඳවාගෙන එම සේවකයා වෙනුවෙන් සාමාජික අංක ලබා දීමේදී සංඛ්‍යාත්මක අනුපිළිවෙල අනුව ලබා දීමට කටයුතු කිරීම හා කිසිම අවස්ථාවකදී එකම සාමාජික අංකය සාමාජිකයන් දෙදෙනෙකු වෙනුවෙන් ලබා දීම සිදු නොකිරීම.

- කිසියම් සේවකයකු සේවය කළ ආයතනයෙන් ඉවත් වී නැවතත් සේවයට බඳවා ගන්නේ නම්, නැවත බඳවා ගැනීමේදී එම සේවකයා වෙනුවෙන් නව සාමාජික අංකයක් ලබා දී එම සාමාජික අංකය යටතේ සේ.අ.අ. සඳහා දායක මුදල් යොමු කිරීමට කටයුතු කිරීම.

- මාසික 'සී' වාර්තා පිළියෙල කිරීම / විද්‍යුත් මාධ්‍යයෙන් ගෙවීම් කිරීමට දත්ත ඇතුලත් කිරීම (Text File) යන අවස්ථාවලදී එම ලේඛන හා දත්ත පද්ධතියන්හි සඳහන් කරන ලද සේව්‍යායතන අංකය, දායක මුදල් ගෙවීමට අදාළ වර්ෂය හා මාසය, සාමාජික අංක / නම් / ජාතික හැඳුනුම්පත් අංක / දායක මුදල් වටිනාකම් වල නිරවද්‍යතාවය නැවතත් පරීක්ෂා කර බලා තහවුරු කර ගැනීමෙන් පසුව යොමු කිරීම.

- 'සී' වාර්තා පිරවීමේදී / විද්‍යුත් මාධ්‍යයෙන් ගෙවීම් කිරීමට දත්ත ඇතුලත් කිරීමේදී (Text File) කම්කරු කාර්යාලයේ ලියාපදිංචි කරන ලද සේව්‍යායතන අංකය පමණක් සඳහන් කර එවීමට කටයුතු කිරීම.

- සේව්‍යායතන වෙත ලැබෙන මාසික සී වාර්තාවන්හි සඳහන් සාමාජික අංක, සාමාජික නම්, ජාතික හැඳුනුම්පත් අංක නිවැරදිද යන්න පරීක්ෂා කර බලා යම් විෂමතාවයක් පවතී නම් එය එම අවස්ථාවේදීම නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම.

- විද්‍යුත් මාධ්‍යයෙන් දායක මුදල් යොමු කිරීමේදී, එහි සාමාජික විස්තර විෂමතාවයක් හේතුවෙන් අදාළ දායක මුදල් ගිණුම්ගත නොවී පවතීනම් ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතන වෙත යොමු කරනු ලබන විද්‍යුත් තැපැල් පණිවිඩය පරීක්ෂාකර බලා අදාළ නිවැරදි කිරීම් ලබා දී ඇති උපදෙස් අනුව එම අවස්ථාවේදීම නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්ධ වාර්ෂිකව සාමාජිකයන් වෙත නිකුත් කරනු ලබන ගිණුම් ප්‍රකාශනයන්හි සඳහන් නම / ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාට අයත් ජාතික හැඳුනුම්පත අනුව නිවැරදිද යන්න හා බැර වී ඇති දායක මුදල් නිවැරදිද යන්න පරීක්ෂා කර බලා කිසියම් විෂමතාවයක් පවතීනම් එම විෂමතා කඩිනමින් නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම.

- සේව්‍යායතන විසින් මාසික දායක මුදල් ගෙවීම සිදු කළ පසු දායක මුදල් ගෙවීමට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතන වෙත නිකුත් කරනු ලබන ලදු පතෙහි සඳහන් විස්තර නිවැරදිද යන්න පරීක්ෂා කර බලා එහි යම්කිසි විෂමතාවයක් පවතී නම් එය එම අවස්ථාවේදීම නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම.

- ඔබ විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාසිකව / අර්ධ වාර්ෂිකව යොමු කරනු ලබන 'සී' වාර්තාවන්හි ආයතනික පිටපත් ආයතන සතුව සුරක්ෂිතව තබා ගැනීමට කටයුතු කිරීම.

සාමාජික අංක යටතේ විෂමතා ඇතිවීම වලක්වා ගැනීමත්, විෂමතා ඇති බවට හඳුනාගත් මුල් අවස්ථාවේදීම එය නිවැරදි කර ගැනීමට කටයුතු කිරීමත් මගින් පසු කාලීනව සංශෝධන සිදු කර ගැනීමට යාමේදී මුහුණ දීමට සිදුවන අපහසුතා (ආයතනය වසා ඇත්නම් කම්කරු කාර්යාලය වෙත යොමු වීමට සිදු වීම, සංශෝධනය සඳහා ඉදිරිපත් කිරීමට සිදු වන 'සී' වාර්තා දිරාපත් වී, අස්ථානගත වී, විනාශ වී තිබීම නිසා ඉල්ලීම් කරනු ලබන විස්තර ලබා දීමට ආයතන අපොහොසත් වීමෙන් ඇතිවන

අපහසුතා ආදීය) මඟා හරවා ගෙන ඉතා ඉක්මණින් හා පහසුවෙන්, බාධාවකින් තොරව සේ.අ.අ. ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව සාමාජිකයාටත් ඒ සඳහා අදාළ විස්තර ලබා දීමේ හැකියාව ආයතන වෙතත් මෙමඟින් හිමි වේ.

## දෝෂ / විෂමතා නිවැරදි කිරීම සඳහා ඉල්ලීම් කිරීමේදී දායක මුදල් විස්තර වාර්තාව සහ ආයතනික ලිපිය ඉදිරිපත් කළ යුතු ආකාරය සම්බන්ධ ආකෘති පත්‍ර

- ආයතනික ඉල්ලීම් ලිපිය

**ආයතනයේ ලිපි ශීර්ෂය හෝ ලිපිනය**

අධිකාරි,
සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
වයිට්(අ)වේස් ගොඩනැගිල්ල,
අංක 25, සර් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.
මහත්මයාණෙනි / මහත්මියනි,

**<u>සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුමෙහි නම /ජාතික හැඳුනුම්පත් අංකය සංශෝධනය කිරීම සඳහා වන ඉල්ලීමයි</u>**

අප ආයතනයෙහි සේවය කරන / කළ සේවකයාගේ සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුමෙහි සඳහන් නම / ජාතික හැඳුනුම්පත් අංකය සංශෝධනය සඳහා පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමු .

1 සාමාජිකයාගේ අංකය   [   /   /   ]
සේවායයාගේ අංකය   ඉංග්‍රීසි අක්ෂරය   සාමාජික අංකය

2 සාමාජික ගිණුම් ප්‍රකාශනය /"සී"/"සී 3" වාර්තා අනුව තොරතුරු (ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිගණක දත්ත පද්ධතියෙහි සඳහන්ව ඇති)
සාමාජිකයාගේ නම
ජාතික හැඳුනුම්පත් අංකය

3 "බී" කාඩ්පතෙහි තොරතුරු ( "බී" කාඩ්පතෙහි සඳහන්ව ඇති නම,ජාතික හැඳුනුම්පත් අංකය ජා.හැ. සඳහන් තොරතුරු අනුව වියයුතුය )
සාමාජිකයාගේ නම
ජාතික හැඳුනුම්පත් අංකය

4 උප්පැන්න සහතිකයට අනුව නම

5 ජාතික හැඳුනුම්පත අනුව තොරතුරු **(මෙහි සඳහන් තොරතුරු අනුව සංශෝධනයන් සිදු කෙරේ )**
සාමාජිකයාගේ නම
සාමාජිකයාගේ මුලකුරු සමඟ නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලියන්න)
ජාතික හැඳුනුම්පත් අංකය

6 ජංගම දුරකථන අංකය
(සංශෝධනය පිලිබඳව කෙටි පණිවිඩයක් (SMS) මගින් දැනුම්දීම සඳහා)

ආකෘතියකි

ඉහත නම් සියල්ලෙන්ම හැඳින්වෙන්නේ අංක 5 යටතේ සඳහන් නම සහ ජාතික හැඳුනුම්පත් අංකය හිමි සාමාජිකයා පමණක් බවත් ඉහත 1 හි සඳහන් සාමාජික අංකය යටතේ .......................... දින සිට ........................ දින දක්වා දායක මුදල් බැර කර ඇත්තේ ඔහු / ඇය වෙනුවෙන් පමණක් බවත් සහතික කරමි. ඒ අනුව, ඉහත 1 හි දක්වා ඇති සාමාජික ගිණුමෙහි සඳහන් නම / හැඳුනුම්පත් අංකය, අංක 5 යටතේ දැක්වෙන නම (ඉංග්‍රීසියෙන් සටහන් කර ඇති මුලකුරු සමඟ නම )/ජාතික හැඳුනුම්පත් අංකය පරිදි සංශෝධනය කර දෙන මෙන් ඉල්ලා සිටිමි .

....................................................     ......................................................
දිනය     සේවායෝජකයාගේ අත්සන
නම, තනතුර, නිළමුද්‍රාව

**<u>සැලකිය යුතුයි</u>**
සේවය කල ආයතනය විසින් ඉහත දක්වා ඇති ආකෘතියට අනුව සාමාජිකයාගේ නිවැරදි නම / ජාතික හැඳුනුම්පත් අංකය සහිත ලිපියක් ඉදිරිපත් කල යුතු අතර, ඒ සමගම අදාල ආයතනය විසින් අත්සන සහ **<u>නිලමුද්‍රාව සහිතව සත්‍ය පිටපත් ලෙස සහතික කල</u>** සාමාජිකයාගේ **<u>ජාතික හැඳුනුම්පතෙහි, උප්පැන්න සහතිකයෙහි සහ බී පත්‍රයෙහි (B card) පිටපත්</u>** ඉදිරිපත් කල යුතුය.

වැඩිදුර විමසීම් : 0112206690/ 0112206691/ 0112206692

■ දායක මුදල් විස්තර වාර්තාව

**සේ. අ. අ. සඳහා දායක මුදල් බැර කිරීම් විස්තරය (20%)** ආකෘතිය

සේවායයාගේ අංකය : ...............................................

සේවායයාගේ නම : .........................................................................

සාමාජිකයාගේ අංකය : .................................................

සාමාජිකයාගේ නම : ...........................................................................

| වර්ෂය / මාසය | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | | | | | | | | | | | | |
| පෙබරවාරි | | | | | | | | | | | | |
| මාර්තු | | | | | | | | | | | | |
| අප්‍රේල් | | | | | | | | | | | | |
| මැයි | | | | | | | | | | | | |
| ජූනි | | | | | | | | | | | | |
| **එකතුව** | | | | | | | | | | | | |
| ජූලි | | | | | | | | | | | | |
| අගෝස්තු | | | | | | | | | | | | |
| සැප්තැම්බර් | | | | | | | | | | | | |
| ඔක්තෝබර් | | | | | | | | | | | | |
| නොවැම්බර් | | | | | | | | | | | | |
| දෙසැම්බර් | | | | | | | | | | | | |
| **එකතුව** | | | | | | | | | | | | |
| **මුළු එකතුව** | | | | | | | | | | | | |
| **නිවාඩු දීමනා** | | | | | | | | | | | | |

............................................ ............................................................

**දිනය** **සේවායාගේ අත්සන (නිලමුද්‍රාව ද සහිතව)**

ඉහත කරුණු පිළිබඳව ඔබට වැඩිදුර කරුණු දැන ගැනීමක් හෝ කිසියක් ගැටලුවක් ඇත්නම් ඒ සඳහා පහත සඳහන් දුරකථන අංක හා සම්බන්ධ වීමටද www.epf.lkවෙත යොමු වීමටද කටයුතු කරන්න.

ඇමතුම් මධ්‍යස්ථානය - 0112 206 690-94/ වාර්තා සංශෝධන අංශය - 0112 477 336, 0112 477 398

මූලාශ්‍ර :

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි වාර්තා සංශෝධන අංශ අත්පොත

2013 මාර්තු / අප්‍රේල් සටහන සඟරාව

www.epf.lk

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත

# රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනයේදී ප්‍රාථමික අලෙවිකරණ ආයතන වල භූමිකාව



**කේ. එම්. එස්. සී. කුලතුංග**
**නියෝජ්‍ය අධිකාරී**
**රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව**

**පසුබිම**

යම්කිසි රටක රාජ්‍ය වියදම, රාජ්‍ය ආදායම අභිබවා යාමෙන් එම රට අයවැය හිඟයකට මුහුණ පානු ලබයි. එවැනි රටවල් අයවැය හිඟය පියවා ගැනීමේ මාර්ග ලෙස රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම, රාජ්‍ය වියදම් අඩු කිරීම හෝ ණය ලබා ගැනීම සිදු කරනු ලබයි. මෙහිදී ලෝකයේ රටවල් බොහෝ විට මෙම ක්‍රම තුනම යම් ප්‍රමාණයකට අනුගමනය කරනු ලබයි. අයවැය හිඟයක් පියවීම සඳහා රජයක් ණය ලබා ගැනීමේදී විචක්ෂණශීලී අවදානම් මට්ටමකට සහ අනුරූපව අවම පිරිවැයක් යටතේ ණය ලබා ගත යුතුය. නිසි ලෙස ණය කළමනාකරණය නොකරහොත් රටක් ආර්ථිකමය වශයෙන් බිඳ වැටීමට ලක් විය හැකි අතර ඒ හා සමානව ණය සපයා ඇති අනෙකුත් රටවලටද ගැටළු වලට මුහුණ දීමට සිදු වේ.

රාජ්‍ය ණය කළමනාකරණයේදී ඒ හා සම්බන්ධ ආයතනික සැලැස්ම රටකින් රටකට වෙනස් වේ. මෙම වෙනස්කම් ඇති වන්නේ ණය කළමනාකරණ කාර්යාලයේ පිහිටීම, විෂයපථය, ස්වාධීනත්වය, කළමනාකරණ ව්‍යුහයන්, වගවීමට ඇති හැකියාවේ මට්ටම යනාදියෙනි. ජාත්‍යන්තර වශයෙන් ගත් විට ණය කළමනාකරණ ආයතන බොහෝ විට මහ බැංකුවේ, මුදල් අමාත්‍යාංශයේ හෝ වෙනම ස්වාධීන ආයතනයක් ලෙස පිහිටා තිබෙනු දක්නට ලැබේ.

ණය රැස් කිරීම සඳහා රටවල් විවිධ ණය උපකරණ භාවිතා කරනු ලබයි. ඒවා දේශීය හා විදේශීය මූලාශ්‍ර ලෙස වර්ග කළ හැකිය. දේශීය මූලාශ්‍ර යටතේ ප්‍රධාන ණය උපකරණය වන්නේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරයි. විදේශීය ණය ප්‍රභවයන් ප්‍රධාන වශයෙන් ද්විපාර්ශවික ණය, බහුපාර්ශවික ණය හා වාණිජ ණය ලෙස දැක්විය හැකිය.

රටක ණය කළමනාකරණ ආයතනය (මෙතැන් පටන් නිකුත් කරන්නා ලෙස හැඳින්වේ) විසින් රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ ගනුදෙනු වලදී අතරමැදියෙක් ලෙස කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබූ විශේෂිත නියෝජිතයන් සමූහය ප්‍රාථමික අලෙවිකරුවන් (Primary Dealers) ලෙස හැඳින්වේ. මොවුන් ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය සුරැකුම්පත් නිකුතුවේදී රජයට අවශ්‍ය අරමුදල් එක්රැස් කිරීමට සෘජුවම දායක වන අතර ඒ හරහා රාජ්‍ය ණය කළමනාකරණයට දායක වේ.

මෙම ලිපියෙහි ප්‍රධානතම අරමුණ වනුයේ ප්‍රාථමික අලෙවිකරණ ආයතන වල වත්මන් භූමිකාව, ප්‍රාථමික අලෙවිකරණ ආයතනයක් ලෙස පත් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සහ ඔවුන් සතු වගකීම්, ප්‍රාථමික අලෙවිකරුවෙකු වීමේ වාසි හා අවාසි සහ ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අලෙවිකරණ පද්ධතිය පිළිබඳව කරුණු විශ්ලේෂණය කිරීමයි.

**රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනයේදී ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කාර්යභාරය**


ලෝකයේ ප්‍රාථමික අලෙවිකරණ පද්ධතිය 1960දී ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථමයෙන්ම ස්ථාපිත කර ඇත. ඉන්පසු, ප්‍රාථමික අලෙවිකරණ පද්ධතීන් 80 දශකයේ මැද භාගයේ යුරෝපයේද, 90 දශකයේ මැද භාගයේ සිට නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හිද (Emerging Markets) ව්‍යාප්ත විය. ඒ හා සමානව,

කාර්මික රටවල් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් ගණනාවක්ම ප්‍රාථමික අලෙවිකරණ පද්ධතීන් ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට ප්‍රාථමික අලෙවිකරණ ආයතන වල කාර්යභාර්ය ගෝලීය වශයෙන් පුළුල් පරාසයක විහිදී ඇත.

ප්‍රාථමික අලෙවිකරුවන් යනු, රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීමට අදාළ වන ප්‍රාථමික වෙන්දේසි සඳහා සෘජුවම සහභාගීවීමේ වරප්‍රසාදය ඇති සුවිශේෂී වූ මූල්‍ය ආයතන සමූහයකි. එම සන්දර්භයට අනුව, ප්‍රාථමික වෙළෙඳපොළ වෙන්දේසිවල සාර්ථකත්වය සඳහා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සක්‍රීය සහභාගීත්වය සෘජුව බලපානු ලබයි. ප්‍රාථමික වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය සලකා බැලුවහොත්, නිකුත් කරන්නා විසින් තම සුරැකුම්පත් ප්‍රථමයෙන්ම නිකුත් කරනු ලබන අවස්ථාව, ප්‍රාථමික වෙළෙඳපොළ යනුවෙන් අදහස් කරනු ලබයි. මෙහිදී ප්‍රාථමික වෙන්දේසි සඳහා ඉදිරිපත් කරන රාජ්‍ය සුරැකුම්පත් වලට අවශ්‍ය අරමුදල් වෙළෙඳපොළ තුළින්ම සපුරා ගැනීම නිකුත් කරන්නා හට අත්‍යවශ්‍ය කරුණකි. ප්‍රාථමික අලෙවිකරුවන් හැරුණුවිට අනෙකුත් ආයෝජකයන්ට සෘජුවම රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීමට අදාල ප්‍රාථමික වෙන්දේසියට ලංසු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් එම ලංසු ප්‍රාථමික අලෙවිකරුවන් හරහා ඉදිරිපත් කරමින් වෙන්දේසියට සහභාගී වීම කළ යුතු වේ. රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළක ගනුදෙනු සිදුවන ආකාරය පහත රූප සටහනෙන් පැහැදිලි වේ.

ප්‍රාථමික අලෙවිකරුවන් අදාල සුරැකුම්පත් නිකුත් කිරීමේ වෙන්දේසියේදී තම ආයතනය වෙනුවෙන් ලංසු ඉදිරිපත් කර සුරැකුම්පත් සෘජුවම මිල දී ගන්නා අතර, අනෙක් අතට අතරමැදියෙකු ලෙස ක්‍රියා කරමින් අනෙකුත් ආයෝජකයන් වෙනුවෙනුත් ප්‍රාථමික වෙන්දේසියට ලංසු ඉදිරිපත් කර සුරැකුම්පත් මිලට ගනු ලැබේ. මේ අනුව, ප්‍රාථමික වෙළෙඳපොළ සාර්ථකත්වය සඳහා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ දායකත්වය සෘජුවම බලපානු ලබන බැවින් ඔවුන්

**රූප සටහන 1: රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය**



රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි සඳහා සක්‍රීයව සහ තරඟකාරී ලෙස සහභාගී වෙතැයි නිකුත් කරන්නා විසින් අපේක්ෂා කරනු ලබයි.

සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ අතරමැදියෙකු ලෙස ක්‍රියා කරමින් ද්විතීයික වෙළෙඳපොළ සංවර්ධනය සඳහාද ප්‍රාථමික අලෙවිකරුවන් විශාල දායකත්වයක් දක්වනු ලබයි. ද්විතීයික වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය සලකා බැලුවහොත් ප්‍රාථමික වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීමෙන් පසුව සිදුවන ගනුදෙනු වලට අදාල වන වෙළෙඳපොළ ද්විතීයික වෙළෙඳපොළ යනුවෙන් හඳුන්වනු ලබයි. ද්විතීයික වෙළෙඳපොළ තුළ ප්‍රාථමික අලෙවිකරුවන් ඇතුළු අනෙකුත් ආයෝජකයින් විසින් යම් කිසි ලාභයක් තබාගෙන සුරැකුම්පත් විකිණීම හා මිලදී ගැනීම සිදු කරයි. ද්විතීයික වෙළෙඳපොළ තුළ ගනුදෙනු ප්‍රධාන වශයෙන් ප්‍රති මිලදී ගැනීම් හා විකිණුම් (Repurchase) Reverse Repurchase Transactions) සහ ස්ථිර පදනම මත මිලදී ගැනීම් හා විකිණුම් (Outright Purchases and Sales) යන දෙයාකාරයෙන් සිදු වේ. ද්විතීයික වෙළෙඳපොළ තුළ ආයෝජකයන්ට තම සුරැකුම්පත් කල්පිරෙන කාලය දක්වා තමා වෙත රඳවා තබා ගත හැකි අතර නැතහොත් කල් පිරීමට පෙර විකිණීම සිදු කළ හැකිය. විශේෂයෙන් ප්‍රාථමික වෙන්දේසි වලින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළ තුළ බෙදා හැරීමේ මාර්ග නිර්මාණය කරනු ලබන්නේ ප්‍රාථමික අලෙවිකරුවන් විසිනි. රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ අතරමැදි ආයතනයක් ලෙස ප්‍රාථමික අලෙවිකරුවන් නොසිටියේ නම් ආයෝජකයන් හට සුරැකුම්පත් මිලදී ගැනීමට හා විකිණීමට අපහසු වනු ඇති අතර එය රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ පැවැත්මට අහිතකර වනු ඇත. මේ අනුව, වෙළෙඳපොළ සාදන්නෙකු ලෙස ක්‍රියා කරමින් ද්විතීයික වෙළෙඳපොළ සංවර්ධනයට කටයුතු කිරීම ප්‍රාථමික අලෙවිකරුවන්ගේ වැදගත් කාර්යයකි.

මිල ගවේෂණය (Price Discovery) සඳහා මහ බැංකුව, මුදල් අමාත්‍යංශය, රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය වැනි ආයතන වෙත රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු හා සම්බන්ධ තොරතුරු ලබාදීම ප්‍රාථමික අලෙවිකරුවන්ගේ තවත් වගකීමකි. එහිදී සුරැකුම්පත් වල ගැනුම් හා විකුනුම් මිල ගණන්, වෙළෙඳපොළ ධාරිතාවය, පොලී අනුපාතිකයන් ආදී සුරැකුම්පත් වෙළෙඳපොළ හා සම්බන්ධ තොරතුරු අදාල වගකිවයුතු ආයතන වලට අඛණ්ඩව, කාලීනව හා නිවැරදිව ලබා දීම මොවුන්ගේ වගකීමකි.

තවද, රාජ්‍ය ණය සේවාකරණයේ පිරිවැය හා අවදානම අඩු කරමින් රාජ්‍ය ණය කළමනාකරණයට සහාය දැක්වීම, රාජ්‍ය සුරැකුම්පත් අලෙවිකරණය අර්ථාන්විතව හා රෙගුලාසි වලට අනුකූලව සිදු කිරීම, තරඟකාරී හා විශ්වාසදායී වෙළෙඳපොළක් නිර්මාණය කිරීම ආදී ක්‍රියාවන්ද ප්‍රාථමික අලෙවිකරු ක්‍රමයකින් බලාපොරොත්තු වන සේවාවන් අතර වේ. ඒ අනුව, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ කටයුතු ස්ථාවරව හා ක්‍රමානුකූලව පවත්වා ගැනීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ භූමිකාව අත්‍යවශ්‍ය සාධකයකි.

### ප්‍රාථමික අලෙවිකරුවකු වීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සහ ඔවුන් සතු වගකීම්

රටක ප්‍රාථමික අලෙවිකරණ ආයතන පත් කරනු ලබන්නේ අදාල රටෙහි ණය කළමනාකරණ ආයතනය විසිනි. එම ආයතනය විසින් ප්‍රාථමික අලෙවිකරණ ආයතනයක් ලෙස සුදුසුකම් ලැබීම සඳහා විවිධ නිර්ණායක පනවා ඇති අතර ඒවා රටකින් රටකට වෙනස් වේ.

පහත සඳහන් වගුව 1 මගින් තෝරාගත් රටවල් 7ක ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස සුදුසුකම් ලැබීමට අවශ්‍ය නිර්ණායක දක්වා ඇත.

ප්‍රාග්ධන අවශ්‍යතාවය: ප්‍රාථමික අලෙවිකරුවකු වීමට නම් ඒ සඳහා අයදුම් කරන ආයතයනක් විසින් යම්කිසි අවම ප්‍රාග්ධන ප්‍රමාණයක් පවත්වාගෙන යා යුතුය. එම ප්‍රාග්ධන අවශ්‍යතාවය රටකින් රටකට වෙනස් වනු ලැබේ. උදාහරණයක් ලෙස ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස සලකා බැලීමට නම් අදාල ආයතනය එ. ජ.ඩොලර් මිලියන 150ක අවම ප්‍රාග්ධන ප්‍රමාණයක් පැවතිය යුතුය. ශ්‍රී ලංකාව ගත් විට 2023.01.01 සිට බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර සමාගම් රුපියල් බිලියන 2.5කට නොඅඩු මූලික ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතු වේ.

සක්‍රීය දායකත්වය: ප්‍රාථමික අලෙවිකරුවකු වීම සඳහා සලකා බැලීමට නම් ඒ සඳහා අයදුම් කරන ආයතනය ඒ වන විටත් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ

**වගුව 1: ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස සුදුසුකම් ලැබීමට අවශ්‍ය නිර්ණායක**

| රට | ප්‍රමාණවත් ශේෂ පත්‍රයක් තිබීම | නියාමන ආයතනයක අනුමැතිය තිබීම | අවම වෙළඳපොළ කොටස/ ප්‍රමාණය | කාර්ය මණ්ඩලය සහ තාක්ෂණික හැකියාව | ශක්‍ය ව්‍යාපාර සැලැස්මක් තිබීම |
|---|---|---|---|---|---|
| එක්සත් රාජධානිය | √ | √ | √ | √ | √ |
| ඇමරිකා එක්සත් ජනපදය | √ | √ | √ | √ | √ |
| ඉන්දියාව | √ | √ | | | √ |
| ජපානය | √ | √ | √ | √ | √ |
| බ්‍රසීලය | √ | √ | | | |
| මෙක්සිකෝව | | √ | √ | | |
| මෝල්ඩෝවා | | √ | √ | √ | |

මූලාශ්‍රය: Speian.O. (2022)

සැලකිය යුතු ලෙස සක්‍රීය දායකත්වයක් දක්වන ආයතනයක් විය යුතු අතර ප්‍රාථමික අලෙවිකරුවෙක් වීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳව වෙළෙඳපොළ තුළ යම් ප්‍රසිද්ධියක් හා කීර්තිනාමයක් ඔවුන් සතු විය යුතුය. මන්දයත් ප්‍රාථමික අලෙවිකරුවකු වූ පසු එම ආයතනය විසින් රාජ්‍ය සුරැකුම්පත් සැලකිය යුතු ප්‍රමාණයක් නිතිපතා වෙළඳාම් කරනු ඇතැයි සහ වෙළෙඳපොළ සංවර්ධනය සඳහා දිගුකාලීනව කැප වෙතැයි නිකුත් කරන්නා විසින් අපේක්ෂා කරනු ලබයි.

තාක්ෂණික පහසුකම් සහ විශේෂඥ දැනුම: ප්‍රාථමික අලෙවිකරුවකු වීම සඳහා සුදුසුකම් ලැබීමට නම් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් එම ආයතනය සතුව තිබිය යුතුය. එසේම රාජ්‍ය සුරැකුම්පත් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ සුදුසුකම්ලත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එම ආයතනය සතු වීමද අත්‍යවශ්‍ය කරුණක් ලෙස සලකනු ලබයි. මන්දයත්, රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ වෙළෙඳපොළ දත්ත විශ්ලේෂණය කිරීම, විශාල ප්‍රමාණයේ ගනුදෙනු සිදු කිරීම සහ අනෙකුත් වෙළෙඳපොළ සහභාගීවන්නන් හා සන්නිවේදනය කිරීම ආදී කටයුතු වලදී එම කාර්යයන් සාර්ථකව ඉටු කර ගැනීම සඳහා අදාළ කාර්යමණ්ඩලය හට රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ කටයුතු පිළිබඳ මනා දැනුමකින් පරිපූර්ණ විය යුතුය.

ශක්‍ය ව්‍යාපාර සැලැස්මක් තිබීම: ප්‍රාථමික අලෙවිකරුවෙක් වීම සඳහා අයදුම් කරන ආයතනයට රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළට අදාළ ඉලක්ක ඇතුලත් ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කළ යුතු වේ. එසේම, එම ව්‍යාපාර සැලැස්ම කාලීනව සහ වාර්ෂික පදනමින් යාවත්කාලීන කළ යුතු වේ.

එසේම, ප්‍රාථමික අලෙවිකරුවකු වූ පසු ඔවුන් අදාළ නිකුතු ආයතනය හෝ ඔවුන් නියාමනය කරනු ලබන ආයතනය මගින් පනවනු ලබන කොන්දේසි, උපදෙස් හා නියාමනයන්ට අනුගත විය යුතුය. ඉන් සමහරක් පහත සඳහන් වගුව 2 මගින් දැක්වේ.

සෑම ප්‍රාථමික අලෙවිකරුවකුම වෙන්දේසියකදී ලංසු තැබීමේදී නිශ්චිත අවම ලංසු ප්‍රමාණයක් සහ/හෝ සාර්ථක ලංසු ප්‍රමාණයක් ඉදිරිපත් කළ යුතු වේ. ලංසු ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කළ යුතු අවම මුදල සාමාන්‍යයෙන් වෙන්දේසි කරන ලද මුළු මුදලින් යම් ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ වේ.

$$\text{ප්‍රාථමික අලෙවිකරුවෙක් විසින් තැබිය යුතු සමස්ත ලංසු ප්‍රමාණයෙහි අවම වටිනාකම} = \frac{\text{ප්‍රාථමික වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ මුළු වටිනාකම}}{\text{සුදුසුකම් ලත් ප්‍රාථමික අලෙවිකරුවන් සංඛ්‍යාව}}$$

**වගුව 2: ප්‍රාථමික අලෙවිකරුවන් සපුරාලිය යුතු නිර්ණායක**

| රට | වෙන්දේසි වලදී අවම සහභාගීත්ව අනුපාතිකය | සෑම වෙන්දේසියක් සඳහාම සහභාගී වීම | තොරතුරු හා දත්ත සැපයීම | අවම වෙළෙඳපොළ කොටසක් පවත්වාගෙන යාම | වෙන්දේසි මිල විකෘති කිරීමෙන් වැලකීම |
|---|---|---|---|---|---|
| එක්සත් රාජධානිය | √ | √ | √ | √ | |
| ඇමරිකා එක්සත් ජනපදය | √ | √ | √ | √ | √ |
| ඉන්දියාව | √ | √ | √ | √ | √ |
| ජපානය | √ | √ | √ | √ | √ |
| බ්‍රසීලය | √ | √ | √ | √ | √ |
| මෙක්සිකෝව | √ | √ | √ | √ | √ |
| මෝල්ඩෝවා | | | √ | √ | |

මූලාශය: Speian.O. (2022)

වෙන්දේසියකදී ලංසු සාර්ථක වීමේ අනුපාතිකය ගණනය කරනුයේ අදාල වෙන්දේසියේදී නිකුත් කළ සම්පූර්ණ ප්‍රමාණයෙන් යම් ප්‍රතිශතයක් ලෙසය. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට සෑම ප්‍රාථමික අලෙවිකරුවකු විසින්ම එක් එක් කාර්තුවක් තුළ, පළමු අදියර යටතේ කාර්තුව ඇතුළත සිදු කරන නිකුතු සාමාන්‍යයෙන් සාර්ථක ග්‍රහණය කිරීම (Successful Subscription) අවම වශයෙන් 50% ලබා ගැනීමට අවශ්‍ය වේ. ප්‍රාථමික අලෙවිකරුවන් ලබා ගන්නා සාර්ථක ග්‍රහණය කිරීම් ගණනය කිරීමේදී, අදියර ෂෂ යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් විසින් කරන ලද ඕනෑම ග්‍රහණය කිරීමක් අවම සාර්ථක ග්‍රහණය කිරීම් වලින් 2% ඉක්මවා නොයන්නේ නම් පිළිගනු ලැබේ. මෙවැනි විධානයන් මගින් නිකුත් කරන්නා අපේක්ෂා කරනුයේ සෑම වෙන්දේසියක් සඳහාම ප්‍රාථමික අලෙවිකරුවන්ගේ විධිමත් හා සක්‍රීය සහභාගීත්වයයි.

විනිවිදභාවයකින් යුතුව ගනුදෙනු සිදු කිරීමට හා මිල නිරාවරණය තුළින් රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීම පිණිස ප්‍රාථමික අලෙවිකරුවන් විසින් සිදු කරනු ලබන ගනුදෙනු නිශ්චිත කාල සීමාවක් තුළ නිකුතු ආයතනයට ලබා දිය යුතු වේ. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව ගත් කළ සියළුම ප්‍රාථමික අලෙවිකරුවන් බ්ලූම්බර්ග් (Bloomberg) වෙළෙඳ පද්ධතිය භාවිතා කරමින් ප්‍රාථමික අලෙවිකරුවන් නොවන ආයෝජකයන් සමග සිදු කරන රුපියල් මිලියන 50 ඉක්මවන ගනුදෙනු වල එලදා අනුපාතික හා ප්‍රමාණයන් එම ගනුදෙනුව සිදුවී විනාඩි 30ක් ඇතුළත වාර්තා කළ යුතුය. මේ අනුව, රාජ්‍ය සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු පිළිබඳව විශ්වාසනීයත්වය සහ ආයෝජකයන්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ ගනුදෙනු වාර්තාකරණ පද්ධති රටවල් විසින් හඳුන්වා දී ඇත. මෙවැනි ගනුදෙනු පද්ධති ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනයට සේම වෙළෙඳපොළ හැසිරීම හඳුනා ගැනීම සඳහා ද වැදගත් වේ. තවද, ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු වලදී ප්‍රාථමික අලෙවිකරුවන් විසින් වෙළෙඳපොළෙහි පවතින මිල ගණන් හා සමානුපාතිකව යමින් මිල විකෘති කිරීම් වලින් තොරව ගනුදෙනු සිදු කළ යුතුය.

ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා විවිධ නිර්ණායක පැනවීමේ ප්‍රධානම අරමුණ වනුයේ විනිවිද හා කාර්යක්ෂම ප්‍රාථමික අලෙවිකරණ පද්ධතියක් රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ පවත්වාගෙන යාමය.

### ප්‍රාථමික අලෙවිකරුවෙකු වීමේ වාසි සහ අවාසි

ප්‍රාථමික වෙන්දේසි සඳහා සෘජුවම සහභාගී වීමට වරප්‍රසාද ලත් එකම ආයතන සමූහය වන්නේ ප්‍රාථමික අලෙවිකරුවන්ය. එමගින් ඔවුන්ට වාසි ගණනාවක්

හිමි වේ. ඔවුන් හට ප්‍රාථමික වෙන්දේසි වලින් රජයේ සුරැකුම්පත් වට්ටම් සහිත මිලකට සෘජුවම මිලදී ගත හැකි අතර එම සුරැකුම්පත් ඉහළ මිලකට ද්විතීයික වෙළෙඳපොළ විකිණීමට හැකියාව ලැබීම මගින් ලාභ ඉපයීමට අවස්ථාව ලැබේ.

තවද, ප්‍රාථමික අලෙවිකරුවන්හට රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රාථමික අලෙවිකරුවකු වීම තුළ අනෙකුත් මූල්‍ය ආයතන වලට ප්‍රවේශ විය නොහැකි වෙළෙඳපොළ තොරතුරු ලබා ගැනීමට හැකි වේ. එම තොරතුරු ප්‍රවේශය මගින් ඔවුන්ට රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන සම්බන්ධයෙන් වඩාත් කාර්යක්ෂම, නිවැරදි සහ හිතකර තීරණ ගැනීමට හැකියාව ලැබෙනු අතර එමගින් ඔවුන්ගේ ලාභය උපරිම කිරීමට හැකියාව ලැබෙනු ඇත.

එසේම ප්‍රාථමික අලෙවිකරුවකු වීම තුළ බොහෝ රටවල ප්‍රාථමික අලෙවිකරුවන්ට මහ බැංකුව මගින් සපයන ද්‍රවශීලතා පහසුකම් ලබා ගැනීමේ හැකියාව හිමි වේ. එහිදී මහ බැංකුව විසින් පවත්වනු ලබන විවට වෙළෙඳපොළ කටයුතු (Open Market Operations) සඳහා සහභාගී වීමට හැකිවීම, එක්දින ද්‍රවශීලතා පහසුකම (Intra Day Liquidity Facility) සහ නිත්‍ය ණය පහසුකම (Standing Lending Facility) ගැනීමට හැකිවීම ඒ අතර ප්‍රධාන වේ. මෙමගින් ඔවුන් හට පහසුවෙන් සහ ලාභදායී ලෙස තම ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාගැනීමට හැකියාව ලැබේ.

කෙසේ වුවද, අනෙකුත් සෑම මූල්‍ය ආයතනයක් සේම ප්‍රාථමික අලෙවිකරුවන් හටද තම එදිනෙදා කටයුතු වලදී යම් අවාසි සහගත තත්වයන්ට සහ අවදානම් වලට මුහුණ දීමට සිදු වන අවස්ථා ඇත. ප්‍රාථමික අලෙවිකරුවන්ට මුහුණ දීමට සිදු වන ප්‍රධානතම අවදානමක් වන්නේ වෙළෙඳපොළ අවදානමයි (Market Risk). එනම්, ප්‍රාථමික අලෙවිකරුවකු හට තමා විසින් මිලදී ගත් සුරැකුම්පත් වල මිල ඉහළ/පහළ යෑම තුළින් පාඩු සිදු විය හැකිය. උදාහරණයක් ලෙස ප්‍රාථමික අලෙවිකරුවකු විසින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් මිල දී ගත් සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළෙහි නොවිකුණා තමා සන්තකයෙහි තබා සිටින අවස්ථාවක එම සුරැකුම්පතෙහි වෙළෙඳපොළ මිල පහත වැටුණහොත් සැලකිය යුතු අලාභයක් සිදු විය හැකිය. මේ අනුව, මොවුන්ට ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් තිබිය යුතුය.

ප්‍රාථමික අලෙවිකරුවන් මුහුණදෙන තවත් අවදානමක් වන්නේ මෙහෙයුම් අවදානමයි (Operational Risk). එනම්, තාක්ෂණික ගැටළු, පළපුරුදු මානව සම්පත් හිඟතාවය වැනි මෙහෙයුම් අවදානම් වලට මෙවැනි ආයතන මුහුණ දේ. උදාහරණයක් ලෙස අදාල ප්‍රාථමික අලෙවිකරුවන්ගේ වෙළඳ පද්ධතිය වෙන්දේසි දිනයකදී නිවැරදිව ක්‍රියාත්මක නොවුනහොත් අදාල කාලපරිච්ඡේදය තුළ ලංසු ඉදිරිපත් කිරීමට නොහැකි වී සැලකිය යුතු අවාසිදායක තත්වයන්ට මුහුණ දීමට සිදු විය හැක. තවද, ණය අවදානමටද (Credit Risk) ප්‍රාථමික අලෙවිකරුවකුට මුහුණ දීමට සිදු වේ. එනම්, රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන ගනුදෙනුවකදී අනෙක් පාර්ශවයක් අදාල ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රාථමික අලෙවිකරුවන්ට පාඩු සිදු විය හැකිය.

කෙසේ නමුත්, රාජ්‍ය ණය කළමනාකරණයේදී ප්‍රාථමික අලෙවිකරුවන් විසින් සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන අතර ප්‍රාථමික අලෙවිකරුවන් හට මුහුණ දීමට සිදු වන අවාසිදායක තත්ත්වයන් හා අවදානම් අවස්ථාවන් ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් පවත්වාගෙන යාම තුළින් අවම කර ගනිමින් රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ සුමටව කටයුතු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

**ප්‍රාථමික අලෙවිකරණ පද්ධතිය - ශ්‍රී ලංකාවේ පැතිකඩ**

**(1) ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වන නීතිමය රාමුව**

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි (මෙතැන් පටන් මහ බැංකුව ලෙස හැඳින්වේ) රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, රජයේ මූල්‍ය නියෝජිතයා ලෙස රජය වෙනුවෙන් ණය කළමනාකරණය සිදු කරන අතර ප්‍රාථමික අලෙවිකරුවන් හරහා වෙළෙඳපොළ වෙත රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම සිදු කරනු ලබයි.[1] ප්‍රාථමික අලෙවිකරුවන් පත්කිරීම, නියාමනය හා අධීක්ෂණය 1923 අංක 08 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (Local Treasury Bill Ordinance No 08 of 1923) යටතේ සහ 1937 අංක 07 දරන ලියාපදිංචි

1 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව රාජ්‍ය ණය කළමනාකරණ ආයතනයකට හෝ කාර්යාලයකට අදාල නීතිය ක්‍රියාත්මක වූ පසු දැනට රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිතයා වශයෙන් මහ බැංකුව ඉටු කරන කාර්යය මහ බැංකුවේ විෂය පථයෙන් ඉවත් වීමට නියමිත අතර එතෙක් මහ බැංකුව රජයේ නියෝජිතයෙකු ලෙස රාජ්‍ය ණය කළමනාකරණ වගකීම ඉටු කරයි.

ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (Registered Stock and Securities Ordinance No 07 of 1937) යටතේ සිදු කරනු ලබයි. ප්‍රාථමික අලෙවිකරුවන් වීම සඳහා යෝග්‍ය ආයතන වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනයන්ය. 2009 ජූනි 24 දින මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2009 අංක 1 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් රෙගුලාසිය සහ 2009 අංක 1 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් රෙගුලාසිය සහ 2021 ජූලි 21 දින නිකුත් කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳ කොන්දේසිය මගින් ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස අයදුම් කිරීමේදී සලකා බලන කරුණු, ඔවුන්ගේ යුතුකම් හා ප්‍රතිලාභ, ප්‍රාථමික අලෙවිකරුවකු වූ පසු සැපිරිය යුතු කොන්දේසි, ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය සහ නියාමනය පිළිබඳව සවිස්තරව කරුණු දක්වා ඇත. කෙසේ වුවද, ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීම හා සම්බන්ධ නිර්ණායක හා ඔවුන් සඳහා පැනවෙන නියාමනයන් කලින් කලට මහ බැංකුව විසින් තීරණය කරනු ලැබේ.

**(2) ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය**

ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීම සිදු කරනුයේ මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසිනි. ප්‍රාථමික අලෙවිකරුවකුගේ ක්‍රියාකාරකම් සිදු කිරීමේ අරමුණ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ වෙනත් ආයතනයක් ප්‍රාථමික අලෙවිකරුවකු වීමට නම් ඒ සඳහා අයදුම්පතක් ප්‍රථමයෙන්ම මහ බැංකුවෙහි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. මේ අනුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් එම ආයතනය ප්‍රාථමික අලෙවිකරණ ආයතනයක් ලෙස සුදුසුකම් ලැබීම සඳහා පනවා ඇති නිර්ණායක සපුරා තිබේදැයි පරීක්ෂා කරනු ලැබේ. බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හා බැංකු නොවන මූල්‍ය ආයතනයක් ගත් විට සමහර නිර්ණායක ඔවුන් පොදුවේ සැපිරිය යුතු අතර සමහර නිර්ණායක එකිනෙකට වෙනස් වේ.

රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ස්ථායීතාව වැඩි දියුණු කිරීම හා ආයෝජකයින් ආරක්ෂා කිරීම උදෙසා මහ බැංකුව විසින් ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය කරනු ලබයි. බැංකු ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අධීක්ෂණ කටයුතු මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අධීක්ෂණ කටයුතු මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද සිදු කරනු ලබයි. මේ අනුව, මහ බැංකුව මගින් විචක්ෂණ මාර්ගෝපදේශ, නීතිමය නිර්ණායක සහ ආචාර ධර්ම පද්ධති නිකුත් කිරීම සිදු කරන අතර ප්‍රාථමික අලෙවිකරුවන් හා කරනු ලබන සාකච්ඡා හා විධිමත් රැස්වීම් මගින් අවශ්‍ය අවස්ථා වලදී ගත යුතු පියවර සාකච්ඡා කරනු ලබයි. තවද, ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය, සුරැකුම්පත් වල භාරකාරත්වය දැරීම, වෙළෙඳපොළ මිල තක්සේරු කිරීම, ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම්, මූල්‍ය වාර්තා හා ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම, වෙන්දේසි වලදී අවම සහභාගීත්ව අනුපාතය සහ තොරතුරු හා දත්ත සැපයීම යනාදිය සම්බන්ධයෙන් මහ බැංකුව විසින් විටින් විට රෙගුලාසි නිකුත් කරනු ලබයි. මහ බැංකුවේ රෙගුලාසි හා නීති වලට අනුගත නොවන ප්‍රාථමික අලෙවිකරුවන් හට අදාල නීතිමය රාමුව තුළ නිසි නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබයි.

**(3) රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටිය**

මහ බැංකුවෙහි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය සුරැකුම්පත් විවිධ කල්පිරීමේ කාල සීමා සහිතව කෙටි කාලීන හා දිගු කාලීන ණය උපකරණ ලෙස භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරනු ලබයි. භාණ්ඩාගාර බිල්පත් කල් පිරීමේ කාල සීමාව දින 91, දින 182 හා දින 364 ලෙස කෙටි කාලීනවද භාණ්ඩාගාර බැඳුම්කර කල් පිරීමේ කාල සීමාව අවුරුදු 2 සිට අවුරුදු 30 දක්වා දිගු කාලීනවද නිකුත් කරනු ලැබේ. රාජ්‍ය සුරැකුම්පත් වල ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුට හෝ ආයතනයකට මහ බැංකුවෙහි ලියාපදිංචිව සිටින සක්‍රීය ප්‍රාථමික අලෙවිකරණ ආයතන හා බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ඕනෑම අවස්ථාවකදී ආයෝජනය කළ හැකිය. විදේශීය ආයෝජකයින් හට ද සමස්ත රාජ්‍ය සුරැකුම්පත් වලින් සියයට 5ක් දක්වා ප්‍රමාණයක් ඕනෑම අවස්ථාවකදී ලබා ගත හැකිය.

මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ වෙන්දේසි සතිපතා පවත්වනු ලබයි. බොහෝ විට භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සතියේ සෑම බදාදා දිනද, බදාදා රජයේ නිවාඩු දිනයක් නම් ඊට පෙර දිනයේද පවත්වනු ලබන අතර භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි

භාණ්ඩාගාර බැඳුම්කර පරිණතවන ආකාරය අනුව බොහෝවිට මසකට වරක් හෝ දෙවරක් පවත්වනු ලැබේ. රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි වලට අදාල දැන්වීම් වෙන්දේසි දිනයට අවම වශයෙන් දින දෙකකට පෙර පුවත්පත් වල සහ මහ බැංකුවෙහි වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. ප්‍රාථමික අලෙවිකරුවන් හරහා ප්‍රාථමික වෙන්දේසියේදී ලංසු තැබීම මගින් ආයෝජකයන්ට සුරැකුම්පත් මිල දී ගත හැකිය. ප්‍රාථමික වෙන්දේසිය සඳහා ලංසු උදෑසන 8.30 සිට 11.00 දක්වා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත අන්තර්ජාලය මත පදනම් වූ රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීමේ පද්ධතිය තුළින් ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ ප්‍රාථමික වෙන්දේසියක් අදියර කිහිපයකින් පවත්වනු ලැබේ. මහ බැංකුවෙහි රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම හා සම්බන්ධ ටෙන්ඩර් මණ්ඩලය මගින් වෙන්දේසියෙහි පළමු අදියරෙහි ප්‍රතිඵල තීරණය කරනු ලබන අතර භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය ගත් විට පළමු අදියරේදී (Phase I) සම්පූර්ණ නිකුතුව සිදු නොවන අවස්ථාවලදී වෙන්දේසියේදී පිළිගත් මුදල හා වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලද මුදල අතර වෙනස සහ වෙන්දේසියේදී පිරිනමන ලද සමස්ත මුදලින් සියයට 10% සඳහා දෙවන අදියර (Phase II) විවෘත වේ. මෙහිදී පළමු අදියරේදී සම්පූර්ණ නිකුතුව පිළිගන්නේ නම් දෙවන අදියර විවෘත වනුයේ වෙන්දේසියේදී පිරිනමන මුදලින් සියයට 10% සඳහා පමණි. භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය ගත් විට අදියර ෂට පසුව ඕනෑම අඩු නිකුතුවක් සඳහා නැවත II අදියර විවෘත කරන අතර වෙන්දේසි සහභාගීකරුවන්ට මෙම අදියරේදී ලංසු ඉදිරිපත් කළ හැකිය. තවදුරටත් අදියර I හා II ක්‍රියාත්මක කිරීමෙන් පසුවද වෙන්දේසියට පිරිනමන ලද මුදලින් යම්කිසි ප්‍රමාණයක් ඉතුරු වුවහොත් එය ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සාර්ථක වූ සහභාගීත්ව අනුපාතික මත පදනම්ව ප්‍රාථමික අලෙවිකරුවන් අතර නිකුත් කිරීම සිදු කෙරේ. මෙහිදී III අදියර ක්‍රියාත්මක වීමට නම් I අදියරේ නිකුත් කළ ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට 80ක් වත් පළමු අදියරේදී පිළිගත යුතු අතර තෙවන අදියර ක්‍රියාත්මක වන්නේ වසර 5ට අඩු පරිණතයන් සඳහා පමණකි. භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියක පළමු අදියරේදී සම්පූර්ණ නිකුතුව පිළිගතහොත් වෙන්දේසියේදී පිරිනමන ලද ප්‍රමාණයෙන් සියයට 10ක් සඳහා සෘජු නිකුතු කවුළුවක් (Direct Issuance Window) විවෘත වේ. අනුමත කළ ප්‍රමාණයට වඩා ලංසු ලැබුනහොත් පළමු අදියර තුළදී වෙන්දේසියට සහභාගී වූ අයගේ සාර්ථකත්වයට සමානුපාතිකව වෙන් කිරීම් සිදු කරනු ඇත. භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර වෙන්දේසිවල පළමු අදියරෙන් පසු අනෙක් අදියරයන් හා සෘජු නිකුතු කවුළුව විවෘත කරනුයේ ඒ ඒ වෙන්දේසියේදී බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය (Weighted Average Yield Rate) මතය. වෙන්දේසියෙහි ප්‍රතිඵල පුවත්පත් මගින් හා මහ බැංකුවෙහි වෙබ් අඩවිය හරහා පළ කරනු ලැබේ.

ප්‍රාථමික වෙන්දේසියේදී පිළිගත් ලංසු පියවීම (Settlement) වෙන්දේසියක් පැවැත්වූ දින සිට ව්‍යාපාරික කටයුතු සිදු කරන දින දෙකකට පසුව සිදු වේ. එහිදී අදාල ආයෝජකයාට සුරැකුම්පත් පැවරීම සිදු කරනුයේ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය (Scripless Securities Settlement System) හරහාය. මෙහිදී ආයෝජකයන්ගේ සුරැකුම්පත් වල හිමිකම පිළිබඳව තොරතුරු මහ බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන මධ්‍යම තැන්පතු ක්‍රමය තුළ (Central Depositary System) අඩංගු වේ. අයෝජකයන් විසින් ආයෝජන වල මුදල් ගෙවීම, කූපන් බැර කිරීම ආදී ගනුදෙනු සඳහා ප්‍රාථමික අලෙවිකරණ ආයතනයක් තුළ හෝ ලියාපදිංචි වාණිජ බැංකුවක ගිණුමක් පවත්වාගෙන යා යුතුය. ආයෝජනයන් කල් පිරීමේදී ආයෝජනයට නියමිත පොළිය හා කල්පිරීමේදී ලැබිය යුතු මුදල මහ බැංකුව විසින් නියමිත දිනයේදී අදාල ප්‍රාථමික අලෙවිකරු වෙත බැර කරනු ලබන අතර එම ප්‍රාථමික අලෙවිකරු එදිනම එම මුදල් ආයෝජකයන්ගේ බැංකු ගිණුමට බැර කරනු ලැබේ.

**(4) ප්‍රාථමික අලෙවිකරණ පද්ධතියේ විකාශනය**

රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි අභිවෘද්ධිය ඉලක්ක කර ගනිමින් මහ බැංකුව විසින් ප්‍රාථමික අලෙවිකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරමින් සිටී. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අලෙවිකරණ පද්ධතියක් හඳුන්වා දීමට පෙර රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම පොදු වෙන්දේසි මගින් සිදු කරන ලදී. නමුත් මෙහිදී අවශ්‍ය අරමුදල් නිශ්චිතව රැස් කර ගැනීමට නොහැකි වීම නිසා ප්‍රාථමික නිකුතුවෙන් විශාල ප්‍රමාණයක් නැවත මහ බැංකුවටම මිල දී ගැනීමට සිදු විය. ඒ අනුව, ප්‍රාථමික අලෙවිකරණ පද්ධතියක් 1992දී ප්‍රථමයෙන්ම හඳුන්වා දෙන ලදී. 2000

වසරේදී ප්‍රාථමික අලෙවිකරණ කටයුතු වල පමණක්ම නිරත විය යුතු සමාගම් 8ක් පත් කරන ලදී. 2002 වසර වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු වලටද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළට සහභාගී වීමට අවස්ථාව සලසා දෙමින් ප්‍රාථමික අලෙවිකරණ පද්ධතිය පුළුල් කිරීමට කටයුතු කරන ලදී. මෙම අනුව වෙළෙඳපොළ තුළට වැඩි තරඟකාරී බවක් හා ද්‍රවශීලතාවයක් එකතු වීම මගින් ආයෝජකයන්ට රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළට පිවිසීමට ඇති හැකියාව වැඩි විය. 2017 වසරේ මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අන්තර්ජාලය මත පදනම් වූ ප්‍රාථමික නිකුත් කිරීමේ පද්ධතියක්ද (Web Based Auction System), එසේම 2023 වසරේ සිට ඒ හා සමානවම භාණ්ඩාගාර බිල්පත් සඳහාද අන්තර්ජාලය මත පදනම් වූ ප්‍රාථමික නිකුත් කිරීමේ පද්ධතියක් හඳුන්වා දෙන ලදී. තාක්ෂණිකව වැඩි දියුණු කරන ලද ප්‍රාථමික නිකුතු ක්‍රමවේදයන් හඳුන්වා දීම මගින් නිකුතු ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවෙන අතර එය ප්‍රාථමික වෙන්දේසි වල සාර්ථකත්වයට සෘජුවම බලපානු ලබයි.

2004 වසරේ සිට රාජ්‍ය සුරැකුම්පත් නිර්ලේඛනව නිකුත් කිරීම හා පියවීම සිදු කරනු ලබයි. ඒ අනුව, මධ්‍යම තැන්පතු ක්‍රමය (Central Depositary System) මගින් රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳව සියළුම වාර්තා නිර්ලේඛනව පවත්වාගෙන යනු ලබන අතර නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ ක්‍රමය (Scripless Securities Settlement System) මගින් රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු විද්‍යුත් ක්‍රමයට පියවීම් සිදු කරනු ලබයි. මෙම පද්ධති දෙක ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය ලෙස හඳුන්වනු ලැබේ. ලංකාසෙක්‍යු පද්ධතිය මගින් රජයේ සුරැකුම්පත් ආයෝජන වල සුරක්ෂිතාව උදෙසා (I) විද්‍යුත් ප්‍රකාශ (II) තත්කාලීන දැනුම්දීම් සහ (III) මාර්ගගත නිරීක්ෂණය කිරීමේ පහසුකම වැනි ආරක්ෂිත පහසුකම් කිහිපයක් සලසයි.

ප්‍රාථමික අලෙවිකරණ පද්ධතියේ කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා නව තාක්ෂණික හඳුන්වාදීම් තුළින් අලෙවිකරණ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම, ප්‍රාථමික වෙන්දේසි වලදී පිරිනමන ලද ප්‍රමාණයන් කළමනාකරණය කිරීම, ප්‍රමාණවත් මුදල් ස්වාරක්ෂකයක් (කීය ඊමෙෙර) පවත්වා ගැනීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යංශය සමඟ ක්‍රියාකාරීව කටයුතු කිරීම, 2024 අප්‍රේල් මස සිට ලංකාසෙක්‍යු මගින් නිකුත් කරන කාලීන මුද්‍රිත ප්‍රකාශන විද්‍යුත් ප්‍රකාශන බවට සම්පූර්ණයෙන් පත් කිරීම සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ වෙන් වෙන්ව සාකච්ඡා සිදු කිරීම මගින් වෙළෙඳපොළ අපේක්ෂා හඳුනා ගැනීම යන ක්‍රියාමාර්ග මෑත කාලයේදී මහ බැංකුව විසින් ගන්නා ලදී.

### (5) රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළවල ක්‍රියාකාරීත්වය

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි සිටින සක්‍රිය ප්‍රාථමික අලෙවිකරුවන් ප්‍රමාණය 10කි. එය ලියාපදිංචි වූ බලපත්‍රලාභී වාණිජ බැංකු 5කින් හා බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර සමාගම් 5කින් යුක්ත වේ (වගුව 3). මේ හැරුණු කොට සේවක අර්ථසාධක අරමුදලටද (ප්‍රාථමික අලෙවිකරුවකු නොවන ලංසු තබන්නා)[2] රජයේ සුරැකුම්පත් වෙන්දේසි සඳහා සෘජුවම සහභාගී වීමේ අවසරය හිමි වී ඇත.

**වගුව 3: සක්‍රිය ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ලැයිස්තුව**

| බැංකු ප්‍රාථමික අලෙවිකරුවන් | බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් |
|---|---|
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. | ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ් |
| මහජන බැංකුව | කැපිටල් එලයන්ස් පී. එල්. සී. |
| ලංකා බැංකුව | ෆස්ට් කැපිටල් ට්‍රෂරීස් පී. එල්. සී. |
| සම්පත් බැන්ක් පී. එල්. සී. | එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් |
| සෙලාන් බැන්ක් පී. එල්. සී. | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් |

2 වර්තමානයේ සේවක අර්ථසාධක අරමුදල රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි සඳහා සහභාගී වන සුදුසුකම්ලත් එකම ප්‍රාථමික අලෙවිකරුවකු නොවන ලංසු තබන්නා වේ.

**සංඛ්‍යා සටහන 1 - මූල්‍ය අංශයේ සමස්ත වත්කම්**

| මූල්‍ය අංශය | 2022 | | 2023 | |
|---|---|---|---|---|
| | රුපියල් බිලියන | (%) | රුපියල් බිලියන | (%) |
| **බැංකු අංශය** | **23,928.0** | **76.3** | **24,611.5** | **74.2** |
| මහ බැංකුව | 4,510.3 | 14.4 | 4,205.4 | 12.7 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 17,226.3 | 54.9 | 18,121.0 | 54.6 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 2,191.4 | 7.0 | 2,285.0 | 6.9 |
| **තැන්පතු බාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන** | **1,812.1** | **5.8** | **1,914.1** | **5.8** |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 1,610.2 | 5.1 | 1,692.0 | 5.1 |
| සමුපකාර ග්‍රාමීය බැංකු | 201.2 | 0.6 | 221.3 | 0.7 |
| සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපාකාර සමිති | 0.8 | 0.0 | 0.9 | 0.0 |
| **විශේෂිත මූල්‍ය ආයතන** | **328.9** | **1.0** | **728.7** | **2.1** |
| විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් | 1.0 | 0.0 | 1.2 | 0.0 |
| බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් | 9.9 | 0.0 | 11.7 | 0.0 |
| ප්‍රාථමික අලෙවිකරුවන් | 131.7 | 0.4 | 270.8 | 0.8 |
| කොටස් තැරැව්කරුවන් | 24.8 | 0.1 | 24.3 | 0.1 |
| ඒකක භාර/ඒකක භාර කළමනාකරණ සමාගම් | 153.5 | 0.5 | 411.6 | 1.2 |
| වෙළෙඳපොළ අතරමැදියන් | 8.0 | 0.0 | 9.1 | 0.0 |
| ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම් | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. |
| **ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන** | **5,320.3** | **16.9** | **5,945.5** | **17.9** |
| රක්ෂණ සමාගම් | 947.3 | 3.0 | 1,086.9 | 3.3 |
| සේවක අර්ථසාධක අරමුදල | 3,491.8 | 11.1 | 3,895.1 | 11.7 |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල | 465.0 | 1.5 | 520.5 | 1.6 |
| අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල | 330.4 | 1.1 | 347.2 | 1.0 |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | 85.9 | 0.3 | 95.8 | 0.3 |
| **එකතුව** | **31,389.4** | **100.0** | **33,199.8** | **100.0** |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාථමික අලෙවිකරණ ආයතනවල මෑත කාලීන ක්‍රියාකාරීත්වය ගත් විට සංඛ්‍යා සටහන 1 අනුව 2022 දී රුපියල් බිලියන 131.7ක්ව පැවති සමස්ත වත්කම් ප්‍රමාණය 2023 දී රුපියල් බිලියන 270.8 දක්වා සියයට 105.7කින් වර්ධනය විය. කෙසේ වුවද, මූල්‍ය අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය හා සසඳා බලන කළ, 2023 වසරේදී ප්‍රාථමික අලෙවිකරණ ආයතන වල සමස්ත වත්කම් ප්‍රමාණය, මූල්‍ය අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණයෙන් සියයට 0.8ක් පමණක් වේ. එය 2022 වසරේදී මූල්‍ය අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණයෙන් සියයට 0.4ක් විය. තවද 2022 දී වාර්තා කරන ලද රුපියල් බිලියන 126.1ක්වූ සමස්ත ආයෝජන කළඹ

2023දී රුපියල් බිලියන 261.9ක් ලෙස සියයට 107.7කින් වර්ධනය වී ඇත. එසේම, 2023 වසරේදී ප්‍රාථමික අලෙවිකරණ ආයතන රුපියල් බිලියන 35.8ක බදු පසු ලාභයක් වාර්තා කරන ලදී. මෙය 2022 වසරේදී රුපියල් බිලියන 1.7ක් විය. මේ අනුව, 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී ප්‍රාථමික අලෙවිකාර ආයතන රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ සැලකිය යුතු ප්‍රගතියක් ලඟා කරගෙන ඇත.

පහත සඳහන් සංඛ්‍යා සටහන 2 අනුව 2023 වසර අවසානයේදී රාජ්‍ය සුරැකුම්පත් වල හිමිකාරත්වය (Ownership) ප්‍රතිශතයක් ලෙස සලකා බැලූ විට

**සංඛ්‍යා සටහන 2 - භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල හිමිකම (වසර අවසානයේ දී) රුපියල් මිලියන**

| හිමිකරු | භාණ්ඩාගාර බිල්පත් | | භාණ්ඩාගාර බැඳුම්කර | |
|---|---|---|---|---|
| | 2023 | % | 2023 | % |
| 1. බැංකු අංශය (බලපත්‍රලාභී විශේෂිත බැංකු හැර) | 2,218,570 | 54.2 | 5,860,841 | 48.7 |
| 1.1 මහ බැංකුව | 220,797 | 5.4 | 2,522,824 (අ) | 20.9 |
| 1.2 බලපත්‍රලාභී වාණිජ බැංකු | 1,997,773 | 48.8 | 3,338,017 | 27.7 |
| 2. බැංකු නොවන අංශය | 1,735,925 | 42.4 | 5,761,309 | 47.8 |
| 2.1 බලපත්‍රලාභී විශේෂිත බැංකු | 267,540 | 6.5 | 732,023 | 6.1 |
| 2.2 බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | 79,815 | 2.0 | 21,846 | 0.2 |
| 2.3 සමාගම් (ආ) | 472,829 | 11.6 | 269,943 | 2.2 |
| 2.4 රක්ෂණ ආයතන | 104,587 | 2.6 | 389,748 | 3.2 |
| 2.5 විශ්‍රාම පාරිතෝෂික අරමුදල් (ඇ) | 569,791 | 13.9 | 3,935,635 | 32.7 |
| 2.6 රාජ්‍ය ආයතන, අරමුදල් සහ රජය සතු ව්‍යවසායයන් (ඈ) | 54,155 | 1.3 | 234,406 | 1.9 |
| 2.7 තනි පුද්ගලයින් (දේශීය) (ඉ) | 176,473 | 4.3 | 150,882 | 1.3 |
| 2.8 වෙනත් | 10,734 | 0.3 | 26,826 | 0.2 |
| 3. ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු වෙන් කිරීම් (ඊ) | 62,540 | 1.6 | 380,187(උ) | 3.2 |
| 4. අනේවාසික ආයෝජකයින් | 75,419 | 1.8 | 42,022 | 0.3 |
| **එකතුව** | **4,092,454** | **100.0** | **12,044,359** | **100.0** |

(අ) විවෘත වෙළඳ කටයුතු යටතේ 2019 සැප්තැම්බර් මස 06 දින සිට බලපවත්නා පරිදි ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වාදෙන ලදී.

(ආ) බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, මූල්‍ය කල්බදුකරණ ආයතන, පෞද්ගලික ආයතන, අන්‍යෝන්‍ය අරමුදල් යනාදියන්හි ආයෝජන ඇතුළත් වේ.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල, විශ්‍රාම වැටුප් අරමුදල්, අර්ථසාධක අරමුදල් යනාදියන්හි ආයෝජන ඇතුළත් වේ.

(ඈ) රාජ්‍ය ආයතන, රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යංශ යනාදීන්හි ආයෝජන ඇතුළත් වේ.

(ඉ) සමිති, සමාජ, සංගම් යනාදීන්හි ආයෝජන ඇතුළත් වේ.

(ඊ) පරම අයිතිකරු සොයා ගැනීමට අපහසු ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ කළ ආයෝජනයන් සඳහා වෙන් කරන ලද සුරැකුම්පත්

(උ) විවෘත වෙළඳ කටයුතු යටතේ සිදු කරන ලද ප්‍රතිමිලදීගැනුම් ගනුදෙනුවලට අදාළ ආයෝජන, අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුව හෝ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් යටතේ වෙන් කර ඇත.

2023 වසරේදී බැංකු අංශය සියයට 54.2ක් හා බැංකු නොවන අංශය සියයට 42.4ක් ලෙස භාණ්ඩාගාර බිල්පත් වල හිමිකාරත්වය දරා ඇත. භාණ්ඩාගාර බැඳුම්කර ගත් විට බැංකු අංශය 2023 වසර අවසාන වන විට සියයට 48.7ක් සහ බැංකු නොවන අංශය සියයට 47.8ක හිමිකාරත්වයක් දරා ඇත. මේ අනුව, බැංකු අංශය රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ වැඩි හිමිකාරත්වයක් දරා ඇත.

## සාරාංශය

රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ ප්‍රාථමික අලෙවිකරුවන් විසින් රජයට සහ තම ගනුදෙනුකරුවන්ට සපයනු ලබන සේවාවන් ඉතා වැදගත් කොට සැලකෙන අතර රටක ශක්තිමත් ප්‍රාථමික අලෙවිකරණ පද්ධතියක් පැවතීම මගින් සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය සහ වර්ධනය සඳහා සෘජු දායකත්වයක් ලබා දේ. විශේෂයෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ අතරමැදියෙකු ලෙස ක්‍රියා කරමින් ශක්තිමත් හා විශ්වාසදායී සුරැකුම්පත් වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට ප්‍රාථමික අලෙවිකරුවන් ක්‍රියා කරනු ලබයි.

## මූලාශ්‍ර


1. Martin, V. “Analysis of the Primary Dealers Function", JEL CLASSIFICATION: D53, O16, H63, (2023)
2. The World Bank, “Primary Dealers Systems-Background Note", (2010)
3. Speian, O. “The Role of the Primary Dealers in the Government Securities Market", Eastern European Journal of Eastern Studies, (2022)
4. www.cbsl.lk



# ශ්‍රී ලාංකේය ආර්ථික ඉතිහාසයේ සුවිශේෂී මං සලකුණු 2

# ශ්‍රී ලාංකේය වෙළෙඳ වාණිජ ඉතිහාසය අධ්‍යයනයෙහිලා පවතින පුරාවිද්‍යා මූලාශ්‍ර හා ඒවායෙන් හෙළි වන විශේෂ කරුණු පිළිබඳ මූලික හැඳින්වීමක්


**අරුණ ශාන්ත**

**කෞතුකාගාර පාලක, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව**


## හැඳින්වීම

ශ්‍රී ලාංකේය ආර්ථික ඉතිහාසයේ සුවිශේෂී මං සලකුණු ලෙසින් පල කෙරෙන ලිපි මාලාවේ දෙවන ලිපිය වන මෙහි අරමුණ වන්නේ, මෙරට වෙළෙඳ-වාණිජ ඉතිහාසය අධ්‍යයනයෙහිලා පවතින 'පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය' නැතහොත් විෂයානුබද්ධ සන්දර්භය අනුව සැලකීමේ දී 'පුරාවිද්‍යාත්මක සාධක' හැඳුන්වාදීම හා ඒවායෙන් හෙළි වන කරුණු පිළිබඳ මූලික අධ්‍යයනයක් සිදු කිරීමයි. යටත් පිරිසෙයින්, සාහිත්‍ය මූලාශ්‍රය හා සංසන්දනය කිරීමේ දී පුරාවිද්‍යාත්මක සාධක වඩාත් පුළුල් ක්ෂේත්‍රයක ව්‍යාප්තව පවතියි. නිදර්ශනයක් ලෙස, සාහිත්‍ය මූලාශ්‍රයවලින් ඓතිහාසික යුගයට අදාළ ව, නැතහොත් ක්‍රිස්තු පූර්ව අවසාන සහස්‍රකයේ අවසාන දශකයේ සිට හෝ ඉන් මෙපිටට ප්‍රස්තුතය පිළිබඳ කරුණු අනාවරණය කරනු ලැබුව ද, පුරාවිද්‍යාත්මක සාධක එහි ඉතිහාසය තවත් වසර දහස් ගණනක් දක්වා පිටුපසට රැගෙනයෑම දැක්විය හැකි ය. එමෙන් ම, සාහිත්‍ය මූලාශ්‍රයවල ආලෝකය ලැබෙන ඓතිහාසික යුගයට අදාළ ව වුව ද, වෙළෙඳ - වාණිජ ක්‍රියාවලි හා අල්පමාත්‍ර හෝ සම්බන්ධයක් දක්වන පුරා කෘති (Artifacts) හා පුරාව්‍යුහ (Structures) දහස් ගණනක් පොළොව මතුපිට මෙන් ම, පොළොව අභ්‍යන්තරයේ ද විසිර පැවතීම දැක්විය හැකි ය. ඒවා ඉතා ක්ෂුද්‍ර මට්ටමේ කාසි, පබළු බඳු පුරාකෘතිවල සිට දැවැන්ත ස්මාරකවලින් හෙබි අතීත වෙළෙඳ නගර හු දර්ශන දක්වා වූ අවකාශයක හඳුනාගත හැකි ය. එහෙයින්, සැබවින් ම පුරාවිද්‍යා මූලාශ්‍රයවල ස්වභාවය නම්, ඕනෑම ප්‍රස්තුතයකට අදාළව වුව ද නිරන්තරයෙන් නව සාධක හමුවීමට ඇති හැකියාවය. මන්දයත්, විද්‍යාත්මක ගවේෂණ හා කැණීම් ආශ්‍රිත පුරාවිද්‍යා පර්යේෂණවලින් නව දත්ත හඳුනා ගැනීම නිරන්තරයෙන් සිදුවන බැවිනි. තේමාව හා සෘජු සම්බන්ධයක් දක්වන හෙයින් මුහුදු පුරාවිද්‍යා පර්යේෂණ පිළිබඳව ද මෙහි සඳහන් කළ යුතු අතර, විශේෂයෙන් ම මුහුදු මාර්ග ඔස්සේ සිදුවුණු වෙළෙඳ වාණිජ ක්‍රියාකාරකම් පිළිබඳ නව පැතිමානයක් මෙකී අධ්‍යයනවලින් අනාවරණය කර ගැනීමට හැකිව ඇත. යටත් පිරිසෙයින් ලාංකේය සන්දර්භය තුළ වෙළෙඳ-වාණිජ ඉතිහාසය සමීක්ෂණය කිරීමෙහිලා පවතින පුරාවිද්‍යාත්මක සාධක, අධ්‍යයනයේ පහසුව සඳහා ප්‍රධාන කොටස් තුනක් යටතේ සාකච්ඡා කළ හැකි අතර ඒවා නම්. 1. අභිලේඛන (Epigraphy) 2. ද්‍රව්‍යාත්මක සංස්කෘතිය (Material culture) 3. ස්මාරක හා ක්ෂේත්‍ර (Monuments and Sites) වශයෙනි.

## අභිලේඛන


යටත් පිරිසෙයින් කවර මතුපිටක හෝ ලියන ලද ලේඛන, සරලව අභිලේඛන වශයෙන් හැඳින්විය හැකි ය. ඉතිහාසය අධ්‍යයනයෙහිලා මේවාට විශේෂ වැදගත්කමක් හිමිවනුයේ, බෙහෙවින් සමකාලීන සමාජායතනික විස්තර අන්තර්ගත ව පවතින බැවිනි. සාහිත්‍ය මූලාශ්‍රයවල එන විස්තර, පසුකාලීන රචනා හෝ සංස්කරණ වශයෙන් පැවත එන බැවින් ඒවායෙහි අන්තර්ගත කරුණු හා සාපේක්ෂ ව, අභිලේඛනවල අන්තර්ගත කරුණු නිරවද්‍යතාවයෙන් ද ඉහළ ය. මෙරට ඓතිහාසික අභිලේඛන වශයෙන් බොහෝමයක් සුරැකිව ඇත්තේ 'ශිලා ලේඛන' නොහොත් ගල් පෘෂ්ඨමත සටහන් කර ඇති ලේඛනයි. ඒවා පිහිටුවා ඇති ස්වභාවය අනුව ලෙන් ලිපි, ගිරි ලිපි, ටැම් ලිපි හා පුවරු ලිපි වශයෙන් හඳුනා ගැනේ. ආසන්න වශයෙන් ක්‍රි.පූ. 3 වන සියවසේ සිට 18වන සියවසේ අග භාගය දක්වා කාල අවකාශයට අදාළ ව සෙල් ලිපි දහස්

ගණනක් හඳුනාගෙන තිබේ. මුල් ඓතිහාසික සමයේ දී (ක්‍රි.පූ.3 - ක්‍රි.ව.2 සියවස් අතර කාල පරිච්ඡේදය) ලෙන් ලිපි සම්ප්‍රදාය වඩාත් ජනප්‍රිය ව පැවත ඇති අතර, පූර්ව බ්‍රාහ්මී අකුරුවලින් ලියවුනු මේවායේ, බොහෝවිට භික්ෂූන් උදෙසා ලෙන් පූජා කිරීම් පිළිබඳ විස්තර අන්තර්ගත ව තිබේ. ඉතා කෙටි ලිපි වන නමුදු, මේවායෙන් සංවිධානාත්මක වෙළෙඳ-වාණිජ රටාවකට අවශ්‍ය පදනම වැටුණු අවධිය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු අන්තර්ගත ව තිබේ.

මෙම ලෙන් ලිපිවල යෙදෙන 'වණිජ', 'වණිකඩ' යන පදය පිළිබඳ හඳුනාගැනීම නම්, මෙය එවකට වෙළෙඳ ප්‍රජාව හැඳින්වීම සඳහා භාවිත කළ බවයි. වවුනියාව-පෙරිය පුලියන්කුලම, කුමන-බඹරගස්තලාව, හම්බන්තොට-මණ්ඩගල ඇතුලු තවත් ස්ථාන කිහිපයකින් මෙම පදය සහිත ලිපි හමුව තිබේ. ඒ හැරුණු විට යෙදෙන 'පුග' හෝ 'පුගියන' යන්නෙන් 'ශ්‍රේණි' නොහොත් 'සමාගම්' අදහස් කරන බැවින්, වෙළෙඳාමට සම්බන්ධ පිරිස් ද මේවා නියෝජනය කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි වේ. මන්දයත්, සංස්කෘත භාෂාවේ 'පුගි' යන පදයෙන් 'වෙළෙඳ සභාව' යන්න අදහස් කෙරෙන බැවිනි. දේශිය මෙන් ම, විදේශිය සම්භවයක් සහිත පිරිස් ද මෙකල වෙළෙඳ කටයුතුවලට සම්බන්ධව සිටි බවට විරල සාධකයක් බෝවත්තේගල ලෙන් ලිපියකින් අනාවරණය වේ. එනම්, 'කාබොජ' නැතහොත් 'කාම්බෝජවරුන්' (ඉන්දීය කාෂ්මීර ප්‍රදේශ ආශ්‍රිතව විසූ පිරිස්) නියෝජනය කළ 'මහ පුගියන' නැතහොත් මහ වෙළෙඳ සභාවක් විසින් සිදු කළ ප්‍රදානයක් පිළිබඳ එහි විස්තර කර තිබීමයි. තව ද, ක්‍රිස්තු වර්ෂ උදාව අවට කාල පරිච්ඡේදයේ පවා එවක ට බටහිරදිග ඉන්දියාවේ ජනප්‍රිය වෙළෙඳ වරායක් වූ භාරුකච්ඡයට (භරුච්) යාත්‍රා කළ නාවිකයන් මෙහි විසූ බව, ගලගෙදර - හගවාලෙන ලිපියෙන් අනාවරණය වේ. එය, මෙරට වෙළෙඳ ප්‍රජාව සමකාලීන ජත්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධවූ බවට ඉඟි සපයන්නකි. සැබවින් ම මෙබඳු පොදු සමාජය හා බැඳි ආර්ථික තොරතුරු සාහිත්‍ය මූලාශ්‍රයවලින් සපයා ගැනීම දුෂ්කර වේ.

මේ හැරුණු විට සමකාලීන වශයෙන් වෙළෙඳාම හා ඍජු සම්බන්ධයක් දක්වන්නට ඇති බව පෙනී යන 'ගණක' හෙවත් ගණකාධිකාරීවරු, 'අටුකුරස' හෙවත් ගබඩාකරුවන් වැනි පිරිස් ද මෙම ලිපිවලින් අනාවරණය කරයි. එමෙන් ම, නිෂ්පාදන ක්‍රියාවලිය ඔස්සේ වෙළෙඳ-වාණිජ යාන්ත්‍රණයට සම්බන්ධ වූ මැණික්කරුවන්, රන්කරුවන්, ඇත්දත්කරුවන්, මැටිකරුවන්, පෙහෙකරුවන්, ලෝකරුවන් වැනි තවත් වෘත්තිකයන්ගේ සමකාලීන සමාජ නියෝජනය හා ඔවුන් බොහෝ විට ගම් වශයෙන් සංවිධාන වූ බවට විස්තර ද, මෙම ලිපිවල අන්තර්ගත ව ඇත. එමෙන් ම, වාණිජ ක්‍රියාවලි උදෙසා අවැසි පිළිගත් විනිමය මාධ්‍යයක භාවිතය තහවුරු කෙරෙන ලිපියක් ද, නෙළුම්දෙණිය - මාම්පිට විහාරයෙන් හමුව තිබේ. එහි





වව්නියාව තෝනිගල පුරාවිද්‍යා ක්ෂේත්‍රය හා එහි පිහිටි ගිරි ලිපියෙහි ස්පර්ෂ ලාංඡනය

මූලාශ්‍රය: ස්පර්ෂ ලාංඡනය - ***Epigraphia Zeylanica***, තෝනිගල පුරාවිද්‍යා ක්ෂේත්‍රය - (කතුවරයා විසින් ඡායාරූපගත කරන ලද්දකි)

ලෙන් කර්මාන්ත උදෙසා සමකාලීන වශයෙන් ජනප්‍රිය ව පැවති කහපණවලින් (හස් එබූ හෝ හස් යෙදූ ලෙස හඳුන්වන කාසි) ගෙවීම් සිදු කළ බව කියැවේ. තව ද, සමකාලීන ලිපිවල යෙදෙන 'රූපක' හා 'රූප දක' යන නිල දැරුවන්ගෙන්, මෙම කාසි නිශ්පාදනයේ යෙදුනු පුද්ගලයන් විස්තර කෙරෙන බවට මතයකි.

මධ්‍ය ඓතිහාසික සමය එළඹෙත් ම (දළ වශයෙන් ක්‍රි.ව. 2 - 7 සියවස් අතර කාල පරිච්ඡේදය) ගිරි ලිපි සම්ප්‍රදාය වඩාත් ජනප්‍රිය වූ බව පෙනී යන අතර, අපර බ්‍රාහ්මී අක්ෂරවලින් ලියවී ඇති මේවායේ පෙර අවධිය හා සාපේක්ෂ ව වැඩි විස්තර ප්‍රමාණයක් අන්තර්ගත ව තිබෙනු පෙනේ. ඉහත දැක්වූ ලෙන් ලිපිවල එන කරුණුවලින් ඔබ්බට, වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය වඩාත් සංවිධානාත්මක ස්වරූපයකින් ක්‍රියාත්මක වූ බවට වන තොරතුරු ඒ අතර වඩාත් කැපී පෙනේ. පළමුවන ගජබාහු (ක්‍රි.ව.114-136) රාජ්‍ය සමයට අයත් අම්බලන්තොට-ගොඩවාය සෙල්ලිපියෙන් එවක වූ 'ගොඩපවත' නැමති වරාය හා එහි අය කළ වරාය බදු පිළිබඳ කියැවේ. වසභ (ක්‍රි.ව. 67- 111) රාජ්‍ය සමයේ රචනා වී ඇති, අනුරාධපුර - පෙරිමියන්කුලම් පර්වත ලිපියෙන් ද සමකාලීන බදු ප්‍රතිපත්තිය තවදුරටත් විස්තර කෙරෙන අතර, නිෂ්පාදන සඳහා හයෙන් එකක කොටසක් රාජ්‍ය භාගය ලෙස අය කළ බව එහි සඳහන් ව තිබේ. වෙළෙඳ -වාණිජ ක්‍රියාවලිය ආශ්‍රිත තවත් පැතිකඩක් අනාවරණය කෙරෙන ගිරි ලිපියක් වශයෙන් කිත්සිරිමෙවන් (ක්‍රි.ව. 551-569) රාජ්‍ය සමයේ රචනා වූ වව්නියාව-තෝනිගල ලිපිය හැඳින්විය හැකි ය. මෙහි, එවක පැවැති ධාන්‍ය බැංකුවක් හා එහි ගිණුම්, ස්ථාවර තැන්පතු හා පොළී අනුපාත ආදිය විස්තර කර තිබේ. මෙය සමකාලීන වශයෙන් බැංකු සංකල්පය ස්ථාපිතව පැවති බව ට ඉඟි සපයන්නකි. තව ද, තෝනිගල ලිපිය 'නිගම' නමින් හැඳින් වූ ප්‍රධාන වෙළෙඳ පොළ හෝ වෙළෙඳ ගම් පිළිබඳව ද තොරතුරු සපයයි. ඒ හැරුණු විට ලබුඇටබැඳිගල හා කළුදිය පොකුණ ලිපිවල වෙළෙඳ ශ්‍රේණි සඳහා මුදල් අයෝජනය කිරීම් සම්බන්ධ විස්තර අන්තර්ගත ව තිබේ.

මධ්‍යකාලීන යුගය වන විට ටැම් ලිපි හා පුවරු ලිපි සම්ප්‍රදාය වඩාත් ජනප්‍රිය වූ ආකාරය හඳුනාගත හැකි වේ. සිව් වන උදය (ක්‍රි.ව. 946 - 954) රාජ්‍ය සමයේ රචනා වූ හෝපිටිගම ටැම් ලිපියෙන් එවක මහියංගන ප්‍රදේශයේ පැවැති වෙළෙඳපොළක ක්‍රියාකාරීත්වය හා පාලනයට අදාළව සවිස්තරාත්මක නිර්දේශ සපයා තිබෙනු පෙනේ. එහි වන වගන්ති 31ක් අතරින් කිහිපයක් පහත පරිදි ය.

13. රජය අනුමත කළ ලාහෙන් මනිණු මිස වෙනත් ලාහක් ඊට භාවිත නොකළ යුතු ය.

14. රජයේ අනුමත ප්‍රමිතියකින් යුතු තරාදි පඩි භාවිත කරනු මිස ඊට වෙනස් තරාදි පඩි භාවිතයෙන් වැලකීසිටිය යුතු ය.

15. බදු අය කළ යුත්තේ ගමට (වෙළෙඳපොළ) ගෙනවිත් විකුණන බඩුවලින් පමණි. ගම හරහා ප්‍රවාහනය කරන බඩුවලින් අයබදු නොගත යුතු ය.

16. වෙළෙඳපොළ පරීක්ෂකයින්ට නොපෙන්වා විකුණන බඩුවලින් දෙගුණයක් බදු අය කළ යුතු ය.

17. අයබදු ගෙවන බඩු නුසුදුසු තැන්වල තබා නොවිකිණිය යුතු ය.

18. නොවිකිණිය යුතු යැයි සම්මත බඩු නොවිකිණිය යුතු ය.

19. කළුමසු නමින් හැඳින්වෙන වටිනාකමින් අඩු කාසිවල වටිනාකම සම්පූර්ණ කර ගනු මිස නියමානුකූල වටිනාකමින් යුත් කාසි අවප්‍රමාණය නොකළ යුතු ය.

20. බුලත් පුවක් මැස්සක තබා විකිණිය යුතු ය.

21. නුසුදුසු තැනක යමක් විකුණනවා දුටුවහොත් රජයේ නිළධාරීන් විසින් ඒවා ඉවත් කළ යුතු ය.

මෙම වගන්ති හෝපිටිගම පදිය (වෙළෙඳපොල) සම්බන්ධයෙන් නෛතික පසුබිමක් දැරූව ද, සමකාලීන වශයෙන් මෙබඳු නීති හා සෙසු වෙළෙඳ-වාණිජ ක්‍රියාවලි සම්බන්ධයෙන් ද පැවතින්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

පළමුවන පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1153 - 1186) රජුට අයත් නයිනතිව් පුවරු ලිපිය එවක උතුරු ශ්‍රී ලංකාවේ කාර්යබහුල වරායක් ව පැවති ඌරාතොටෙහි ක්‍රියාකාරීත්වය විස්තර කරයි. ඊට අනුව ඇතැම්

භාණ්ඩ අපනයනය සම්බන්ධයෙන් ලංකාවට වෙළෙඳ ඒකාධිකාරීත්වය හිමිව ඇති අතර, වරාය වෙත සේන්දුවන නෞකා එම මුහුදු සීමාවේ දී විනාශ වුවහොත්, ඉන් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලැබිය යුතු කොටස පිළිබඳව නිර්දේශ ද ඉදිරිපත් කර තිබේ. එමෙන් ම, මෙම වකවානුවෙහි ඇතුන් හා අශ්වයන් ප්‍රති අපනයනය කෙරෙහි විශේෂ අවධානය යොමුව තිබීම විශේෂත්වයකි. මේ හැරුණුවිට මන්නාරම-මහාතිත්ත වරාය කැණීම්වලින් හමු වී ඇති පුවරු ලිපි, ත්‍රිකුණාමලය-වෙල්ගම් විහාරයෙන් හමු වී ඇති පළමු වන රාජ රාජ (ක්‍රි.ව. 947 - 1014) රජුට අයත් දෙමළ පුවරු ලිපි හා පළමුවන පරාක්‍රමබාහු රජුගේ දෙවනගල පර්වත ලිපිය ද, මෙරට සමකාලීන අන්තර්ජාතික වෙළෙඳ-වාණිජ කටයුතු පිළිබඳ වටිනා තොරතුරු සමුදායක් සපයන සෙල්ලිපි වශයෙන් සැලකිය හැකි වේ. විශේෂයෙන් ම ඒ අතර එන දෙවනගල පර්වත



පළමුවන පරාක්‍රමබාහු රජු විසින් පිහිටුවන ලද නයිනතිව් පුවරු ලිපිය. දැනට මෙය නාගදීප කෝවිල් පුස්තකාලයේ තැන්පත් කර ඇත. (කතුවරයා විසින් ඡායාරූපගත කරන ලද්දකි)

ලිපියට අනුව, එයින් ගම්වරයක් ලත් 'කිත්නුවරගල' නැමැත්තා සැලකනු ලබන්නේ, විදේශීය වෙළෙඳ කටයුතුවල දී ඇති වූ ගැටුමක් හේතුවෙන් බුරුම දේශ ආක්‍රමණය මෙහෙයවන ලද පරාක්‍රමබාහු රජුගේ ප්‍රධාන සෙන්පතියා වශයෙනි.

නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව.1187 - 1196) ගේ රාජසභා මණ්ඩප ලිපිවලට අනුව එවක රාජසභා නිලයක් ලෙස 'කඩගොෂ්ටි ඇත්තන්' හඳුන්වා ඇති අතර, එයින් සමකාලීන වෙළෙඳ ශ්‍රේණි නියෝජනය වූ බව කියැ වේ. එයින් වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය තුළ ඔවුනට හිමිව තිබූ වැදගත්කම පිළිබිඹු කරයි. දඹදෙණි රාජධානි සමයේ දෙවන පරාක්‍රමබාහු රජු (ක්‍රිව. 1236 -1270) විසින් පිහිටවනු ලැබූ දෙවිනුවර පුවරු ලිපිය මගින් ද, එහි පිහිටි වරාය හා එහි ක්‍රියාකාරීත්වය මෙන් ම පාලනය ගෙනයන නිලධාරීන් පිළිබඳවත් විස්තර සැපයේ. ගම්පොළ රාජධානි සමයේ රචනා වී ඇති ලංකාතිලක විහාරය, මඩවල හා කොටගම සෙල්ලිපි ද වෙළෙඳ -වාණිජ ඉතිහාසය හැදෑරීමේ දී අතිශය වැදගත් කරුණු රැසක් ප්‍රකට කරයි. මීට අමතර ව ගම්පොළ රාජධානි සමය අග භාගයේ (ක්‍රි.ව.1409) ලක්දිවට පැමිණි මිං රාජවංශයට අයත් යොංගල් අධිරාජ්‍යාගේ අද්මිරාල්වරයකු වූ 'ෂෙන්ග් හේ' (Zheng He) විසින් ගාල්ලේ පිහිටුවා ඇති ත්‍රෛභාෂා පුවරු ලිපිය මගින් ද මෙරට සමකාලීන වෙළෙඳ-වාණිජ ඉතිහාසයේ ජාත්‍යන්තර ප්‍රවණතා පෙන්නුම් කරයි.

## ද්‍රව්‍යාත්මක සංස්කෘතිය

මිනිසා හා බැඳි ද්‍රව්‍යාත්මක අවශේෂ මත පදනම් ව ගොඩනගා ගනු ලැබෙන ද්‍රව්‍යාත්මක සංස්කෘතිය, අතීත මිනිසා සහ ඔහු හා බැඳි සමාජායතනික පසුබිම විශ්ලේෂණය සඳහා පවතින ප්‍රධානතම ප්‍රවේශයක් ලෙස සැලකිය හැකි ය. මෙහි දී සිදුවන්නේ කේවල වශයෙන් සලකා එක් පුරාකෘති (Artifacts) හා ස්වභාව කෘති (Ecofacts) අධ්‍යයනයෙන් ඔබ්බට සමූහ වශයෙන් සලකා වර්ගීකරණය හා වර්ග අධ්‍යයනයෙන් ප්‍රශස්ත දැනුම් පද්ධතියක් ගොඩනැගීමයි. මෙකී ක්‍රියාවලියේ දී ප්‍රධාන වශයෙන් පුරාකෘතිවල නිෂ්පාදනය සඳහා යොදාගත් අමුද්‍රව්‍ය, නිෂ්පාදනය, සන්දර්භය හා කාල නීර්ණය යන කරුණු සලකා බැලේ. යටත් පිරිසෙයින් මෙලෙස අධ්‍යයනය කෙරෙන ශිලා මෙවලම්, පබළු, මැටි බඳුන්, මුද්‍රා, ලෝහ උපකරණ,

කාසි වැනි පුරා කෘති ආදියෙහි සමාන - අසමාන මාදිලි හඳුනා ගැනීමේ හැකියාව පවතින අතර, එකී සමාන-අසමානතා, සමාජායතනික හේතූන් මත පදනම් වන බවට තර්ක කළ හැකි ය. නිදර්ශනයක් ලෙස ගල් මෙවලම් වර්ගීකරණය මත පදනම් ව ප්‍රාග් ඓතිහාසික යුගය, පූර්ව ශිලා යුගය, මධ්‍ය ශිලා යුගය, නව ශිලා යුගය වශයෙන් වෙන් කර හඳුනා ගැනීම දැක්වීමට පුළුවන. එමෙන් ම පුරා කෘතිවල මාදිලි සම්බන්ධයෙන් ගොඩනැගෙන දැනුම් පද්ධතිය, එක් එක් ක්ෂේත්‍රවලින් කේවල වශයෙන් හඳුනාගනු ලබන පුරා කෘතිවලට, මාදිලි සැසඳීම ඔස්සේ සන්දර්භමය අනන්‍යතා ලබාදීමට ද භාවිත වේ. විශේෂයෙන් ම සාහිත්‍ය මූලාශ්‍රයවලින් අනාවරණය නොවන කාල පරිච්ඡේදය, නැතහොත් ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධ අධ්‍යයනවල දී ද්‍රව්‍යාත්මක සංස්කෘතිය අතිශය තීරණාත්මක සාධකයක් ලෙස සැලකිය හැකි ය.

ලෝක මෙන් ම දේශිය සන්දර්භය තුළ ද සංකීර්ණ වෙළෙඳ-වාණිජ රටාවකට අවැසි පදනම සැපයූ හුවමාරු අර්ථක්‍රමයේ පැනනැග්ම අවබෝධ කොට ගත හැකි වනුයේ ද, ද්‍රව්‍යාත්මක සංස්කෘති අධ්‍යයනය ඇසුරෙනි. ඒ අනුව මෙරට භාණ්ඩ හුවමාරුව පිළිබඳ ඉතිහාසය යටත් පිරිසෙයින් ප්‍රාග් ඓතිහාසික යුගය (දළ වශයෙන් අදින් වසර 125,000 සිට 3,000) දක්වා ඈතට විහිදයන අතර, එකල ජීවත් වූ මිනිසුන්ගේ ජනාවාස ආශ්‍රිත පුරාවිද්‍යා අධ්‍යයනවලින්, ඒවා පිහිටි භූගෝලීය කලාපයට අනන්‍යතාවක් නොදක්වන අමුද්‍රව්‍යවලින් කළ පුරා කෘති හා විස්තෘත කලාපයේ පෙන්නුම් නොකරන ස්වභාව කෘති හමුවීම, දැක්විය හැකි ය. මෙයට නිදර්ශන ලෙස වෙරළ ආශ්‍රිත ප්‍රාග් ඓතිහාසික ජනාවාස ක්ෂේත්‍රවලින් කඳුකරයට අනන්‍ය කහඳ පාෂාණයෙන් කළ ක්ෂුද්‍ර ශිලා මෙවලම් (Microlithic tools) හමුවීම හා රට අභ්‍යන්තර කඳුකර ජනාවාසවලින් මුහුදු මත්ස්‍ය අවශේෂ, මුහුදු බෙල්ලන්ගේ අවශේෂ මෙන් ම ලුණු සමග පැමිණි කවඩි ආදිය පෙන්නුම් කිරීම, දැක්විය හැකි ය. දඩයම හා ආහාර රැස් කිරීම මත පදනම් වූ බහු යැපුම්-පුළුල් ක්ෂේත්‍ර ජීවන රටාවක් ගත කළ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මිනිසුන් මෙබඳු ද්‍රව්‍ය හුවමාරුවට පුරුදුව සිටීම, ඔවුන්ගේ ජනාවාස ආශ්‍රිත කැණීම්වලින් මෙබඳු සාධක පෙන්නුම් කිරීම කෙරෙහි ඉවහල්වන බව උපකල්පනය කළ හැකි ය. බුලත්සිංහල - පාහියංගල, කුරුවිට-බටදොඹ ලෙන, අලවල-පොත්ගුල් ලෙන ආදී ක්ෂේත්‍ර මේ සඳහා නිදර්ශන ලෙස දැක්වීමට පුළුවන. ශිලා මෙවලම් හා ස්වභාව කෘති ද්‍රව්‍යාත්මක සංස්කෘති ලෙස අධ්‍යයනය කිරීමෙන් ගොඩ නැගුණු දැනුම, මෙකී හුවමාරු සබඳතා තේරුම් ගැනීම කෙරෙහි ඉවහල් ව තිබේ

පූර්ව ඓතිහාසික යුගය (දළ වශයෙන් ක්‍රි.පූ. 1300 - 600 අතර කාල පරිච්ඡේදය) නියෝජනය කරන සුසාන හා ජනාවාස ක්ෂේත්‍ර ආශ්‍රිත ද්‍රව්‍යාත්මක සංස්කෘතිය අධ්‍යයනයේ දී එකිනෙකට වෙනස් අභ්‍යන්තර භූගෝලීය කලාපවලින් ඔබ්බට, විදේශ රටවලට අනන්‍ය අමුද්‍රව්‍ය හා ඒවායෙන් කළ මෙවලම් හමුවීමෙන් සමකාලීන අවධිය වන විට හුවමාරු අර්ථ ක්‍රමය වඩාත් පුළුල් පරාසයක පැතිර පැවති බව පැහැදිලි ය. නිදර්ශනයක් ලෙස මෙම යුගය නියෝජනය කරන සුසාන භූමි කැණීමේදී විදේශිය සම්භවයක් සහිත පබළු මාදිලි හමුවීම දැක්විමට පුළුවන. ඒ අතර එන කානීලියන් පාෂාණයෙන් කළ පබළු (Carnelian stone betes) සැලකීමේ දී, ඒවාට අවශ්‍ය අමුද්‍රව්‍ය




ජේතවනාරාමයෙන් හමුවූ විදේශීය මැටි බඳුනක්

මූලාශ්‍රය : ***A catalogue of Ancient pottery from Sri Lanka***

ලංකාවට ආසන්නයෙන් ම වාර්තාවනුයේ, ඉන්දියාවේ ඩෙකෑන් ප්‍රදේශය හෝ ගුජරාටය ආශ්‍රයනි. එහෙයින් මෙම පබළුවලට අවශ්‍ය අමුද්‍රව්‍ය හෝ නිමි ආභරණ ඉන්දියාවෙන් ආනයනය කළ බව නිසැක ය. මෙම මාදිලියට අයත් පබළු ඉබ්බන්කට්ටුව, පොම්පරිප්පුව වැනි සුසාන භූමි හා අනුරාධපුර-ඇතුළුපුරය, තිස්සමහාරාම-අකුරුගොඩ නගර ගොඩැල්ල වැනි ජනාවාස ක්ෂේත්‍රවලින් හමුව ඇත.

අනුරාධපුර ඇතුළු පුරය වැනි සංස්කෘතික තැන්පතු ආශ්‍රිත ද්‍රව්‍යාත්මක සංස්කෘතිය අධ්‍යයනයේ දී, යටත් පිරිසෙයින් මුල් ඓතිහාසික සමය (දළ වශයෙන් ක්‍රි.පූ. 600 - 300 අතර කාල පරිච්ඡේදය) එළඹෙනවිට භාණ්ඩ හුවමාරුව වෙළෙඳ අර්ථ ක්‍රමය දක්වා පරිවර්තනය වෙමින් පැවති බව සිතිය හැකි සාධක හමුව තිබේ. නිදර්ශනයක් ලෙස සත්ත්ව අස්ථි පිළිබඳ අවධානය යොමු කිරීමේ දී, යථෝක්ත කාල පරිච්ඡේදය නියෝජනය කරන පාංශු ස්ථරවලින් අශ්ව දත් හමුව තිබීම දැක්විය හැකි ය. මෙරට, අශ්වයා සඳහා ජාත භූමියක් නොවන බැවින් ඔවුන් මෙහි ආනයනය කළ බැව් නිසැක ය. ගමනාගමනයට දක්වන උපයෝගීතාව හේතුවෙන් සමකාලීන ලෝකය පුරා අශ්වයා සැලකනු ලැබ ඇත්තේ, වඩාත් සුඛෝපභෝගී වෙළෙඳ භාණ්ඩයක් වශයෙනි. පර්සියන් අශ්වයන්ට ඉහළ ඉල්ලුමක් පැවති බව, සමකාලීන සාහිත්‍ය මූලාශ්‍රය ද සනාථ කරයි. එමෙන් ම, ඉහත සඳහන් කළ ස්තරයේ ම සිදු කළ කැණීම්වලින් සමකාලීන ඉන්දියාවේ භාවිත ඉතා සුඛෝපභෝගී මැටි මෙවලමක් වූ 'උත්තර උද්දීප්ත කාල වර්ණ මෙවලම්' (Northern Black Polished Ware) හමුවීම ද, විශේෂත්වයකි. මෙය බුද්ධකාලීන භාරතීය සමාජයේ භික්ෂූන්වහන්සේලා අතර අතිශය ජනප්‍රියව පැවති මෙවලමක් ලෙස හඳුනාගැනේ. ඒ හැරුණුවිට ඓතිහාසික යුගයට අදාළ ව මෙරටින් හමුවන රෝම සම්භවයක් සහිත සුදු පැහැති මැටි බඳුන් (රෝමය-ක්‍රි.ව. උදාව අවට කාලය), රුලේටඩ් මැටි බඳුන් (දකුණු ඉන්දියාව-ක්‍රි.ව. උදාව අවට), ඔප දැමූ රක්තවර්ණ මැටි බඳුන් (උතුරු ඉන්දියාව-ක්‍රි.ව. උදාව), සැසේනියානු මැටි බඳුන් (දකුණු ඉරාකය-ක්‍රි.ව. 400 - 100), මධ්‍යධරණී ප්‍රදේශය ජාත භූමිය කරගත් නිල් හා කොළ ආලේපිත මැටි බඳුන් (ක්‍රි.ව. 300 - 900), චීන මැටි බඳුන් (ක්‍රි.ව. 500 - 19වන සියවස) වැනි විදේශීය මැටි බඳුන්වලින් දිවයින ආශ්‍රිත විදේශිය වෙළෙඳාම කෙතරම් පුළුල් භූගෝලීය කලාපයක පැතිර පැවතියේ ද යන්න අවබෝධ කොට ගත හැකි ව තිබේ.




සීගිරිය - දඹුල්ල කලාපය සඳහා මැටි භාණ්ඩ වර්ගීකරණය
කාල පරිච්ඡේදයː PHP - ප්‍රෝටෝ ඓතිහාසික සමය පළමු ක්‍රි.පූ. සහශ්‍රකය. EHP - 1,EHP -2 ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව 3වන සියවස දක්වා. EHP - 3 ක්‍රි.ව. 3 වන සියවසේ සිට ක්‍රි.ව 4 - 5 සියවස දක්වා. MHP 1- 3 ක්‍රි.ව. 6 වන සියවසේ සිට ක්‍රි.ව 7 - 8 සියවස දක්වා. MHP 2- 3 ක්‍රි.ව. 7-8 වන සියවසේ සිට ක්‍රි.ව 10 සියවස දක්වා.
ක්ෂේත්‍ර නාමයː AG - අලිගල, සීගිරිය. AV - අලකොලවැව. IBB - ඉබ්බන්කටුව. IVTG - ඉහළවැව, තම්මැන්නාව. MG - මාපාගල. SG - සීගිරිය.
මූලාශ්‍රයː ***Continuities and Transformations: Studies in Sri Lankan Archaelogy and History***

යටත් පිරිසෙයින් ඓතිහාසික යුගය එළඹෙත් ම පිළිගත් විනිමය මාධ්‍යයක පැනනැග්ම, සංවිධිත වෙළෙඳ වාණිජ



ශ්‍රී ලාංකේය මධ්‍යකාලීන රන් කහවණුව
(මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව)

ක්‍රියාවලියක ආරම්භය සලකුණු කරයි. පැරණි කාසි ආශ්‍රිත ද්‍රව්‍යාත්මක සංස්කෘතිය අධ්‍යයනයේ දී යටත් පිරිසෙයින් ක්‍රි.පූ. 6වන සියවස පමණ වන විට ඉන්දියාවේ සංසරණයේ පැවති 'කහපණ' හෙවත් 'හස් එබූ' කාසි මෙරට ද භාවිතයට එක්වූ බව පෙනේ. තවත් සියවස් තුනක් හෝ හතරක් ඉක්මයාම ට මත්තෙන් මෙරට පළමු ස්වදේශීය කාසි විශේෂය ලෙස සැලකෙන 'ඇතා හා ස්වස්තික කාසි' හා එහි උපවිශේෂ බිහිවූ බව පෙනේ. එහෙත් මේ පිළිබඳ පුරාණ රෝහණය ආශ්‍රිත චිත්‍රය තරමක් වෙනස්වන අතර, එයට හේතුව වන්නේ සමකාලීන වශයෙන් විනිමය මාධ්‍යයක් ලෙස භාවිත කළ බව සිතිය හැකි පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත කාසි හෝ ටෝකන විශේෂයක් හමුව පැවතීමයි. ඇතා හා ස්වස්තික කාසි විශේෂයට පසු 'ලක්ෂ්මී තඹ තහඩු කාසි', 'සිංහ කාසි', 'වෘෂභ කාසි' මෙහි ව්‍යවහාර වූ බව පෙනේ. මෙරට පැරණි වෙළෙඳ නගර හා වරාය ආශ්‍රිත ව දේශීය මෙන් ම විදේශීය කාසි වර්ග ද හමුව තිබේ. පෙර - අපර දෙදිග යා කළ සාගර සේද මාවතේ වෙළෙඳ කටයුතු සක්‍රීයවත් ම මෙහි පැමිණි විදේශීය වෙළෙඳුන් විසින් ඔවුන්ගේ රාජ්‍යවල ව්‍යවහාර වූ කාසි මෙරට ට හඳුන්වා දෙන්නට ඇති බව විශ්වාස කෙරේ. පුරාතන යුගයේ මෙරටින් හමුවන විදේශීය කාසි අතර රෝම, ඉන්දු-රෝම, පර්සියන්, සැසේනියන්, කුෂාණ, ගුප්ත, පල්ලව, කොංගු චේර හා චෝල රාජ්‍යවලට අයත් කාසි විශේෂ වේ. එමෙන් ම, මේ හා සමගාමී ව රෝම අනුකරණ කාසි නිෂ්පාදනය ද මෙරට තුළ සිදුවූ බවට සාධක හමුව තිබේ.

ස්වදේශීය රන්කාසි නිෂ්පාදනය, මෙරට පැවති ආර්ථික ස්වයංපෝෂිතභාවය, ජාත්‍යන්තර වෙළෙඳාම හා සෘජු ව සම්බන්ධ වීම මෙන් ම, ව්‍යවහාර මුදල් ක්‍රමයේ දියුණුව ද පෙන්නුම් කරන ප්‍රබලතම සාධකයකි. මෙම කාසි පොදුවේ 'මධ්‍යකාලීන රන් කහවණු' වශයෙන් හඳුන්වනු ලැබේ. ජාත්‍යන්තර වෙළෙඳාම තුළ සක්‍රීය වූ, සමකාලීන බොහෝ පෙර-අපර දෙදිග රාජ්‍යයන් මෙබඳු රන් කාසි නිකුත් කිරීම් සිදු කර ඇති අතර, මෙරට පූර්ණ රන් කහවණුවක සාමාන්‍ය බර (ග්‍රේන්ස් 68-70) සමකාලීනව ජාත්‍යන්තර වශයෙන් ජනප්‍රියවූ 'ඕරියස් සොලිඩස්' (Aureus Solidus) නම් රෝම කාසියේ බරට පවා සමාන වෙයි. එමෙන් ම, මෙහි යෙදෙන පාඨ, පැරණි සිංහල වෙනුවට සමකාලීන පෙරදිග ලෝකයේ ජාත්‍යන්තර භාෂාව වශයෙන් සැලකෙන සංස්කෘත භාෂාව හා දේව නාගරී අක්ෂරවලින් ටංකනය කර තිබීමෙන්, මේවා සාමාන්‍ය දේශීය ව්‍යවහාරයෙන් ඔබ්බට ජාත්‍යන්තර වෙළෙඳාම අරමුණු කර නිපදවූවක් බව පැහැදිලි වේ. මධ්‍යකාලීන යුගය එළඹෙත්ම කාසි ව්‍යවහාරය ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වූ බව පෙනී යන අතර, කාසිය නිකුත් කරන ලද පාලකයාගේ නම ටංකනය කොට ව්‍යවහාරයට එක් කරන ලද මෙම කාසි පොදුවේ 'මස්ස කාසි' වශයෙන් හඳුන්වනු ලැබේ. මස්ස කාසි පොළොන්නරුව සිට කෝට්ටේ රාජධානි සමය දක්වා ව්‍යවහාරයේ පැවති බව පෙනේ. ඉන් අනතුරුව ස්වදේශීය කාසි සම්ප්‍රදායේ පිරිහීම පිළිබිඹු කෙරෙන අතර, මහනුවර රාජධානි සමයේ භාවිත රන් හා රිදී පනම් කාසි මෙන්ම රිදී කොකු කාසිවලින් අනතුරුව පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසින් විසින් හඳුන්වා දෙනු ලැබූ කාසි සම්ප්‍රදාය මෙරට තුළ ජනප්‍රිය වූ බව පෙනේ.

## ස්මාරක හා ක්ෂේත්‍ර

ඓතිහාසික වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය සමඟ සම්බන්ධ ගොඩනැගිලි ව්‍යුහ හා භූමි කලාප මේ යටතේ සලකා බලනු ලැබේ. යටත් පිරිසෙයින් යම් ස්මාරකයක් හෝ ක්ෂේත්‍රයක් එලෙස සන්දර්භගත කිරීම කෙරෙහි මතුපිට ව්‍යුහ පමණක් නොව එම ක්ෂේත්‍ර සාහිත්‍ය මූලාශ්‍රය හා දක්වන සම්බන්ධය, අභිලේඛන වේ නම් ඒවායේ අන්තර්ගත විස්තර මෙන් ම, ක්ෂේත්‍ර ආශ්‍රිත ව පෙන්නුම් කෙරෙන ද්‍රව්‍යාත්මක සංස්කෘතිය ද උපකාරී වේ. එමෙන් ම, ඇතැම් ස්ථානවලට පටබැඳී ඇති නම් හා ඓතිහාසික ජනප්‍රවාද ද, ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා හේතුවී තිබේ. නූතන ඓතිහාසික යුගය (ක්‍රි.ව 1500 පසු) නැතහොත් යුරෝපා ජාතීන්ගේ බලපෑම ලැබූ කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් සැලකීමේ දී, ප්‍රස්තුතය පිළිබඳ සැලකිය යුතු අවබෝධයක් ලබාගත හැකි අන්දමේ ක්ෂේත්‍ර හා ස්මාරක බොහොමයක් හඳුනාගත හැකි වේ. විශේෂයෙන් ම ඒ අතරින්

පෘතුගීසීන් විසින් ආරම්භ කරන ලදුව ලන්දේසීන් විසින් නිර්මාණය කොට, ඉංග්‍රීසින් විසින් වැඩිදියුණු කර පවත්වාගෙන යනු ලැබූ ගාල්ල, මාතර, කොළඹ, මන්නාරම, යාපනය, ත්‍රිකුණාමලය හා මඩකලපුව වැනි බලකොටු නගර මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකි ය. ඒවායේ වෙළෙඳ-වාණිජ ක්‍රියාවලියට සම්බන්ධ පරිපාලන ගොඩනැගිලි, වීදි-මං මාවත්, කඩ සාප්පු, බැංකු, ගුදම්, තොග ගබඩා, සේවක නිවාස, ආරක්ෂක ව්‍යුහ මෙන් ම නාවික කටයුතු සඳහා උපයෝගී වූ ජැටි, නැව් තටාංගන, දියකඩන, ප්‍රදීපාගාර වැනි ස්මාරක හඳුනාගත හැකි ය. මෑත ඉතිහාසයට අයත්වන බැවින් මෙබඳු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පමණක් නොව ඒවායෙහි පිහිටි ඇතැම් ස්මාරක පිළිබඳව වුව ද සවිස්තරාත්මක තොරතුරු හඳුනාගැනීමේ අවකාශ පවතියි. නිදර්ශනක් ලෙස ලන්දේසීන් විසින් පෙරදිග ඕලන්ද ඉන්දීය වෙළෙඳ සමාගම හරහා ගෙන ගිය වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය අධ්‍යයනයෙහිලා, පුරා ක්ෂේත්‍ර ලෙස මෙම බලකොටු නගර පෙන්නුම් කෙරන උපයෝගීතාව දැක්විය හැකි ය. එහෙත් පුරාතන යුගයට (ක්‍රි.ව. 1500 පෙර) අදාළ ව වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය සමඟ බැඳි ස්මාරක හෝ ක්ෂේත්‍ර පිළිබඳව, මේ හා සාපේක්ෂ තොරතුරු ප්‍රමාණයක් හඳුනා ගැනීම දුෂ්කර ය.

යටත් පිරිසෙයින් ඓතිහාසික යුගයට අදාළ ව මෙම තේමාව සම්බන්ධයෙන් සලකා බැලෙන වඩාත් වැදගත් ක්ෂේත්‍ර විශේෂය නම්, වෙළෙඳ වරායයි. මෑත කාලීන පුරාවිද්‍යා අධ්‍යයනවලින් හඳුනාගෙන ඇති ස්ථාන ද ඇතුළුව ආසන්න වශයෙන් පනහක් පමණ ඓතිහාසික වරාය හා තොටුපොළ සංඛ්‍යාවක් දිවයින වටා මුහුදු තීරයෙන් වාර්තා වී තිබේ. ඒ අතරින් මහාතිත්තය, දඹකොළපටුන, කොඩ්ඩියාරම, ගෝකණ්නතිත්තය, කිරින්ද, ගොඩවාය, දෙවිනුවර, මාතර, ගාල්ල, කාලතිත්තය, කොළොම්තොට හා කල්පිටිය වැනි වරාය එක් එක් කාල පරිච්ඡේදවලට අදාළව විවිධ ඓතිහාසික සන්දර්භ යටතේ වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය හා සම්බන්ධව ක්‍රියාත්මක වූ බව පෙනේ.


මේ දක්වා සැලකිය යුතු පර්යේෂණ ප්‍රමාණයක් සිදු වූ ගොඩවාය වැනි වරායක් නිදර්ශනය කොට ගෙන පැරණි වෙළෙඳ වරායක සැකැස්ම හා ක්‍රියාවලිය තේරුම් ගැනීමේ දී, යටත් පිරිසෙයින් ක්‍රි.පූ. උදාව අවට කාල පරිච්ඡේදය වන විට ද ආනයන මෙන් ම අපනයන වෙළෙඳ භාණ්ඩ රැගත් නැව් එහි සක්‍රීය වූ බවට පැහැදිලි සාධක හඳුනාගත හැකි වේ. විශේෂයෙන්



ගොඩවාය වරාය පිහිටි කලාපය
(කතුවරයා විසින් ඡායාරූපගත කරන ලද්දකි)

ම වරාය ආසන්නයේ මුහුදුබත් ව ඇති නැව්වල හා වෙළෙඳ ද්‍රව්‍යවල සුන්බුන් මේ බව සනාථ කරයි. මෙහි සමුද්‍රාසන්නයේ ද දේශීය මෙන් ම විදේශීය මැටි බඳුන් ඇතුළු පුරා කෘති හමුව තිබේ. පැරණි ගල් කණු කිහිපයක් හැරෙන්නට ක්ෂේත්‍රයේ වූ ස්ථාවර ගොඩනැගිලි පිළිබඳ ස්මාරක පෙන්නුම් නොකෙරෙන නමුදු වරාය ආශ්‍රයෙන් ක්‍රියාත්මක වූ බෞද්ධාගමික මධ්‍යස්ථානයට අයත් ස්මාරක තවදුරටත් දැකගත හැකි වේ. විශේෂයෙන් ම ක්ෂේත්‍රයේ වැඩිම උසක් සහිත ස්ථානයේ මෙම විහාරයට අයත් ස්තූපය නිර්මාණය කර ඇති අතර, එය මුහුදේ සිට ගොඩබිම නිරීක්ෂණය කරන්නෙකුට වරාය පිහිටි ස්ථානය පහසුවෙන් හඳුනා ගැනීම සඳහා එය ඉදිවන්නට ඇති බව උපකල්පනය කළ හැකි වේ. තව ද, ඉහත සඳහන් කළ ගජබාහු රජුට අයත් ගිරි ලිපිය පිහිටියේ ද මෙම විහාරස්ථානය ආසන්නයේය. බොහෝවිට මෙබඳු වරායන් භූගෝලීය වශයෙන් ස්ථානගතවීම කෙරෙහි ඊට උචිත ස්වභාවික පිහිටීම, මුහුදු රළවල හැසිරීම මෙන් ම රට අභ්‍යන්තරය හා සබඳතා ගොඩනගා ගැනීමේ පහසුව පිළිබඳව ද අවධානය යොමු කළ බව පෙනේ. විශේෂයෙන් ම ගංගා මෝය ආශ්‍රිත ව වරාය ස්ථාපිත වීම කෙරෙහි, ගංගා ආශ්‍රයෙන් වරායට අවශ්‍ය වෙළෙඳ භාණ්ඩ ලබා ගැනීම හා වරායට ලැබෙන වෙළෙඳ භාණ්ඩ බෙදා හැරීමට පවතින සහජ උපයෝගීතාව සලකා බැලෙන්නට ඇත.

ගොඩවාය වැනි වරායක් හා සාපේක්ෂ ව සංසන්දනය කිරීමේ දී මහාතිත්තයේ සැකැස්ම, වරායකට වඩා වරාය නගරයකට ඔබින්නක් බව පැහැදිලි ව හඳුනාගත හැකි ය. මෑතකාලීන විකෘති කිරීම්වලින් එහි ඓතිහාසික භූ දර්ශනයට හානිව ඇති නමුදු, මෙහි පැහැදිලි ව ම පැරණි නගර ව්‍යුහ ලක්ෂණ පෙන්නුම් කෙරෙන බව හඳුනාගත හැකි වේ. දිය අගල් හා ප්‍රාකාර බැම්වලින් වට ව පැවති මෙහි ප්‍රධාන පරිපාලන ගොඩනැගිලි කලාපය, වැව් හා නැව් තටාකාංගන බව උපකල්පනය කළ හැකි ව්‍යුහ ඇතුළු තවත් ස්මාරක මහාතිත්ත වරාය පරිශ්‍රයෙන් හඳුනාගත හැකි වේ. ඒ හැරුණුවිට දීර්ඝ කාල පරිච්ඡේදයක් පුරා මිනිසුන් එක ම භූමි කලාපයක



අතීත මහාතිත්ත වරාය පිහිටි ස්ථානයේ දැනට පෙන්නු කෙරෙන සැකැස්ම ගුවන් ඡායාරූපයක් ඇසුරෙන්
(මූලාශ්‍රය : මිනින්දෝරු දෙපාර්තමේන්තුව)



මුල්කිරිගල විහාරයේ එන තේලපත්ත ජාතක සිතුවම - 19වන සියවසේ මුල්භාගය. සමකාලීන වෙළෙඳ සලක සැකැස්ම අවබෝධ කර ගැනීම සඳහා මෙම සිතුවම මූලාශ්‍රය ලෙස භාවිත කළ හැකි වේ. (කතුවරයා විසින් ඡායාරූපගත කරන ලද්දකි)

ජීවත්වීම නිසා නිර්මාණය වන සංස්කෘතික තැන්පතු ද මෙහි පෙන්නුම් කෙරේ. මහාතිත්තය, යටත් පිරිසෙයින් වසර 1500කට ආසන්න කාල පරිච්ඡේදයක වරායක් ලෙස සක්‍රිය ව පැවතීම ඒ කෙරෙහි ඉවහල් වූ බව නිසැක ය. මෙම තැන්පතු ආශ්‍රිත ද්‍රව්‍යාත්මක සංස්කෘතිය විශ්ලේෂණය කිරීමේ දී මෙය නාගරික ජීවිතයක් ගත කළ පිරිස් සඳහා වාස භූමි වූ බවට සාධක හමුවීම, උක්ත වරාය නගර සංකල්පය සනාථ කරවන්නකි. ඒ අතර වඩාත් කැපී පෙනෙන ලක්ෂණයක් නම්, සාපේක්ෂ වශයෙන් වඩාත් සුඛෝපභෝගී මෙවලම් පරිහරණය කර තිබීමයි. ඒ අතර දේශීය මෙන් ම, විදේශයන්ගෙන් ආනයනය කරන ලැබූ මෙවලම් ද පෙන්නුම් කෙරේ.

වෙළෙඳ - වාණිජ ක්‍රියාවලිය හා ඍජු සම්බන්ධයක් දක්වන ස්මාරක හෝ ව්‍යුහ හඳුනා ගැනීම දුෂ්කර වන නමුදු, ඓතිහාසික යුගයේ ප්‍රධාන අග නගර වශයෙන් ක්‍රියාත්මක වූ අනුරාධපුරය හා මාගම මේ සම්බන්ධයෙන් වඩාත් තීරණාත්මක භූමිකාවක් නිරූපණය කළ බැව් නිසැක ය. ඒ බව සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රය ද සනාථ කරයි. විශේෂයෙන් ම, අනුරාධපුර ඇතුළු නුවර හා තිස්සමහාරාම අකුරුගොඩ ආශ්‍රිත ව සිදු කළ විද්‍යාත්මක කැණීම්වලින් මේවායේ ජීවත් වූ නාගරික ප්‍රජාව සමකාලීන වශයෙන් ජනප්‍රිය වෙළෙඳ භාණ්ඩවල ප්‍රමුඛ පරිභෝගිකයන් වූ බවට පැහැදිලි සාධක හඳුනා ගත හැකි වේ. ඔවුන් විසින් ආනයනික ආභරණ, මැටි බඳුන්, රූපලාවන්‍ය ද්‍රව්‍ය, මත්පැන් ආදිය භාවිත කොට ඇත. තව ද, එබඳු මැටි බඳුන් ආදිය නාගරාසන්න විහාරවල භික්ෂූන් උදෙසා ද පූජා කොට ඇති බව, අවට පැරණි විහාර භූමිවල කැණීම් ආශ්‍රිත ද්‍රව්‍යාත්මක සංස්කෘතිය අධ්‍යයනයෙන් අවබෝධ කොට ගත හැකි ය. එමෙන් ම, නගර ආශ්‍රිත වෙළෙඳ- වාණිජ ක්‍රියාවලියට අවැසි නිෂ්පාදන සිදු කළ වෘත්තිකයන් ද මෙහි ස්ථානගත ව සිටි බව ඔවුනට අයත් කර්මාන්ත ශාලා පිළිබඳ සාධක හමුවීමෙන් තහවුරු කර ගත හැකි ය. නිදර්ශන ලෙස තිස්සමහාරාම අකුරුගොඩ කැණීම්වලින් පැරණි නගරය තුළ පිහිටි ලෝකුරුවන්ට අයත් කර්මාන්ත ශාලවක් හඳුනා ගැනීමට හැකි වීම දැක්විය හැකි ය. මෙබඳු නිෂ්පාදන ක්ෂේත්‍රවලට අයත් සාධක නගර මෙන් ම පර්යන්ත කලාපවලින් ද වාර්තාවී ඇති අතර ඒවා ස්ථානගත වීම කෙරෙහි ආකර හෝ ගැරුම් පොළ ක්ෂේත්‍රවලට ඇති සම්බන්ධය තීරණාත්මක වූ බව පැහැදිලි ය.

තව ද, නගරවලට වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය කේන්ද්‍රගතවීම පෙන්නුම් කරන සාධකයක් නම්, කාසි නිෂ්පාදනාගාර හෙවත් ටංකන නගරික සන්දර්භවලින් පෙන්නුම් කිරීමයි. මධ්‍යකාලීන යුගය නියෝජනය කරන මෙබඳු කාසි ටංකනයක් අභයගිරි විහාර පරිශ්‍රයෙන් හඳුනාගෙන ඇති අතර, එහි රන් කාසි නිෂ්පාදනය පිළිබඳ පැහැදිලි සාධක දැකගත හැකි ය. මධ්‍යකාලීන පොළොන්නරු නගරය ද සමකාලීන වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සැලකියයුතු භූමිකාවක් නිරූපනය කළ ක්ෂේත්‍රයක් වශයෙන් සැලකිය හැකි අතර නාගරික වෙළෙඳුන් ස්ථානගතව සිටි වීදි හා කඩපිල් බවට උපකල්පනය කරන ව්‍යුහ ද, හඳුනාගෙන ඇත. එමෙන් ම, අභිලේඛන සාධක අනුව පොළොන්නරුවේ පිහිටි රාජසභා මණ්ඩප ආදිය වෙළෙඳ නියෝජනයක් පැවති ස්මාරක ලෙස සැලකිය හැකි ය. රාජධානි නිරිතදිගට විතැන්වූ පසු ද, කලින් කලට දේශපාලන බලය හිමිවූ රාජධානි සඳහා ද, වෙළෙඳ-වාණිජ ක්ෂේත්‍ර ලෙස මෙකී වැදගත්කම හිමිව තිබූ බැව් සිතිය හැකි ය. මේ හැරුණුවිට සාහිත්‍යය හා අභිලේඛන මූලාශ්‍රයවල වෙළෙඳපොළ, වීදි, ගම්, නගර, කඩවත්, බැංකු ආදිය පිළිබඳ විස්තර අන්තර්ගතව පැවතිය ද ඒවායේ භෞතික සැකැස්ම අවබෝධ කර ගැනීමට අවැසි අන්දමේ පුරාව්‍යුහ එම ස්ථානවල හඳුනා ගැනීම දුෂ්කර ය. තව ද, ඇතැම් ආගමික ස්මාරක ආශ්‍රිතව පවතින චිත්‍ර, මූර්ති හා කැටයම් ආදී ද්විතීකාංග පැරණි වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය අධ්‍යයනය සඳහා මූලාශ්‍රය කොට ගත හැකි අවස්ථා ඇත. නිදර්ශනයක් ලෙස විහාර බිතු සිතුවම්වල අතීත සිද්ධි නිරූපණයේ දී ප්‍රස්තුතය සමග සම්බන්ධ සමකාලින තත්ත්ව අන්තර්ගත ව තිබීම දැක්විය හැකි ය.

## සමාලෝචනය

ඉහත සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය කිරිමේ දී ශ්‍රී ලාංකේය වෙළෙඳ - වාණිජ ඉතිහාසය අධ්‍යයනයෙහිලා පුරාවිද්‍යා මුලාශ්‍රය ලෙස අභිලේඛන, ද්‍රව්‍යාත්මක සංස්කෘතිය මෙන් ම ස්මාරක හා ක්ෂේත්‍ර යන සාධක ඔස්සේ වඩාත් පුළුල් ක්ෂේත්‍රයක පැතිර ඇති ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මක වශයෙන් ඉතා වැදගත් තොරතුරු ප්‍රමාණයක් එක් රැස් කර ගැනීමේ හැකියාව පවතින බව පැහැදිලි ය. යටත් පිරිසෙයින් ඓතිහාසික යුග හෝ සංස්කෘතික අවධි වශයෙන් සලකා ඉතිහාසකරණයේ දී සාහිත්‍ය මුලාශ්‍රය හා පුරාවිද්‍යා මූලාශ්‍රය තුලනාත්මක විශ්ලේෂණය මේ සම්බන්ධයෙන් වඩාත් ප්‍රතිඵල සහගත ප්‍රවේශය ලෙස සැලකිය හැකි ය. නමුදු ලාංකේය සන්දර්භය තුළ, මෙම තේමාව සම්බන්ධයෙන් එකී ප්‍රවේශ ඔස්සේ සිදුව ඇති අධ්‍යයන විරල ය. එහෙයින් උක්ත ප්‍රවේශය අනුග මනයෙන් 'ශ්‍රී ලාංකේය ආර්ථික ඉතිහාසයේ සුවිශේෂී මං සලකුණු' නම් වූ මෙම ලිපි මාලව ඔස්සේ එක් එක් ඓතිහාසික අවධිවලට අදාළ ලංකේය ආර්ථික ඉතිහාසය විස්තරාත්මක ව විශ්ලේෂණය කිරීමට අපේක්ෂිත ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


කිරිබමුණේ, සිරිමා 2004. "ඉන්දියානු සාගර වෙළඳ ජාලය තුළ මහාතිත්ථ නගරයේ ක්‍රියාකාරීත්වය" පරි. සුමුදු ධර්මරත්න, **ඉඳුවර** (මහාචාර්ය ඒ.ඩී.පී. කලන්සූරිය, හර සරණිය, දයා අමරසේකර ඇතුළු පිරිස, වරකාපොළ. ආරිය ප්‍රකාශකයෝ, පිටු 191-226.

දැරණියගල, ශිරාන් 1991. **ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය**, කොළඹ: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

නිකොලොස්, සී.ඩබ්., සෙනරත් පරණවිතාන, 2004. **සංක්ෂිප්ත ලංකා ඉතිහාසය**, පරි. ඇස්. බී. හෙට්ටිආරච්චි, නුගේගොඩ: සමන් ප්‍රකාශකයෝ.

සෝමදේව, රාජ්, 2007. **රුහුණු පුරාණය**, කොළඹ: ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යාංශය.

Codrington, H.W. 1993,***Ceylon Coins and Currency***, Colombo: Department of National Museum.

***Epigraphia Zeylanica***, Vol. I, 1912. Ed. Don Martino De Zilva Wicramasinghe, London: Oxford University Press; Vol. II, 1928. Ed. Don Martino De Zilva, Wicremasinhe, London: Oxford University Press.

***Epigraphia Tamilica***, 1971. Ed. Karthigesu Indrapala, Jaffna: Jaffna Archeological Society.

***Inscriptions of Ceylon***, Vol. I, 1970. Ed.S. Paranavitana, Colombo: Department of Archeology; Vol. II, (Part.1), 1983. Ed.S. Paranavitana, Colombo: Department of Archeology.



# 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත ට අනුව මහ බැංකුවේ නූතන අරමුණු හා කාර්යභාරය


**උදේශිකා විජේගුණරත්න**
**ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ**
**සන්නිවේදන දෙපාර්තමේන්තුව**


## 1. මහ බැංකු සංකල්පය

රටක මුදල් සැපයුම හා පොලී අනුපාත තීරණය කරන ප්‍රධාන ආයතනය මහ බැංකුව යි. සාමාන්‍යයෙන් තමන්ගේ ම ව්‍යවහාර මුදල් ඒකකයක් නිකුත් කරන ඕනෑම රටක මහ බැංකුවක් ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, ලොව පවත්නා රටවල් 195ක් අතරින්, ඇන්ඩෝරාව, මාෂල් දූපත්, පැනමාව, මෛක්‍රොනීසියාව, මොනැකෝ, නාවුරු වැනි රටවල් අතලොස්සක පමණ මහ බැංකුවක් ක්‍රියාත්මක නොවේ. මහ බැංකුව, සංචිත බැංකුව, මූල්‍ය අධිකාරිය, ජාතික බැංකුව යනාදි විවිධ නාමයන් මහ බැංකු සංකල්පය හැඳින්වීම සඳහා විවිධ රටවල් භාවිතා කරයි. මහ බැංකු ස්වාධීන ව ක්‍රියාත්මක වන අතර එමගින් මහ බැංකු ක්‍රියාවන් සහ ප්‍රතිපත්ති සම්පාදන තීරණ කෙරෙහි සිදු විය හැකි අනිසි බලපෑම් වළක්වා ගත හැකියි.

## 2. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉතිහාසය සහ පිහිටුවීම

1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ බහුවිධ අරමුණු සහිත ව අර්ධ ස්වාධීන ආයතනයක් ලෙස පිහිට වූ "ලංකා මහ බැංකුව", මෙරට මූල්‍ය අධිකාරිත්වය දැරූ එකම ආයතනයයි.

1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර අප රටේ ක්‍රියාත්මක වූයේ 1884 අංක 32 දරන කඩදාසි මුදල් ආඥා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවහාර මුදල් මණ්ඩල පද්ධතියකි.

නිදහසින් අනතුරුව සංවර්ධනය වෙමින් පැවති ලංකාව වැනි රටකට මහ බැංකුවක අවශ්‍යතාව තදින්ම දැනී තිබුණේ කඩදාසි මුදල් ආඥා පනත සංවර්ධන අවශ්‍යතාවන් සඳහා ප්‍රමාණවත් නොවූ බැවිනි. ඒ නමුත් එකී අවශ්‍යතාව යථාර්ථයක් බවට පත්කර ගැනීම වෙනුවෙන් ප්‍රමාණවත් දැනුම අප රට සතුව නොමැති වූ නිසා මෙරට මහ බැංකුවක් පිහිටුවීම සඳහා ඒ පිළිබඳ විශේෂඥ දැනුම ලබා දීම පිණිස, එවකට ඇමරිකා එක්සත් ජනපදයේ මහ බැංකුව වන ෆෙඩරල් සංචිත ක්‍රමයේ ආර්ථික විශේෂඥයෙක් වන ජෝන් එක්ස්ටර් මහතා ලංකාවට පැමිණෙන්නේ, මෙරට ආණ්ඩුව විසින් සිදු කළ ඉල්ලීමකට අනුවයි..

1949 අග භාගයේ දී ඔහු විසින් ලංකාව වෙනුවෙන් මහ බැංකුවක් පිහිටුවීමේ අවශ්‍යතාව සහ එහි නීතිමය පදනම පිළිබඳ පැහැදිලි විස්තරයක් සහිතව වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව පසුකාලීනව "එක්ස්ටර් වාර්තාව" ලෙසින්, මෙකී ආර්ථික විශේෂඥයාගේ නමින් ම හඳුන්වා ඇත. මෙම වාර්තාව ලංකාණ්ඩුව වෙත ඉදිරිපත් කිරීමේදී එහි ඇමුණුමක් ලෙසට මුදල් නීති පනත් කෙටුම්පත එක් කර ඇත. මහ බැංකුව පිහිටුවීමේ මූලික නීතිමය රාමුව වන 1949 අංක 58 දරන මුදල් නීති පනත මෙලෙසින් බලාත්මක විය.

මුදල් නීති පනත යටතේ 1950 අගෝස්තු මස 28 වන දින මෙම ආයතනය පිහිටුවීමේ දී එහි නාමය "ලංකා මහ බැංකුව" ලෙස හැඳින්වුව ද, පසු කාලීනව 1985 දී "ශ්‍රී ලංකා මහ බැංකුව" ලෙසින් නැවත නම් කරන

ලදි. මුදල් නීති පනත අනුව මූලිකවම මහ බැංකුවේ ප්‍රධාන අරමුණු බහුවිධ අරමුණු ලෙස හැඳින්වූ අතර, ඒවා පොදුවේ සංවර්ධන අරමුණු සහ ස්ථායී අරමුණු වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ හඳුනා ගැනිණි. මහ බැංකුකරණයේ සිදු වූ නව ප්‍රවණතා සහ කාලීන අවශ්‍යතා අනුව 2002 වසරේ අග භාගයේ දී මුදල් නීති පනත සංශෝධනය කරන ලදි. එම සංශෝධනයන්ට අනුව ආර්ථික සහ මිල ස්ථායිතාව පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගැනීම යනුවෙන් මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙකක් විය.

### 3. ශ්‍රී ලංකා මහ බැංකුව නීතිමය පෞරුෂයක් සහිත ආයතනයක් බවට පත්වීම

1949 සිට 2023 දක්වා වූ පසුගිය වසර 74ක කාල පරිච්ඡේදය සැලකිල්ලට ගත්විට, කාලීන ආර්ථික ප්‍රවණතා සහ මහ බැංකුකරණයේ විකාශනය හමුවේ, මුදල් නීති පනතට ජාත්‍යන්තර ව පිළිගත් සම්මතයන්ට අනුකූල වූ සංශෝධන කීපයක් ඇතුළත් කරමින් නීති සමාලෝචනයක් සිදුකිරීමේ අවශ්‍යතාව මහ බැංකුවට පැවතිණි. 2023 වසරේ දී මහ බැංකුවේ නීතිමය රාමුවට සුවිශේෂී වෙනසක් සිදු වූයේ මෙකී අවශ්‍යතාව මතයි.


රටේ මිල ස්ථායීතාව තහවුරු කිරීමේ මූලික අරමුණ ඇතිව මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීමත්, විනිවිදභාවය හා වගවීම උසස් කිරීමත් සහ මුදල් ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීමත් උදෙසා අවශ්‍ය ප්‍රතිපාදන ඇතුළත් කරමින් 2023 සැප්තැම්බර් මස 15 දා "2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත" සම්මත විය.

### 4. මහ බැංකුවේ පාලන ව්‍යුහය

මුදල් නීති පනතට අනුව මහ බැංකුවේ සියලු ම ප්‍රතිපත්තිමය තීරණ ගැනීම් ඇතුළු ව පාලන කටයුතුවල වගකීම පැවරී තිබුණේ මුදල් මණ්ඩලයටයි. මෙම මුදල් මණ්ඩලය සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත වූ අතර, මහ බැංකු අධිපතිතුමා මුදල් මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කළේ ය. මුදල් මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් ලෙස විධායක නොවන, පත්කළ සාමාජිකයන් තිදෙනාට අමතර ව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ද නිල බලයෙන් සම්බන්ධ විය.

නව පනතෙන් මහ බැංකුවේ ස්වාධීනත්වය කෙරෙහි නිරන්තරයෙන් ම අවධානය යොමු කර ඇති බවට තවත් සාක්ෂියක් ලෙසට එහි පාලන ව්‍යුහයට එක්කර ඇති වෙනස්වීම් දැක්විය හැකියි. මෙහි දී පහත රූප සටහනෙන් දැක්වෙන පරිදි පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වශයෙන් සමාන්තර තීරණ

**රූප සටහන 1: මහ බැංකු පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය සහ සංවිධානය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව - 2022

ගැනීමේ බලතල සහිත මණ්ඩල දෙකකින් මහ බැංකුවේ පාලන කටයුතු මෙහෙයවනු ලබයි. මහ බැංකුවේ අධිපතිතුමා ඒවායෙහි ප්‍රධාන විධායක නිලධාරියා ද වේ.

## 5. අරමුණුවල විකාශනය

මූලාරම්භයේ දී තිබූ බහුවිධ අරමුණු 2002 සංශෝධනයට අනුව සමාන වැදගත්කමකින් යුතු ප්‍රධාන අරමුණු දෙකකට ගොනු වූ අතර නව පනත ට අනුව මෙය තවත් ඉලක්කගත වෙමින් ප්‍රධාන අරමුණු එකක ට කේන්ද්‍රගත වන ලදී. ඒ අනුව **දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත්කර ගැනීම සහ පවත්වාගෙන යෑම** ශ්‍රී ලංකා මහ බැංකුවේ **ප්‍රධාන අරමුණ** ලෙස සැලකේ. නව පනතෙහි 6 වන වගන්තියෙහි සඳහන් වන ආකාරයට මහ බැංකුවේ අනෙක් අරමුණ විය යුතු ලෙසට දැක්වෙන්නේ මූල්‍ය පද්ධති ස්ථායිතාව සුරක්ෂිත කිරීම ය. මෙකී අරමුණ ට ළඟා වීමේ දී පිළිවෙළින් ආර්ථිකයේ විභව්‍ය මට්ටම දෙසට නිමවුම ස්ථායීකරණය කිරීමත් මූල්‍ය පද්ධතියේ සංවර්ධනය සහ කාර්යක්ෂමතාව ඇති කිරීමත් කෙරෙහි සැලකිල්ල යොමු කර තිබේ.

ප්‍රධාන අරමුණ වන දේශීය මිල ස්ථායීතාව තුළින් අපේක්ෂා කෙරෙන්නේ ආර්ථිකයේ උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමයි. ජනතාවගේ ඉදිරි උද්ධමන අපේක්ෂාවන් නිරන්තරයෙන් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට ඍජු ව දායක වේ. ආර්ථිකයක උද්ධමනය අඩු වන විට මෙන් ම අනාගතයේ ද එය අඩු මට්ටමක පවතිනු ඇතැයි ජනතාව අපේක්ෂා කරන විට ආර්ථික ක්‍රියාකාරකම් යහපත්ව සිදු වේ. මෙම අඩු සහ ස්ථායී උද්ධමනය ක් පවතින විට එය ආර්ථිකයේ පොළී අනුපාත නිතර වෙනස්වීම්වලට ලක් නොවී ස්ථායී මට්ටමක පවත්වා ගැනීමට උපකාරී වේ.

නව මහ බැංකු පනතෙන් දක්වා ඇති මෙම ප්‍රධාන අරමුණ මෙන් ම අනෙක් අරමුණ වන මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ළඟා කර ගැනීම යන අවශ්‍යතාවන් දෙක ම සැලකිල්ලට ගැනීමේ දී යම්කිසි අවස්ථාවක එක් අංශයක ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් අනෙක් අංශය කෙරෙහි ඍණාත්මක ව බලපායි නම්, එමෙන් ම කවර අංශයක් වෙත වැඩි අවධානයක් යොමු කළ යුතුදැයි මහ බැංකුවට තීරණය කළ යුතු වන දුලබ මොහොතක දී, ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් මේ අවශ්‍යතාවන් දෙක ම පෙර තත්ත්වයේ දී මෙන් සමාන වටිනාකමක් සහිත ව පිළිනොගනු ඇත. ඒ අනුව නව පනතෙන් ලබා දී ඇති ප්‍රමුඛතාව අනුව යමින් සෑම විට ම සිය ප්‍රධාන අරමුණ වන දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම කෙරෙහි නිරන්තර අවධානය යොමුකරනු ඇත.

## 6. මහ බැංකුවේ ස්වාධීනතාව, වගවීම විනිවිදභාවය සහ කාර්යයන්

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත ඔස්සේ සිදු කළ මූලිකම වෙනස්කම් අතර ප්‍රධාන තැනක් ගන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනතාව, වගවීම සහ විනිවිදභාවය වෙනුවෙන් හඳුන්වා දී ඇති නව ප්‍රතිපාදනයන් වේ.

ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්බන්ධව වගකියන මණ්ඩලවලට ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේදී අනිසි බලපෑම් වළක්වා ගැනීම සඳහා මහ බැංකුවේ ස්වාධීනත්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබේ. වෘත්තීයමය අදහසක් හෝ උපදෙසක් හැරුණු විට, මහ බැංකුව කිසියම් බාහිර පාර්ශ්වයන්ගෙන් උපදෙස් ලබා ගැනීමෙන් වලක්වා ඇත. ඒ අනුව මූලිකවම මහ බැංකුවේ පාලන ව්‍යුහය ගත්කල, පෙර පැවැති මුදල් මණ්ඩලයට සාපේක්ෂව, එහි නව පාලක මණ්ඩලය ට හෝ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ සහභාගීත්වයක් නොමැතිවීමත්, රාජ්‍ය වියදම් මූල්‍යයන කටයුතු වෙනුවෙන් මහ බැංකුවෙන් සෘජුව හෝ වක්‍රව රජයට ණය ලබා ගැනීමට සීමාවන් පැණවීමත්, රජය වෙනුවෙන් මහ බැංකුව විසින් සෘජු තාවකාලික අත්තිකාරම් ලබාදීම සම්බන්ධයෙන් සීමාවන් පැණවීමත්, රජය විසින් හෝ රජයට අයත් ආයතනයක් හෝ වෙනත් පොදු ආයතනයක් විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොලෙන් මිලදී ගැනීමට අදාළ සීමාවන් පැණවීමත් මහ බැංකුවේ ස්වාධීනතාවය අරමුණු කර ගනිමින් ගෙන ඇති ප්‍රධාන තීරණ ලෙසට හඳුනා ගත හැක.

මහ බැංකුවේ වගවීම සහ විනිවිදභාවය, නව පනත ඔස්සේ විවිධ ස්වරූපයන්ගෙන් තහවුරු කර තිබේ. ඒ අනුව සෑම මාස 6 කට වරක් එහි ප්‍රධාන අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක කරන මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මහජනතාව වෙත හෙළිදරව් කිරීමට ත්, මහබැංකු අධිපති, සියලුම පත්කළ සාමාජිකයන් සහ නියෝජ්‍ය අධිපතිවරුන් සෑම මාස 4කට වරක් පාර්ලිමේන්තුව විසින් කැඳවනු ලැබීමට ත් බැඳී සිටී. පෙර මූල්‍ය වර්ෂයේ

ආර්ථිකයේ තත්ත්වය පිළිබඳ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්තාව ක් සෑම මූල්‍ය වර්ෂයක්ම අවසන් වී මාස හතරක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට අධිපතිවරයා සහතික වෙයි. සිය ප්‍රතිපත්තිමය කටයුතු සම්බන්ධයෙන් වන විනිවිදභාවය වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායිතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීමට සහ තොරතුරු හුවමාරු කර ගැනීමට මෙන්ම අදහස් හුවමාරු කර ගැනීමට මහබැංකු අධිපති සහ මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් සමන්විතව සම්බන්ධීකරණ සභාව ක් ද පිහිටුවා ඇත. මහ බැංකුවේ ගිණුම් විගණකාධිපති විසින් විගණනය කරනු ලබන අතර, අභ්‍යන්තර විගණන කටයුතුවල මූලිකත්වය දැරීම වෙනුවෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙක් පත්කිරීම ද නව පනතේ අවශ්‍යතාවන් මත සිදු කර තිබේ.

නව පනත ට අනුව මුලින් විස්තර කළ ප්‍රධාන අරමුණ ත් අනෙක් අරමුණ ත් ළඟා කරගැනීම උදෙසා කටයුතු කිරීමේ දී, මේ ආකාරයෙන් ස්වාධීනතාව, වගවීම සහ විනිවිදභාවය තහවුරු කරනු පිණිස ශ්‍රී ලංකා මහ බැංකුවේ බලතල, කාර්යය, සහ කර්තව්‍යයන් නව මහ බැංකු පනතෙහි 7 වන වගන්තියෙහි පැහැදිලිව දක්වා තිබේ. ඒ අනුව ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ කාර්යයන් 15ක් පහත පරිදි පෙළගැස්විය හැකියි.

### 6.1. මුදල් ප්‍රතිපත්තිය නිර්ණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන දේශීය මිල ස්ථායීතාවය අත්කර ගැනීම සහ පවත්වාගෙන යෑම වෙනුවෙන් මහ බැංකුව විසින් ආර්ථිකය තුළ ප්‍රධාන සංරචක දෙකකට, එනම් මුදලේ පිරිවැය හෙවත් පොළී අනුපාත කෙරෙහි සහ මුදල් සැපයුම හෙවත් ද්‍රවශීලතාව කෙරෙහි බලපෑම් සිදුකරනු ලබන ක්‍රියාවලිය මුදල් ප්‍රතිපත්තියයි. රටේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ නෛතික බලය සහ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මෙහෙයුම් කටයුතු හරහා ආර්ථිකයේ පොළී අනුපාතික පිළිබඳ ව ගනු ලබන තීරණ ඔස්සේ ආර්ථිකයේ ණය ගැතියන් සහ ණය හිමියන්ගේ හැසිරීමට ද, සාර්ව ආර්ථික කටයුතු කෙරෙහි ද, අවසාන වශයෙන් උද්ධමන අනුපාතිකය කෙරෙහි ද බලපෑම් කරනු ලබයි.

මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස "නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක්" අනුගමනය කරයි. මෙහි දී මහ බැංකුව උද්ධමනය පුරෝකතනය කර ඉලක්කගත උද්ධමන අනුපාතිකයක් ප්‍රකාශයට පත්කරනු ලබයි. අනතුරුව මෙකී ඉලක්කගත උද්ධමනය වෙත ළඟාවීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මහ බැංකුව විසින් ළඟා කරගත යුතු උද්ධමන ඉලක්කය දැක්වෙන මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමක් මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය විසින් අත්සන් කළ යුතු වේ. මුදල් අමාත්‍යාංශය විසින් මෙම ගිවිසුම ගිවිසුම්ගත දින සිට සතියක කාලසීමාවක් තුළ ගැසට් පත්‍රයේ පළ කරනු ලබයි. එමෙන් ම නව පනත අනුව මහ බැංකුව විසින් උද්ධමනයේ මෑත කාලීන සංචලනයන්, උද්ධමනයේ ප්‍රභවයන් සහ උද්ධමනය පිළිබඳ මධ්‍යකාලීන ප්‍රක්ෂේපණ සහ ඒ ප්‍රක්ෂේපණ කෙරෙහි වන ප්‍රධාන අවදානම් විස්තර කරමින් මාස හයකට වරක් "මුදල් ප්‍රතිපත්ති වාර්තාව" නමින් වාර්තාවක් ප්‍රකාශයට පත් කරනු ලබයි. මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය එක්ව ගිවිසුම්ගත වූ උද්ධමන ඉලක්කය අනුක්‍රමික කාර්තු දෙකක දී සාක්ෂාත් කරගැනීමට අපොහොසත් වුවහොත්, මහ බැංකුව විසින් අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. මෙකී වාර්තාව තුළ ඉලක්කගත උද්ධමනය සපුරා ගැනීමට අසමත් වීමට හේතු, මහ බැංකුව විසින් ගැනීමට නියමිත ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග, සහ උද්ධමන ඉලක්කය සපුරා ගත යුතු කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් සඳහන් කළ යුතු වේ.

### 6.2. විනිමය අනුපාත ප්‍රතිපත්තිය තීරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ජංගම සහ ප්‍රාග්ධන ගනුදෙනු ප්‍රවර්ධනය හා නියාමනය කිරීම, විදේශ විනිමය කළමනාකරණය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග/නියම/විධාන සැකසීම, අවශ්‍ය වූ විට සහ අවශ්‍ය වන පරිදි මෙකී නියෝග/නියම/විධාන ප්‍රතිශෝධනය කිරීම, විදේශ විනිමය නියෝග/විධාන පිළිබඳ මහජනතාව/පාර්ශ්වකරුවන්ගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම, විදේශ මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා අවසර දීම, බලයලත් වෙළෙඳුන් විසින් සහ පරිසීමිත වෙළෙඳුන් වාර්තා කරන ලද විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය කිරීම සහ එම තොරතුරු විශ්ලේෂණය කිරීම

මගින් දිනපතා/මාස්පතා සහ කාර්තුමය වශයෙන් වාර්තා පිළියෙල කිරීම, විදේශ විනිමය පනත ප්‍රකාර ව අනුකූල නොවීම පිළිබඳ ව විමර්ශන පැවැත්වීම, වත්මන් නියෝග, නියම සහ විධාන යටතේ ආවරණය නොවන අවස්ථා සඳහා විශේෂ අවසර නිකුත් කිරීම මේ කාර්යය යටතේ මහ බැංකුවේ කාර්යභාරය වශයෙන් හඳුනාගත හැකියි.

විදේශ විනිමය වෙන්දේසි පැවැත්වීම මගින්, ව්‍යුත්පන්න ගනුදෙනු සිදුකිරීම මගින්, ඍජු ගනුදෙනු සිදුකිරීම මගින් හෝ පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් යම් පිළිගත හැකි ක්‍රම මගින් මහ බැංකුවට විදේශ විනිමය මෙහෙයුම් කටයුතුවල නිරත විය හැකියි. මහ බැංකු පනත මගින් මහ බැංකුවට මෙකී විදේශ විනිමය මෙහෙයුම් කටයුතු සිදු කළ හැකි බලයලත් පාර්ශ්වයන් කවුරුන්ද යන්න පැහැදිලි ව දක්වා තිබේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකු, ආණ්ඩුව සමග යම් ලිඛිත නීතියක් හෝ අන්‍යාකාරයකින් පිහිටුවා ආණ්ඩුව වෙනුවෙන් කටයුතු කෙරෙන යම් නියෝජිතායතන, විදේශීය වාණිජ හා ආයෝජන බැංකු, විදේශීය මහ බැංකු, ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ විදේශීය ආණ්ඩු, විදේශීය පළාත් ආණ්ඩු, සහ විදේශීය ආණ්ඩු වෙනුවෙන් කටයුතු කරන නියෝජ්‍යායතන හෝ ආයතන මේ බලයලත් පාර්ශ්වයන් අතර වේ.

### 6.3. ශ්‍රී ලංකාවේ නිල ජාත්‍යන්තර සංචිත පවත්වාගෙන යෑම සහ ඒ සංචිතවල විචක්ෂණශීලී සහ ඵලදායී කළමනාකරණය සහතික කිරීම.

ප්‍රමාණවත් ද්‍රවශීලතාව, සුරක්ෂිතභාවය සහ ප්‍රතිලාභ අරමුණු සහතික කරමින් සහ ස්ථාපනය කරන ලද උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ රාමුවට අනුකූල වෙමින් විචක්ෂණශීලී ව සහ ඵලදායී ලෙස මහ බැංකුව විසින් නිල විනිමය සංචිත කළමනාකරණය කෙරේ. සංචිත කළමනාකරණයට අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ, විදේශ මුදල් වෙළෙඳපොළ උපකරණවල ආයෝජනය, විදේශ ස්ථාවර ආදායම් උපකරණවල ආයෝජනය සහ වෙළෙඳාම, හරස් මුදල් ගනුදෙනු සහ රත්රන් සඳහා ආයෝජනය, සුරැකුම්පත් ණයට දීම, නැවත මිලදී ගැනීම සහ ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු, විදේශ විනිමය හුවමාරු සහ විදේශ විනිමය ඉදිරි වෙළෙඳපොළ ගනුදෙනු, දැනුවත් සහ අනාගත විදේශ විනිමය වගකීම් සපුරාලීම සඳහා ද්‍රවශීල විදේශ මුදල් වත්කම් තබාගනිමින් ද්‍රවශීලතාවය පවත්වා ගැනීම සහ රජය වෙනුවෙන්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ නමින් ඇති ගිණුමෙහි අරමුදල් කළමනාකරණය කිරීමයි.

විදේශ විනිමය සංචිත කළමනාකරණයේ කාර්ය සාධනය නිතිපතා අධීක්ෂණය කෙරෙන අතර කාලානුරූපී ව ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකරණයට වාර්තා කිරීම ද සිදු කෙරේ. මීට අමතර ව බලපත්‍රලාභී බැංකු සහ බලයලත් මුදල් හුවමාරුකරුවන්ගේ විදේශ විනිමය මෙහෙයුම් අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම තුළින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි, විධිමත් හා සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම ද ණය නොවන මූලාශ්‍රය හරහා විදේශ විනිමය සංචිත ගොඩ නැගීම ද නිල සංචිත කළමනාකරණය යටතේ මහ බැංකුවේ කාර්යභාරයට යටත් වේ.

### 6.4. ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය කිරීම.

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල ශ්‍රී ලංකා රුපියලයි. මහ බැංකු පනත ප්‍රකාර ව ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය සහ අධිකාරී බලය පවතින්නේ මහ බැංකුව සතුවයි. ව්‍යවහාර මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා සහ කාසි ටංකනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සිටින වෙනත් පාර්ශ්වයක් සමග ගිවිසුම්වලට ඇතුළත් වීමට මහ බැංකුවට අධිකාරී බලය තිබේ.

ශ්‍රී ලංකාව තුළ මහජන ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් පරිදි සහ ගුණාත්මකභාවයෙන් යුත් වලංගු මුදල් පවතින බව ශ්‍රී ලංකා මහ බැංකුව තහවුරු කරන අතර ව්‍යාජ මුදල් නෝට්ටු සැකසීම වැළැක්වීම සඳහා ද කටයුතු කරයි. සංසරණය සඳහා කවර හෝ හේතුවක් නිසා යෝග්‍ය නොවන සියලු ම ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි, මහ බැංකුව විසින් සංසරණයෙන් ඉවත්කර අවලංගු කිරීම සිදු කෙරෙයි. විශේෂ පුද්ගලයෙක් හෝ සිදුවීමක් සනිටුහන් කිරීම අවශ්‍ය වූ අවස්ථාවල දී සමරු නෝට්ටු/කාසි නිකුත් කිරීම මුදල් අමාත්‍යවරයාගේ ද අනුමතය සහිත ව සිදුකරයි.

එසේ ම මුදල් නෝට්ටුවල ආරක්ෂිත සළකුණු සහ මුදල් නෝට්ටු හා කාසි නිසි ලෙස භාවිතය පිළිබඳ මහජනතාවගේ දැනුම වැඩි දියුණු කිරීම ද මේ යටතේ

මහ බැංකුව විසින් සිදුකරනු ලබන තවත් කාර්යයකි. පාලක මණ්ඩලයේ අධිකාරී බලයක් නොමැතිව ව්‍යවහාර මුදල් නෝට්ටු අවලක්ෂණ කිරීම හෝ විකෘති කිරීම මෙන්ම වලංගු මුදලක් වශයෙන් නොවන වෙනත් ආකාරයකින් ව්‍යවහාර මුදල් කාසි භාවිත කිරීම වරදක් බවට පනතෙහි 55වන වගන්තියේ පැහැදිලි ව දක්වා තිබේ. එසේ ම නව පනත යටතේ හඳුනාගත් යම් වරදකට යම් තැනැත්තෙක් වරදකරුවෙකු වේ නම් ඒ සම්බන්ධයෙන් වන දඬුවම් ද පැහැදිලි ව එහි 111වන වගන්තියේ දක්වා තිබේ.

### 6.5. ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සහ එවැනි ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව, සඵලදායීබව සහ කාර්යක්ෂමතාව තහවුරු කිරීම.

මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ මහ බැංකුව සමග පියවීමේ ගිණුමක් පවත්වාගෙන යනු ලබන සහ මහ බැංකුව විසින් ඒ පද්ධතිය සඳහා සහභාගීකරුවන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන වෙනත් යම් ආයතන හෝ තැනැත්තන් විසින් සහ ඔවුනොවුන් අතර අරමුදල් පැවරීම සඳහා මෙන් ම සහතික රහිත සුරැකුම්පත් පැවරීම සහ පියවීම සඳහා පද්ධති පිහිටුවීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මහ බැංකු පනතෙහි 59වන වගන්තිය යටතේ බලය පවරා තිබේ.

2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ හෝ ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති නියාමනය කිරීමට ඒවාට බලපත්‍ර ලබාදී ලියාපදිංචි කිරීමට සහ අධීක්ෂණය කිරීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක වැඩිදුරටත් නිශ්චිත ව දක්වා ඇති පරිදි, ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති නියාමනය කිරීම, ඒවාට බලපත්‍ර ලබාදීම, ලියාපදිංචි කිරීම, සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව වගකියනු ලබයි. ඒ අනුව ලංකා සෙට්ල් පද්ධතිය ක්‍රියාත්මක කිරීම, ගෙවීම් සහ සේවා හා නිෂ්පාදන නියාමනය කිරීම, හා දේශීය ගෙවීම් හා පියවීම් පද්ධතිය අධීක්ෂණය කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ.

### 6.6. මූල්‍ය ආයතන ලියාපදිංචි කිරීම, බලපත්‍රගත කිරීම, නියාමනය සහ අධීක්ෂණය කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණ අධිකාරි බලය විස්තරාත්මක ව ඉදිරිපත් කර ඇත්තේ මහ බැංකු පනතේ 61වන වගන්තිය හරහායි. ඒ අනුව මූල්‍ය ආයතන නියාමනය කිරීම, ඒවාට බලපත්‍ර ලබාදීම, ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා මහ බැංකුව අනන්‍ය ව වගකියනු ලැබේ.

මෙහිලා එක් එක් පරීක්ෂා කිරීමේ කාලසීමාවන් තුළ දී යටත් පිරිසෙන් එක් වරක්වත් මූල්‍ය ආයතනවල පොත් සහ ගිණුම් පරීක්ෂා කිරීමට සහ අවශ්‍ය අවස්ථාවන්හි දී වැඩිදුර පරීක්ෂා කිරීම් සිදු කිරීමට මහ බැංකුවට බලය තිබේ. මෙසේ රැස් කර ගන්නා තොරතුරු සහ දත්ත අවශ්‍යතාව අනුව වෙනත් මූල්‍ය ආයතන අධීක්ෂණයටත්, මූල්‍ය වෙළෙඳපොළ අධීක්ෂණයටත්, සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති භාවිතය හරහා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව පවත්වාගෙන යෑමටත්, මූල්‍ය ආයතන ප්‍රතිසංවිධානය හෝ නිරාකරණය කිරීමටත්, යන අරමුණු වෙනුවෙන් භාවිත කිරීමේ අයිතිය ඇත.

මෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ මූල්‍ය ආයතන සඳහා බලපත්‍ර නිකුත් කරයි. එනම් බැංකු සහ තෝරා ගත් බැංකු නොවන මූල්‍ය ආයතන වේ. බැංකු යටතේ කාණ්ඩ දෙකක් යටතේ බලපත්‍ර නිකුත් කරයි. එනම් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (විශේෂිත අරමුණු වෙනුවෙන්; ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකු) වශයෙනි. පොදුවේ බැංකු ආයතන වෙනුවෙන් 1988 අංක 30 දරන බැංකු පනත බල පැවැත්වේ. බැංකු නොවන මූල්‍ය ආයතන යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කරයි. මෙකී ආයතනවල නෛතික රාමුව පිළිවෙලින්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත, හා 2016 අංක 06 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත ඔස්සේ ආවරණය වේ.

### 6.7. මහ බැංකුව විසින් නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන නිරාකරණය කිරීම.

ශ්‍රී ලංකා මහා බැංකු පනතෙහි 62 වන වගන්තිය ප්‍රකාර ව මූල්‍ය ආයතන නිරාකරණය සඳහා වගකිව යුතු අධිකාරිය වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව යි. මෙම වගකීම සීමා වන්නේ මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන සම්බන්ධයෙනි. මූල්‍ය ආයතන නිරාකරණය කිරීමට මහජන අරමුදල් සම්බන්ධවන අවස්ථාවන්හි දී ඒ නිරාකරණ තීරණ අදාළ නීතිවලට යටත් ව මුදල් අමාත්‍යවරයා විමසීමෙන් ගනු ලැබිය යුතුවේ.

මේ අනුව මහ බැංකුව විසින් නිරාකරණ සැලසුම් කිරීමේ දී සහ නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී තොරතුරු සහ සහයෝගීතාව හුවමාරු කර ගැනීම සඳහා අවශ්‍ය පරිදි විදේශීය අධීක්ෂකවරුන් සහ නිරාකරණ අධිකාරීන් සමගින් ගිවිසුම්වලට එළඹෙයි.

### 6.8. සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

මහ බැංකුව ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණශීලී අධිකාරිය වශයෙන් කටයුතු කිරීමේ බලය නව මහ බැංකු පනතේ 63 වගන්තිය තුළින් විශේෂයෙන් දක්වා තිබේ. මූල්‍ය ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීමේ අරමුණ වෙනුවෙන්, සාර්ව විචක්ෂණශීලී මෙවලම් භාවිතය සඳහා වන සමස්ත ප්‍රවේශයක් ස්ථාපිත කර, කලින් කල යාවත්කාලීන කරමින්, මෙම සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්තිය තුළ මහ බැංකුවේ කාර්යභාරය පිළිබඳව මහජනතාවට දැනුම් දීම මහ බැංකුවේ වගකීමයි.

මූල්‍ය පද්ධතියේ අවදානම් සහ අන්තරායකර තත්ත්වයන්වල සැකැස්ම අධීක්ෂණය කිරීම, හඳුනා ගැනීම හෝ තක්සේරු කිරීම, සාර්ව විචක්ෂණශීලී අරමුණු ළඟා කර ගැනීම සඳහා දත්ත, තොරතුරු සහ සංඛ්‍යාන දත්ත ඉල්ලා සිටීම, රැස් කිරීම, ගොනු කිරීම විශ්ලේෂණය හා ප්‍රසිද්ධ කිරීම, ආතති පරීක්ෂණය සහ සමාකරණ අභ්‍යාස පැවැත්වීම, අදාළ මූල්‍ය ක්ෂේත්‍ර අධිකාරීන් අතර තොරතුරු හුවමාරු කිරීම හා සහයෝගිතාව සඳහා පහසුකම් සැලැස්වීම යනාදී වශයෙන් මෙහි දී පනතෙහි 64වන වගන්තිය තුළ මහ බැංකුවේ බලතල 12ක් ඉතා පැහැදිලි ව පෙළගස්වා තිබේ. හඳුනාගත් පද්ධතිමය අවදානම් අවම කිරීම හෝ තුරන් කිරීම සඳහා මහ බැංකුව විවිධ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සාර්ව විචක්ෂණශීලී උපකරණ නිකුත් කරනුයි.

මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව පිළිබඳ මහ බැංකුවේ තක්සේරුවත්, මූල්‍ය පද්ධතියේ අවදානම් සහ අන්තරායන් පිළිබඳ තක්සේරුවත්, ඒ වෙනුවෙන් මහ බැංකුවේ විවරණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ගත් ඇතුළත් කරමින් සෑම වසරක ම ඔක්තෝබර් මස 31 වන දින හෝ එදිනට පෙර මූල්‍ය ස්ථායිතා සමාලෝචනයක් ප්‍රසිද්ධ කරනු ලැබේ.

සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්තියට සමගාමී ව, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීමේ අරමුණින්, මේ සම්බන්ධ තීරණ ගැනීම සඳහා, "මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවක්" පිහිටුවීමට නව මහ බැංකු පනතේ 71වන වගන්තියට අනුව නියම කර තිබේ. මෙම කමිටුවේ සංයුතිය සාමාජිකයන් 07දෙනෙකුගෙන් සමන්විත වන අතර එය පහත පරිදි වේ. මහ බැංකු අධිපතිවරයා සභාපති වන අතර, සෙසු සාමාජිකයන් 06දෙනා වන්නේ, සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්තිය භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති, නියාමනය හා අධීක්ෂණය භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරී සහ මහ බැංකු පාලක මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි තැනැත්තෙකි. මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව මගින්, මූල්‍ය පද්ධතියට බලපාන හඳුනාගත් පද්ධතිමය අවදානම් වර්ධනය වීම් අවම කිරීම සඳහා සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්තිය පරීක්ෂා කිරීමටත්, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීමටත්, හඳුනාගන්නා අවදානම්වලට ප්‍රතිචාර ලෙස ගතයුතු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ අදාළ පොදු හා මූල්‍ය ක්ෂේත්‍ර අධිකාරීන් වෙත නිර්දේශ නිකුත් කිරීමටත්, එකී නිර්දේශයන් සමග වන අනුකූලතාව ය අධීක්ෂණය කිරීමටත් බැඳී සිටී.

### 6.9. සංඛ්‍යා ලේඛන රැස් කිරීම සහ ඉදිරිපත් කිරීම.

මහ බැංකු පනතේ 78 වන වගන්තියට අනුකූල ව ආර්ථික තීරණ ගැනීම සඳහා අවශ්‍ය තෝරාගත් සුවිශේෂී සංඛ්‍යා ලේඛන සහ තොරතුරු රැස් කිරීම, ගොනු කිරීම, විශ්ලේෂණය කිරීම, සාරාංශ කිරීම සහ ඉදිරිපත් කිරීමට මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. විශේෂයෙන් ම මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට උපකාරී වන කෙටිකාලීන උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීමත්, රැස් කිරීම සඳහා නිෂ්පාදන, ඉදිකිරීම් සහ සේවා සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය, උද්ධමන අපේක්ෂාවන් පිළිබඳ සමීක්ෂණය, ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, ණය සැපයුම, ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණ, සහාධිපත්‍ය වෙළෙඳපොළ පිළිබඳ සමීක්ෂණය, රාජ්‍ය අංශයේ රැකියා පිළිබඳ සමීක්ෂණය යනාදී විවිධ සමීක්ෂණ සිදු කරනු ලබයි. මීට අමතර ව පළාත් පාරිභෝගික මිල දර්ශකය, තොග මිල දර්ශකය, වැටුප් අනුපාත දර්ශකය, සිල්ලර වෙළෙඳාම් පරිමා දර්ශක, සමස්ත සාධක ඵලදායිතාව වැනි විවිධ දර්ශක

සම්පාදනය කිරීම ද සිදු කෙරේ. තව ද නාමික පළාත් දළ දේශීය නිෂ්පාදිතය, සමස්ත ශ්‍රී ලංකාවේ සහ එක් එක් පළාත්වල සෞභාග්‍ය තත්ත්වය මැන බැලීම සඳහා වන ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය ද සම්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි.

### 6.10. ආණ්ඩුවේ මූල්‍ය උපදේශක සහ ආණ්ඩුවේ බැංකුකරු ලෙස කටයුතු කිරීම.

පනතෙහි 81 වන වගන්තියට අනුව මහ බැංකුව ආණ්ඩුවේ මූල්‍ය උපදේශකවරයා ලෙස කටයුතු කරයි. මහ බැංකුව ආණ්ඩුව සමඟ එකඟ විය යුතු යම් නියම සහ කොන්දේසි මත යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට ආණ්ඩුවේ බැංකුකරු ලෙස කටයුතු කරයි.

### 6.11. ආණ්ඩුවේ රාජ්‍ය මූල්‍ය නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

ආණ්ඩුවේ රාජ්‍ය මූල්‍ය නියෝජිතයා ලෙස මහ බැංකුවේ කාර්යභාරය ද පනතේ 81 වන වගන්තියෙන් විස්තර කර තිබේ. මෙහි දී මහ බැංකුවට ලැබුණු අරමුදල් සම්බන්ධයෙන් වන දත්ත ආණ්ඩුවේ ඉල්ලීම මත ලබා දීමට මහ බැංකුව බැඳී සිටී.

රාජ්‍ය මූල්‍ය නියෝජිත ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව හෝ ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරන වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් සමග සිදු කරනු ලබන කටයුතුවල දී මහ බැංකුව ශ්‍රී ලංකා ආණ්ඩුව නියෝජනය කරයි. එසේ ම එහි දී අවශ්‍ය විටෙක ගිණුම් පවත්වා ගැනීමේ දී ආණ්ඩුව වෙනුවෙන් ඒ කටයුතු සිදු කළ යුතු වේ. මීට අමතර ව ඉදිරියේ දී වෙනත් රාජ්‍යයන් සමග හෝ වෙනත් නියෝජ්‍ය ආයතන සමග යම් ගිවිස ගැනීම් සිදු කරන අවස්ථාවන්හි දී ආණ්ඩුවේ නියෝජිත ලෙස කටයුතු කිරීමේ බලය මහ බැංකුවට ලබාදී ඇත.

ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සඳහා මහ බැංකුව විසින් රෙජිස්ට්‍රාර් කාර්යාලයක් පවත්වාගෙන යනු ලැබිය හැකියි. මහ බැංකු පනතේ 82වන වගන්තියට අනුව මහ බැංකුව ආණ්ඩුවේ නිල තැන්පතුධාරියා විය යුතු අතර, ආණ්ඩුවෙන් හෝ ආණ්ඩුව වෙනුවෙන් ඕනම ව්‍යවහාර මුදලකින් තැන්පතු භාර ගනු ලැබිය හැකියි.

මහ බැංකුවේ මුදල් සහ මූල්‍ය ස්ථායිතා ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සඳහා "සම්බන්ධීකරණ සභාවක්" පිහිටුවීමට පනතෙහි 83 වගන්තියෙන් නියම කර තිබේ. එහි සභාපතිවරයා මහ බැංකු අධිපතිවරයා වන අතර භාණ්ඩාගාරයේ ලේකම්වරයා හා ආර්ථික ප්‍රතිපත්ති විෂයය පවරන ලද අමාත්‍යාංශයේ ලේකම්වරයා (මුදල් අමාත්‍යාංශය හැර වෙනත් අමාත්‍යාංශයක් නම්) සෙසු සාමාජිකයන් වේ. මෑත කාලීන සාර්ව ආර්ථික වර්ධනයන්, ඒවායේ ස්වභාවය මෙන්ම අවදානම් පිළිබඳ තොරතුරු සහ අදහස් හුවමාරු කර ගැනීම පිණිස මෙම සම්බන්ධීකරණ සභාව කාර්තුවකට වරක් රැස්වන අතර මෙම සභාවට ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ කිසිදු අධිකාරි බලයක් නැත.

මුදල් ප්‍රතිපත්ති රාමුව වන නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය වන සාධකයකි, මහ බැංකුව මගින් රාජ්‍ය මූල්‍ය හිඟය මූල්‍යනය කිරීම සීමා කිරීම සහ රජය වෙත තාවකාලික අත්තිකාරම් සැපයීම සීමා කිරීම. කෙසේ වෙතත් ආණ්ඩුව වෙනුවෙන් මුදල් සම්පාදනය සම්බන්ධයෙන් වන තහනමක් මහ බැංකු පනතෙහි 86 වන වගන්තියේ දක්වා තිබේ. ඒ අනුව මහ බැංකුව විසින් සෘජු ව හෝ වක්‍රාකාර ව ආණ්ඩුව වෙත හෝ ආණ්ඩුවට අයත් යම් පොදු අධිකාරියක් වෙත හෝ වෙනත් යම් රාජ්‍ය ආයතනයක් වෙත ණය ප්‍රදානය නොකළ යුතුවේ. 27 වන වගන්තියෙන් දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුව මහ බැංකුව විසින් මුදල් වර්ෂයේ පළමු මාසය ඇතුළත ඒකාබද්ධ අරමුදලෙන් දරනු ලැබීමට බලයලත් වියදම් මූල්‍යනය කිරීම සඳහා අලුත් සෘජු තාවකාලික අත්තිකාරම් ආණ්ඩුව වෙත ලබාදිය හැකියි. රජය වෙත ලබාදුන් එවැනි තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය පසුගිය මුදල් වර්ෂයේ මුල් මාස හතරෙහි ආදායමෙන් 10%කට නොවැඩි විය යුතු අතර ඒ සඳහා වෙළෙඳපොළෙහි පවතින පොලී අනුපාතික යටතේ පොලිය අය කරනු ලැබේ.

තවද රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් මෙතෙක් මහ බැංකුව සතුව තිබූ වගකීම නව පනත යටතේ නිදහස් කර තිබේ. කෙසේ වෙතත් රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ ආයතනයකට අදාල නීතිය ක්‍රියාත්මක කරන තෙක් රජයේ නියෝජිතයකු වශයෙන් අඛණ්ඩ ව කටයුතු කරනු ඇත.

### 6.12. ස්වකීය ප්‍රතිපත්ති සහ මෙහෙයුම් පිළිබඳ ව පාර්ලිමේන්තුව, ආණ්ඩුව සහ මහජනතාව වෙත දැනුම් දීම.

පනතෙහි 80වන වගන්තියට අනුව මහ බැංකුව සෑම මාස 6කට වරක් සහ ඊට අමතර ව අවශ්‍ය අමතර කාලවල දී සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ සිය අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කළ යුතු වේ.

මහ බැංකුව විසින් එක් එක් මුදල් වර්ෂයේ අවසාන වීමෙන් මාස හතරක කාල සීමාවක් ඇතුළත තම ප්‍රතිපත්තිමය අරමුණු සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය අවධාරණය කරමින් ඒ මුදල් වර්ෂය තුළ ආර්ථිකයේ තත්ත්වය පිළිබඳ ව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්තාවක් ප්‍රසිද්ධ කළ යුතු අතර එය අධිපතිවරයා විසින් මුදල් අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වේ. මීට සමගාමීව මහ බැංකුව විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් සහ තක්සේරුවක් ද එම වාර්තාවට ඇතුළත් විය යුතු බවට 80 (3) වගන්තියෙහි සඳහන් කර ඇත.

84වන වගන්තියෙහි තවදුරටත් සඳහන් වන්නේ, ආණ්ඩුව සමග සහයෝගයෙන් කටයුතු කළ යුතු බවයි. මුදල්, විදේශ විනිමය මෙහෙයුම්, මූල්‍ය පද්ධති ස්ථායිතාවය, අර්බුද වැළැක්වීම හා අර්බුද කළමනාකරණය සහ රාජ්‍ය මූල්‍යයට අදාළ වන කරුණු සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති පිළිබඳ ව ආණ්ඩුව හා වෙනත් පොදු අධිකාරීන් සමග මහ බැංකුව අවශ්‍ය විටෙක අදහස් හුවමාරු කිරීම සිදු කළ යුතු වේ.

### 6.13. පොදු ජාත්‍යන්තර මූල්‍ය ආයතන ඇතුළු ව ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම, ඒ ජාත්‍යන්තර සංවිධානවලට සහභාගි වීම, සහ ස්වකීය අරමුණුවලට අදාළ කරුණු සම්බන්ධයෙන්, දේශීය/විදේශීය පොදු ආයතන සමග සහයෝග යෙන් කටයුතු කිරීම.

ආසියානු සංවර්ධන බැංකුව, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යන ආයතන නව පනතට අනුව පොදු ජාත්‍යන්තර මූල්‍ය ආයතන යටතේ හඳුනාගෙන තිබේ. මේ යටතේ පනතට අනුව සිය බලතල, කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී දේශීය හෝ විදේශීය නියාමන, අධීක්ෂණ හෝ මුදල් අධිකාරීන් සමග හෝ පොදු ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග කටයුතු කරනු ලබයි.

### 6.14. ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගත භාවය ප්‍රවර්ධනය කිරීම.

රටේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ "මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය" සැකසීමේ වැඩපිළිවෙලෙහි කටයුතු අධීක්ෂණය, වෙනත් පාර්ශ්වකරුවන් සමග සම්බන්ධීකරණය සහ එහි ප්‍රගතිය ඇගයීම ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එහි ප්‍රාදේශීය කාර්යාල සමගින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි අරමුණුවලට අනුකූල ව, ප්‍රධාන වශයෙන් රටේ අඩු පහසුකම් සහිත කොටස් ඉලක්ක කර ගනිමින් පොදු මහජනතාවගේ සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය සාක්ෂරතාව, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ව්‍යාපෘති කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා දැනුම්වත් කිරීමේ සහ ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම මේ සම්බන්ධයෙන් සිදු කෙරේ.

### 6.15. මූල්‍ය පද්ධති ස්ථායිතාවය සුරක්ෂිත කිරීමේ උපක්‍රමයක් ලෙස තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රම ඇති කිරීම.

2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කිරීමත් සමග ශ්‍රී ලංකාවේ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය නෛතිකව පිහිටුවූ අතර, එය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ලෙස නම් කෙරිණි. ශ්‍රී ලංකා මහ බැංකුව එහි පරිපාලනය සහ කළමනාකරණය සඳහා වගකියනු ලබයි. මේ යටතේ, සාමාජික මූල්‍ය ආයතනයක් බිඳ වැටෙන අවස්ථාවක දී රක්ෂිත තැන්පත්කරුවන් හට නිශ්චිත ව දක්වා ඇති උපරිම මුදලක් දක්වා වන්දි මුදල් පිරිනැමෙයි. මෙය 'ආවරණය' ලෙස හැඳින්වෙන අතර, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ වත්මන් ආවරණය ආයතන පදනම මත එක් තැන්පත්කරුවෙකුට රු. 1,100,000 කි.

## 7. සමාප්තිය

2023 වසරේ සැප්තැම්බර් මස බලාත්මක කරනලද 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත ඔස්සේ වැදගත් ප්‍රතිපාදන රැසක් පණවා ඇති අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ස්වකීය කාර්යභාරය ඉටු කිරීම සඳහා වඩාත් යහපත් වටපිටාවක් ගොඩනගා තිබේ. මුදල් නීති පනත යටතේ නීතිය ඉදිරියේ නඩු පැවරිය හැකි සහ නඩු පවරනු ලැබිය හැකි ආයතනය වූයේ මුදල් මණ්ඩලය වුවද නව ශ්‍රී ලංකා මහ බැංකු පනතෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට නීතිමය පුද්ගලභාවයක් ලබා දී තිබේ. මහ බැංකුවේ කාර්යභාරය ඉටුකිරීමේ දී තීරණ ගැනීමේ මණ්ඩල දෙකක් ස්ථාපනය කිරීමෙන් එහි පාලන ව්‍යුහය වඩාත් උසස් මට්ටමකට පත්කර තිබේ. මෙහි දී, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය, මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ සියලු තීරණ ගැනීමේ වගකීම සහිතව පිහිටුවා ඇති අතර සෙසු සියලු ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ වගකීම පාලක මණ්ඩලය සතු වේ.

දේශීය මිල ස්ථායිතාවය අත්කර ගැනීම සහ පවත්වාගෙන යාම මහ බැංකුවේ මූලික අරමුණ ලෙස හඳුනාගෙන තිබේ. එමෙන්ම මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම අනෙක් අරමුණ ලෙසින් පනතෙහි දක්වා තිබේ. සිය ප්‍රමුඛ අරමුණ ඉටුකරග ැනීමේ දී සහ මූලික කර්තව්‍යයක් වන රටේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය (Flexible Inflation Targeting) නමින් හඳුන්වනු ලබන නව මුදල් ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපිත කිරීමට මෙම පනත මගින් මහ බැංකුවට බලය ලබා දී ඇත. එසේම මහ බැංකුව ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණතා අධිකාරිය ලෙසත් සිය විෂය පථය යටතේ පවතින මූල්‍ය ආයතන සඳහා වන නිරාකරණ අධිකාරිය ලෙසත් මෙම පනත යටතේ නම් කර තිබේ.

පාලන ව්‍යුහයට සිදුකරන ලද වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් මුදල් අමාත්‍යංශ ලේකම් තවදුරටත් මහ බැංකුවේ තීරණවලට සම්බන්ධ නොවේ. මෙය නව මහ බැංකු පනත මගින් ඉහළ මට්ටමක වගවීමේ සහ විනිවිදභාවයේ අවශ්‍යතා බලාත්මක කරන අතරතුර, මහ බැංකුවේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය සාක්ෂාත් කිරීම සඳහා නිශ්චිත විධිවිධාන හඳුන්වා දී ඇති බවට සැලකිය යුතු මට්ටමේ උදාහරණයක් වේ. එමෙන්ම නව පනත මගින් යහපාලන නිර්ණායක සහ මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය වැඩිදියුණු කර තිබේ. රජයේ අයවැය හිඟය සඳහා මහ බැංකුව විසින් මූල්‍යයනය කිරීම තහනම් කරමින් ද ප්‍රතිපාදන පනවා තිබේ. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ රටේ මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය ස්ථායිතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම සඳහා සම්බන්ධීකරණ සභාවක් පිහිටුවා තිබේ. තවද මහ බැංකු පනත යටතේ රටේ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාවස්ථාපිත වගකීමක් ද ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇත.

සමස්තයක් ලෙස ගත්කල, නව ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් දේශීය මිල ස්ථායිතාව අත්කර ගැනීම සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව සුරක්ෂිත කිරීම සඳහා ස්වාධීන ප්‍රතිපත්ති සැකසීම මෙන්ම ක්‍රියාත්මක කිරීම තුළින්, වඩාත් විනිවිදභාවයකින් සහ වගවීමකින් යුතුව දිගුකාලීන ආර්ථික වර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය පහසුකම් සලසා තිබේ.

මූලාශ්‍ර:

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත

මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම්, ශ්‍රී ලංකා මහ බැංකුව, 2023

විශේෂ සටහන 3; ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2022

https://worldpopulationreview.com/country-rankings/countries-without-central-banks




# දැන්වීමයි

## මුදල් නෝට්ටු විකෘති කිරීම හෝ වෙනස් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සියලු ම මුදල් නෝට්ටු සහ කාසි ශ්‍රී ලංකාව තුළ ඕනෑ ම අගයක ගෙවීමක් සිදු කිරීම සඳහා වලංගු මුදල් වේ.

කෙසේ වෙතත්, විසිතුරු භාණ්ඩ සහ තෑගි අයිතම සකස් කිරීම සඳහා වලංගු මුදල් නෝට්ටු යොදා ගැනීම සහ එවැනි ක්‍රියාකාරකම් සමාජ මාධ්‍යය ඔස්සේ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රවණතාවක් කෙරෙහි ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය යොමු වී තිබේ.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 55 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ අවසරයකින් තොරව, පහත දක්වා ඇති කටයුතු සිදු කරගෙන යෑමෙහි නියැලී සිටින ඕනෑ ම පුද්ගලයෙකු වරදක් සිදු කරයි.

(අ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් කපා දැමීම, සිදුරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් විකෘති කරනු ලැබීම.

(ආ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් මත යමක් මුද්‍රණය කිරීම, මුද්‍රාවක් තැබීම හෝ යමක් ඇඳීම හෝ යම් මුදල් නෝට්ටුවක් මත හෝ යම් මුදල් නෝට්ටුවකට යම් මුද්‍රාවක් හෝ ලකුණක් අලවනු ලැබීම.

(ඇ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවකට හෝ ඒ මත වෙළෙඳ දැන්වීමක ස්වභාවයෙන් හෝ ආකෘතියෙන් යුත් යම් දෙයක් ඇමිණීම හෝ අලවනු ලැබීම.

(ඈ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් කවර හෝ ආකාරයකින් ප්‍රතිනිර්මාණය කරන හෝ යම් මුදල් නෝට්ටුවක අනුරුවක් සෑදීම; හෝ

(ඉ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් වලංගු මුදලක් වශයෙන් නොවන අන්‍යාකාරයකින් භාවිත කිරීම.

ඉහත දැක්වූ ආකාරයේ වරදකට හසුවන යම් පුද්ගලයෙකු මෙම පනතේ 111 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරිපිට සමාලෝචන නඩුවකින් අනතුරු ව වරදකරු වීම මත, රුපියල් මිලියන විසි පහකට නොවැඩි දඩ මුදලක් හෝ තෙවසරකට නොඅඩු කාලයක් සඳහා සිරදඬුවකමකට හෝ එවැනි දඩයකට සහ සිර දඬුවමකට යන දෙකට ම යටත් විය යුතු ය.

ඉහත සඳහන් ආකාරයේ නීති විරෝධී කටයුතුවල නියැලීමෙන් වැළකී සිටින ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව වෙත දැඩි ව අවධාරණය කර සිටියි.

**ව්‍යවහාර මුදල් අධිකාරී - ශ්‍රී ලංකා මහ බැංකුව**